# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.05.19

වර්ෂ 2021 ක් වූ මැයි මස 19 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මැයි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
14. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
15. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
16. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
17. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
18. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
02. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියළුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**01) 2021-04-09 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021-04-09 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2021-04-09 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සහ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** 2021-04-09 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 14 වන පිටුව, JCB එක ගැන කතා කරනකොට මෙහෙම එකක් තියෙනවා.

"මේ JCB එක හෙට දුන්නත් කාටහරි, ඒක හොඳට වැඩ කරනවා." ඒක

"මේ JCB එක පෞද්ගලික අංශයට විකිණුවොත්, ඒක මීට වඩා හොඳට වැඩ කරනවා." ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

සංශෝධන නැති බවයි පෙනෙන්නේ.

2021-04-09 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද මේ මහා සභා රැස්වීම තියන්නේ ඇත්තටම තියන්න පුළුවන්කමකට නෙමෙයි. ඔබතුමන්ලා දන්නවා රටේම තියෙන තත්ත්වය ගැන. කොරෝනා තත්ත්වය එන්න එන්නම වර්ධනය වෙන අවස්ථාවක් මේක. සෞඛ්‍ය නීතිරීති වලට අනුව අපි අද රැස්වීම පවත්වන්න ඕන. මාසික මහා සභා රැස්වීම අපි නැවත කල් දැම්මොත් මීට වැඩිය අර්බුද තත්ත්වයක් ආවොත් කියන කාරණය උඩ තමයි අද මහා සභා රැස්වීම පවත්වන්නට අපි තීරණය කළේ. ඒ වගේම ඔබතුමන්ලා දන්නවා අද වෙන කොට අපේ ප්‍රාදේශීය සභාවේ තුන් දෙනෙකුට පී.සී.ආර්. පරීක්ෂණ කරලා තියෙනවා. එක්කෙනෙක්ගේ නම් ප්‍රතිඵල ඇවිල්ලා තියෙනවා නෙගටිව් කියලා. ඒ සංජීව මයාගේ එක. ඊට පස්සේ කල්ප මයා, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි යන දෙදෙනාටත් පී.සී.ආර්. පරීක්ෂණ කරලා තියෙනවා. ඒ තත්ත්වයන් තුළ තමයි අද මහා සභා රැස්වීම පවත්වන්නට අපි තීරණය කළේ. ඉතිං ඔබතුමන්ලා සියළුදෙනාගේම පැමිණීම ඉතාමත් ගෞරවයෙන් යුතුව මේ අවස්ථාවේදී පිළිගන්වනවා.

අපි පුළුවන් තරම් ඉක්මනට අවශ්‍ය කාරණා මතුකර ගෙන මහා සභා රැස්වීම අවසන් කරන්න බලමු. ඒ වගේම අපේ චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමත් නිරෝධායනයට ලක් කරලා තියෙනවා. ඒ පිළිබඳවත් මම සිහිපත් කරනවා. වර්තමානයේ පවතින කොවිඩ් 19 උවදුර පිළිබඳව ඔබතුමන්ලා සියළු දෙනාටම අමුතුවෙන් සඳහන් කරන්න අවශ්‍ය කාරණාවක් නෙමෙයි. අපේ බලප්‍රදේශය තුළත් මේ වන විට පවුල් විශාල සංඛ්‍යාවක් නිරෝධායනයට ලක් කරලා තියෙනවා. අපිටත් මහජන නියෝජිතයෝ විදයට මේකට වගකීමක් තියෙනවා අපේ බලප්‍රදේශයේ ඒ පිළිබඳව සොයා බලන්න. ඒ වගේම සභාව තුළින් කරන්න පුළුවන් කාරණා මොකක්ද කියන එකත් අපිට වැදගත් වෙනවා. මොකද මිනිස්සු අමාරුවේ වැටුණු අවස්ථාවකදී අපි උදවු කිරීම තමයි වැදගත් වෙන්නේ. ඉතිං ඒ පිළිබඳවත් සිහිපත් කරන්න ඕන.

ඒ වගේම බැකෝ යන්ත්‍රය සහ සභාවේ කැබ් රථයේ එන්ජින් දෙක අපි කොළඹ එදිරිසිංහ මෝටර්ස් ආයතනය වෙත යැව්වා. මොකද එන්ජින් දෙකක් අළුත්වැඩියා කරන්න තිබුණ නිසා එකපාරටම, එක ට්‍රාන්ස්පෝට් එකෙන් ඒක යවන්න වුණා. ජේ.සී.බී. යන්ත්‍රයේ එන්ජිමට ඇස්තමේන්තුව එවලා තියෙනවා රුපියල් තුන් ලක්ෂ අනූනමදාහක්. ඒ වගේ ගාණක් තියෙන්නේ. අපිට ඉදිරිපත් කරපු මිල ගණනට වඩා බොහොම අඩු මිල ගණනක් තියෙන්නේ. නැත්නම් ජේ.සී.බී. එකට රුපියල් අට ලක්ෂ ගාණක ඇස්තමේන්තුවක් තිබුණා. කැබ් රථයට රුපියල් පන්ලක්ෂ ගාණක ඇස්තමේන්තුවක් තිබුණා. දැන් ඊට පස්සේ ඒක ගෙනාවම අපිට යන්නේ ගලවලා හයිකරන්න යන වියදම විතරයි. ඉතිං ඒකත් සිහිපත් කරන්න ඕන.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රෝහල් කමිටුව විසින් ඉල්ලීමක් කරලා තියෙනවා. ඒක අද උදේ තමයි ඇත්තටම ලැබුණේ. හදිසි කාරණාවක් නිසා මම මේක ඉදිරිපත් කරන්නම්.

**01.** කොවිඩ් 19 උවදුර මර්ධනයේ යෙදෙන අයට සහාය ලබා ගැනීම. (ගරු සභාපති, රෝහල් කමිටුව, ශික්ෂණ රෝහල, කරාපිටිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, අපි දැක්කා පහුගිය දවස්වල දැන් මේ අපේ බලප්‍රදේශය තුළ තියෙන ස්වේච්ඡා ආයතන වලින්, නරාවල ස.ණ.ස., පෝද්දල ස.ණ.ස. වගේ ආයතන වලිනුත් කරාපිටිය රෝහලට පරිත්‍යාගයන් කරලා තිබුණා. ඒ වගේම මහජනතාවට සේවය සපයන ප්‍රධාන ආයතනයක් විදියට මේ අය අපෙනුත් ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ වගේම ගාල්ල මහා නගර සභාවෙනුත් ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ නිසා අපි මේ සඳහා අපිට කළ හැකි උපරිම උපකාරය කරමු කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සියළු දෙනාගෙන්ම අවසරයි. ඇත්තටම ගරු සභාපතිතුමනි, මේ වෙන කොට බෝපෙ පෝද්දල බල ප්‍රදේශය කොවිඩ් 19 උවදුර නිසා ලොකු තර්ජනයකට ලක් වෙලා තියෙන අවස්ථාවක්. ලියනගේ මන්ත්‍රීතුමා කිව්වා වගේම ග්‍රාම සේවා වසම් හැටියට කල්පනා කරහම පළිවතුගොඩ ග්‍රාමසේවා වසම තමයි මේ වෙන කොට වැඩියෙන්ම කොවිඩ් ආසාදිතයන් ඉන්නේ සහ පී.සී.ආර්. පරීක්ෂණ වලට යොමු වුණ අය ඉන්නේ. ඊයේ මම තොරතුරු විමසුවම ආසාදිතයන් තිස් හතර දෙනෙක්ද කොහෙද ඒ ග්‍රාම සේවා වසම තුළ ඉන්නවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ දේට මැදිහත් වෙනවා වගේම අපේ සභාවේ සේවක මහත්වරුන්ට, විශේෂයෙන්ම කසළ ට්‍රැක්ටර්වල සේවය කරන සේවක මහත්වරුන්ට පහසුකම් සලසන්න ඕන. කොවිඩ් ආසාදිතයන් ඉන්න ගෙවල්වල සහ පී.සී.ආර්. පරීක්ෂණ කරපු අය ඉන්න ගෙවල්වල පවා ඒ කසළ බැහැර කිරීමේ කටයුතුවල ඒ අය නිරත වෙනවා. ඒ නිසා ලොකු තර්ජනයක් ඒ ජීවිතවලට තියෙනවා. ඒ නිසා මේ කරන කැපවීමේදී පිට ආයතනවලට ඒ සහයෝගය දෙනවා වගේම අපේ සේවක මණ්ඩලයේ ආරක්ෂාව අපි තහවුරු කරන්න ඕන. ඒක උප සභාපතිවරයා විදියට මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා සේවකයන් සුරක්ෂිත කිරීම මූලික කටයුත්තක් සේ සලකන්න කියලා. ඒ වගේම බෝපෙ පෝද්දල අපිට බදු ගෙවන ජනතාව වෙනුවෙනුත් මේ සියළු සංවර්ධන ක්‍රියාවන් තාවකාලිකව නවත්වලා ඒ දෙන්න පුළුවන් සහයෝගය, ප්‍රතිකාර, එන්නත් සෞඛ්‍ය අංශ වල මැදිහත් වීම තුළ අපේ දේශපාලන නායක රමේෂ් පතිරණ මැතිතුමන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන්න කියන ගෞරවණීය ඉල්ලීම ගරු සභාපතිතුමාටත්, ගරු සභාවටත් ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඔබතුමන්ලා ඉතාමත් කාලෝචිත යෝජනා කිහිපයක් ගෙනාවා. ඒකට පක්ෂ භේදයකින් තොරව සියළුදෙනාගේම එකඟතාවයත් තියෙනවා. ඒ වගේම මම හිතන්නේ ඒ මුල් කොටස ගැන කතා කරන්න ඕන නැහැ. පොදුවේ අපි කළ යුතු දේ ගැන කතා කරන්න ඕන නැහැ. නමුත් අපේ සුමිත් උප සභාපතිතුමා කතා කරපු අවසාන කොටස බැලුවම අපිට වරිපනම් බදු ගෙවන මේ ප්‍රදේශයේ කොරෝනා වසංගතයට ගොදුරු වෙච්ච ඒ පවුල් වලට දේශපාලන භේදයකින් තොරව යම් කිසි සහනයක් දෙන්න ඕන. සංවර්ධන වැඩ කටයුතු තාවකාලිකව අත්හිටුවන්න, අවශ්‍යම දේවල් ඇරෙන්න. ඒවා තාවකාලිකව නවත්වලා මේවා කරන්න කියන ඒ අදහස ඇත්තටම අපි අනුමත කරනවා පක්ෂ භේදයකින් තොරව. මේ වෙලාවේදී රමේෂ් පතිරණ ඇමතිතුමා මේකෙ නායකත්වය ගන්නවා කියන එක අපිට කිසිම ප්‍රශ්නයක් ඇත්තේ නැහැ. දේශපාලන භේදයකින් තොරව මේ දේ සිද්ධ කරන්න කියන එකයි අපේ ඉල්ලීම තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේක කාලෝචිත යෝජනාවක්. ඒ යෝජනාවට මම තව එකක් ඉදිරිපත් කරනවා. අපේ සභාවේ ඉන්න සේවකයන්ටත්, මහජනතාවටත්, එන්නත් ලබා දෙන්න ඕන. ගාල්ල දිස්ත්‍රික්කයේ ඒක තවම නැහැ. ඒ නිසා රමේෂ් පතිරණ ඇමතිතුමාට යෝජනාවක් දාලා මේක කරන්න කියන්න. අපේ කොට්ඨාශයේ එක ගෙදර ආසාදිතයන් හය හත් දෙනා ඉන්න ගෙවල් වටේටම තියෙනවා. ඒ නිසා මේ එන්නත් කිරීමේ වැඩපිළිවෙල සභාවේ සේවකයන්ටත් කරන ගමන්ම මහජනතාවටත් කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, අපි අර මේවා එකට කීයක්ද දෙන්නේ කියලා යෝජනා කරලා තීරණය කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඔබතුමන්ලාම කතා කරන්න මොකක්ද කරන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දෙන්න පුළුවන් උපරිම ගාණ දෙමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** නැත්නම් අවශ්‍ය ප්‍රමාණයට රෙදි අරගෙන දෙමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** භාණ්ඩ අරන් දෙමු.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** භාණ්ඩ අරන් දෙමු. සල්ලි නෙමෙයිනේ ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මුදලක් වෙන් කරලා භාණ්ඩ ටික අරගෙන දෙමු.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක අපේ සභාවේ සේවකයන්ටත් දෙන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාවේ සේවකයන්ට සහ අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලයට ඒක දෙන්න. ඕන ආයතන වලින් ඒකට සම්බන්ධ වේවි. ප්‍රධාන වශයෙන්ම අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඉන්න ජනතාව වෙනුවෙන් මේ සාධාරණය විය යුතුයි. විශේෂයෙන්ම සේවක මණ්ඩලය සහ කසළ අංශයේ සේවකයන් ඉන්නවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ අයටත් නිල ඇඳුමක් දෙන්න ඕන.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** තාම මේ මිනිස්සු මේකෙ අවධානම දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ අයගේ ආරක්ෂාවට නිල ඇඳුමක් දෙන්න ඕන. කොරෝනා හැදුණ ගෙවල් වලිනුත් කුණු මළු අරන් එනවා.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් අපි මෙහෙම කරමු. මේකට කොහොමත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගන්න වෙනවා. අපි රුපියල් ලක්ෂයක මුදලක් ඒ සඳහා යෝජනා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ රෝහලටද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් රෝහලට.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එතකොට සේවකයන්ට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සේවකයන්ට අපි කොහොමත් ඒවා අරන් දෙනවා. ඒකට සභා තීන්දු අවශ්‍ය නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඊයේ පෙරේදා හොඳ සිදුවීමක් වුණා. ඒක මේ සභාවේදී කියන්න ඕන. තොටගොඩ ග්‍රාමසේවා වසමේ නිවසක අය කොරෝනා ආසාදිත බව තහවුරු වුණා. ඔබතුමන්ලත් මේක දැන ගත යුතු නිසා තමයි මම මේ කියන්නේ. ඒ ආසාදිත වෙච්ච කෙනා අරගෙන ගියා. ඊට පස්සේ දිනයකට හෝ දින දෙකකට පසු බිරිඳ ආසාදිත වෙලා අරගෙන ගියා. වයසක අම්මා විතරයි ගෙදර හිටියේ. ඒ සිදුවීමට මේ අම්මාගේ රුධිර පීඩනය වැඩි වෙලා සිහිවිකල් වෙලා හිටියා. කිසිම කෙනෙක් එතනට කිට්ටු වුණේ නැහැ. කිසි කෙනෙක් කිට්ටු වෙන්න බයයි. නමුත් ඇත්තටම මම අහම්බෙන් එතනින් යනකොට මගේ යාළුවෙක්ව දැක්කා. අනුර විජේසේකර ඒ යාළුවාගේ නම. සභාවේදී ඒ නම සඳහන් කළ යුතුයි. ඒ මහත්තයා මොකක්ද දන්නවාද කරේ. වාහනයේ තිබුණ වැහිකබාය ගත්තා. වෙන දෙයක් වෙන්න කියලා අර අම්මාව බේර ගන්න ඕන කියලා හිතලා ඒ ජැකට් එක දාගෙන සම්පූර්ණයෙන්ම මුණ වහගෙන ඒ අම්මාව අරන් ගියා. ඒ වෙන කොට ගිලන් රථයත් ඇවිල්ලා. රෝගියාව ඒ අයට භාර දෙනකම් ඒ අය රෝගියාව භාර ගන්නේ නැහැ. අන්තිමට වුණේ ඒ මහතා මේ අම්මව අරගෙන ඇවිල්ලා ඒ වාහනයෙන් තිබ්බා. ඒ අම්මාට කොරෝනා ආසාදනය වුණේ නැහැ. ඒ අම්මාට දැන් සුවයි. නමුත් එහෙම කැප කිරීම් කරන්නත් මිනිස්සු කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඔබතුමා බලගෙන හිටියද.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මට බර උස්සන්න බැහැනේ ඇත්ත කතාව. මට බර උස්සන්න පුළුවන් නම් මුලින්ම යන්නේ මම. නැත්නම් ඒකට බොරු කියන්න ඕන නැහැ. නමුත් අන්න ඒ වගේ කැපකිරීම් කරන අය ඉන්නවා. ඒ වගේ මිනිස්සුන්ට අපි ඇත්තටම ගරු කරන්න ඕන. ඒ වගේම මේ වගේ කට්ටියව ග්‍රාම සේවා වසම් මට්ටමින් හොයලා බලලා සහයෝගය දෙන්න ඕන. විශේෂයෙන්ම අපේ මන්ත්‍රීවරුත් ඒ කැපකිරීම කරන්න ඕන. මට වුණත් ඒක පුළුවන්. ඒ අයට ක්ෂණිකව ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය කබා කට්ටල කිහිපයක්, මාස්ක් කිහිපයක් වගේ ඒ අවශ්‍ය පහසුකම් ලබා දුන්නට ගැටළුවක් නැහැ මේ කාල සීමාව තුළදි. ඒක මම යෝජනාවක් හැටියට ගේනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම කරාට කමක් නැහැ නිරෝධායනය වෙන්න ලෑස්ති වෙලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මම හිතන්නේ කොවිඩ් ප්‍රශ්නය තුළ අපි අද වන විට මුළු ලංකාවමත්, මුළු ලෝකයමත් අසීරුතාවයට පත් වෙලා තියෙන අවස්ථාවක් මේක. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ගත්තම මේ ප්‍රදේශය දැන් කොවිඩ් අවධානම ඉතා වැඩි ප්‍රදේශයක් බවට පත්වෙලා තියෙනවා. දැන් උප සභාපතිතුමා කියපු පරිදි අපිට විෂබීජහරණ කටයුතු කිරීම සහ ඒ සෞඛ්‍ය ආරක්ෂිත වැඩ වලට තමයි යා යුත්තේ. හැබැයි පහුගිය දිනවල සිද්ධියක් වුණා. මම මේ දෝෂාරෝපණයක් කරනවා නෙමෙයි. අපි මේකට සංවිධානය වෙන්න ඕන. පහුගිය දිනවල අපේ ප්‍රදේශවල කොවිඩ් හැදුන ගෙවල් විෂබීජහරණය කරන්න අපි ඉල්ලීම් කරාට යම් යම් ප්‍රශ්න මැද ඒක කර ගන්න බැරි වුණා. නමුත් ඒවාට පහසුකම් තිබුණෙත් නැහැ. එහෙම වුණේ කොරෝනා අඩුවෙන් තිබුණ කාලයේදී. දැන් මේ වෙන කොට කොරෝනා වැඩියෙන්ම තියෙන අවස්ථාවක් මේක. මම හිතන්නේ අපිට ඒ නිවෙස් වලට යාමට බැරි තත්ත්වයක් අද වෙනකොට පත් වෙලා තියෙනවා. නමුත් යාමට බැරි තත්ත්වයක් තියෙන්නේ අපිත් මේකට බය නිසා. අපිට සභාව විදියට මිනිස්සු ඒ පහසුකම ඉල්ලුවම ඒක දෙන්න ඕන. උප සභාපතිතුමා කියපු විදියට ඒ මිනිස්සු අසරණ වෙලා ඉන්නවා ඇත්තේ බලන්න කෙනෙක් නැති හින්දා. තම තමන්ගේ බලප්‍රදේශ වලවත් අපිට යා හැකි ක්‍රමවේදයක් තියෙන්න ඕන. ඇත්ත වශයෙන්ම අපිට මෝටර් බයිසිකලයෙන් ගිහිල්ලා මේ වැඩේ කර ගන්න අමාරුයි. මොනවා හරි පහසුකම් අපිට මේකට සලසන්න. මේකට වාහනයක් දෙකක්වත් තියෙන්න ඕන. අඩු ගාණේ සංවිධානාත්මකව ගිහිල්ලා විෂබීජහරණය කරන්න පුළුවන් නම් අපි ඒක කරලා දෙන්න ඕන. මොකද, මේ වෙලාවේදී තමයි ඒ අය මේක බලාපොරොත්තු වෙන්නේ. මේක නොකෙරුණොම ඒ අයගේ, ඒ ජනතාවගේ අප්‍රසාදයට අපිව ලක් වෙනවා. අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විදියටත් ඒකෙදි අප්‍රසාදයට ලක් වෙනවා. අපි මේක සෞඛ්‍ය අංශයට භාර දීලා හිටියට සෞඛ්‍ය අංශ වලින් මේක කෙරෙන්නේ නැහැ. අද වෙන කොට අපේ ප්‍රදේශයේ ඉන්න නන්දිමාල් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට පවා කොරෝනා ආසාදනය වෙලා තියෙනවා. අද වෙන කොට මේක බලන්න කෙනෙක් නැහැ. නමුත් මේක මෙතන කතා කරාට ඒක බලන්න යන්න විදියක් නැහැ. අපිට පහසුකම් නැහැ. ඒ වගේම අපි සංවිධානාත්මක වෙලා නැහැ. මොකද එක හේතුවක් තමයි අපි කතා කරහම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කතා කරන්නේ නැහැ. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු කතා කරන්නෙත් නැහැ. සමහර වෙලාවට දුරකථන විසන්ධි කරලා. මොකක් හරි ප්‍රශ්නයක් ඇති ඉතිං. හැබැයි එහෙම වෙලා බැහැ. මොකද අපි මහජනතාවට කිට්ටු මහජන නියෝජිතයෝ විදියට අපිට පුළුවන්කම තියෙන්න ඕන මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න. ඒ මිනිස්සු එක්ක ගැටෙන්න පුළුවන් වෙන්න ඕන. ඔබතුමන්ලාට මොකද වෙලා තියෙන්නේ කියලවත් අහන්න ඕන. නමුත් අද වෙන කොට අපෙන් ඒක සිද්ධ වෙන්නේ නැහැ. මම හිතන්නේ ඒක අපේ ලොකු අඩුවක්. හැබැයි ඒ අඩුව පිරිමහගන්න අපි සංවිධානාත්මක වෙලා තීන්දුවක් ගන්න ඕන. අපි සභාපතිතුමාට කතා කරලා, ලේකම්තුමාට කතා කරලා, නිලධාරි මණ්ඩලයට කතා කරලා මේ වගේ ප්‍රශ්නයක් තියෙනවා මොකක්ද කරන්න පුළුවන් කියලා අහන්න ඕන. ඉතිං මෙතනදී අපි ග්‍රාම නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, උප සභාපතිතුමා සහ මන්ත්‍රීවරු සියළුදෙනාම මේකට සම්බන්ධ වෙන්න ඕන. ඒ වගේම තමයි අපි කිවුවම අපේ ජනතාවට තියෙන ප්‍රශ්න ගැන ඒවාට මොනවද මේ අයට කරලා දෙන්න පුළුවන් කියලා කියන්න ඕන. ඒකට අපි තීන්දුවක් ගන්න ඕන. අවශ්‍යම දේ දෙන්න ඕන ජනතාවට. කෑම බීම නෙමෙයි මම කියන්නේ. මේ අවස්ථාවේදී රෝගය මර්ධනය කරන්න පුළුවන් යම් කිසි දෙයක් තියෙනවා නම් ඒක තමයි අපි මේ අවස්ථාවේදී කරන්න ඕන. ඒකට වැඩපිළිවෙලක් හදමු. මට එකපාරට තීරණය කරන්න බැහැ ඒක මොකක්ද කියලා. අපි තීන්දුවක් ගමු ඒ අයට දෙන්න පුළුවන් මොනවද, උපරිම සේවය මොකක්ද කියලා. ඒක මොකක්ද කියලා අපි තීන්දුවක් ගමු කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි අර යෝජනාව සම්මත කරමු. ඒක මේකෙදි මතු කරලා තියෙනවා. ඒ වෙලාවේදී ඒක ගැන කතා කරමු. කොරෝනා සම්බන්ධව තව යෝජනා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාවට අදාළව කතා කරන්නේ. අපි නරාවල ස.ණ.ස. සමිතිය විදියට එකතු වෙලා කරාපිටියේ රෝහලට රුපියල් ලක්ෂයක රෙදි ලබා දුන්නා ඒ අවශ්‍ය ඇඳුම් මහ ගන්න කියලා. ඉතිං සභාවක් විදියට මම යෝජනා කරනවා අවම වශයෙන් රුපියල් ලක්ෂ දෙකක මුදලක්වත් මේ සඳහා ලබා දීමට කටයුතු කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා අපි හැමදේම කරගෙන යන්න ඕන. අපි මුළු බෝපෙ පෝද්දල බල ප්‍රදේශයම විෂබීජහරණය කරනවා. එක රුපියලක දෙයක් පිටින් ඇවිල්ලා නැහැ. හැම දේම බලන්න ඕන. රුපියල් ලක්ෂ පහක් දෙන්න පුළුවන්නම් මම ඊට වඩා කැමතියි. නමුත් අපිට ශත පහක

දෙයක් පිටින් ඇවිල්ලා නැහැ. අපිට තියෙන දේවල් වියදම් කරගෙන තමයි මේක කරන්නේ. ඔබතුමාගේ යෝජනාව හොඳයි. මමත් කැමතියි රුපියල් ලක්ෂ පහක් විතර දෙන්න පුළුවන්නම්. විෂබීජහරණ කටයුතු වලට අඳින ඇඳුමක් රුපියල් එක්දහස් ගාණක් වෙනවා. ඒක වැඩේ ඉවර කරලා පුච්චලා දානවා. ඒ වගේ අමාරු විදියට තමයි අපි යන්නේ. ඒක නිසා අපි රුපියල් ලක්ෂයක් දෙමු මන්ත්‍රීතුමා. අපිට පුළුවන් විදියට තමයි අපි කරන්න ඕන හැම දෙයක්ම. අපිට වෙන කොහෙන්වත් හම්බ වෙන්නේ නැහැ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හම්බවුණත් අපිට ඒ දේවල් හම්බ වෙන්නේ නැහැ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට අපි වාහනය පවා දෙන්න ඕන ගොඩක් වෙලාවට. විෂබීජහරණ කටයුතු වලට කතා කරන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට නෙමෙයි. අපිට තමයි හැම ආයතනයකින්ම කතා කරන්නේ. ඊළඟට අපි සේවකයන් දෙන්නෙක්ව යොදවලා තියෙනවා සම්පූර්ණයෙන්ම විෂබීජහරණ කටයුතු වලට. දැනට රාජ්‍ය ආයතන වලට විතරයි පහුගිය ටිකේදී ඒක කරේ. නමුත් අපි ගෙවල්වලට ගිහින් හරි මේ කාර්යය කරන්න උත්සාහ කරනවා. මේක ලේසි පහසු කටයුත්තක් නෙමෙයි. අපේ සේවකයන්ගේ වගකීම අපිට තියෙනවා. වැරදිලාවත් මේක අපේ සේවකයන්ට ආසාදනය වුණොත් මම දන්නේ නැහැ. එතකොට මේක බොහොම පැහැදිලිව ඉතාම ඉක්මනින් මුළු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවම ආක්‍රමණය වෙනවා කියන එක මම දන්නවා. ඒ නිසා අපි බොහොම උපක්‍රමශීලිව තමයි, බොහොම පරිස්සමින් තමයි මේක කරන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි කියන්නේ සභාවෙන් දෙයක් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සෞඛ්‍ය පැත්තෙන් කිසි අවබෝධයක්, දැනුමක් නැති අය තමයි ඔය කාරණා වලට අපි යොදවන්නේ. ඔය කාරණයේ වගකීම ආයතන ප්‍රධානියා විදියට මට ගන්න සිද්ධ වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් මේ කාරණය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා එක්කත් මම කතා කරා. මේ තුන්වෙනි රැල්ල අවස්ථාවේදී පළවෙනි වාර දෙකටම වඩා වැඩි ආසාදිතයන් ගණනක් එකවරම දැන් අපේ බලප්‍රදේශය තුළ ඉන්නවා. ඒක තමයි දැන් තියෙන තත්ත්වය. මේ කෙටි කාලය ඇතුළේ මේක වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනා අතරවාරයේදී ඕක ගැන කතා කරමු. නැවතත් ඔය ගැන කතා කරනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්න උත්සාහ කරේ මේකයි. මම යෝජනාවකුත් දාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන ඒ වෙලාවේදී කතා කරමු. දැනුත් කතා කරලා ඒ වෙලාවේදීත් කතා කරහම අපිට ඒක ගැන විතරයි කතා කරන්න පුළුවන් වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමන්ලා ඒක ගැන මෙතන සාකච්ඡා කරපු නිසා මම ඒක කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අපි කතා කරේ මේ ගැන නෙමෙයි. රුපියල් ලක්ෂයක මුදලක් කරාපිටිය රෝහලට දෙන එක ගැන කතා කරේ. අපි මතු කරේ ඒක. කරාපිටිය රෝහලට යම් පරිත්‍යාගයක් කරන්න කියලා ඉල්ලලා තියෙනවා. ඒ ගැන තමයි අපි කතා කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඊට අමතරව කොරෝනා ගැන කතා කරමු යෝජනා වාරයේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මම යෝජනා කරන්නේ රුපියල් ලක්ෂයක මුදලක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මුදල් නෙමෙයි දෙන්න ඕන. භාණ්ඩ වලින් තමයි දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔය ලිපියේ සඳහන් භාණ්ඩ මිලදී ගෙන ලබා දෙමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ මේවා ඇත්තටම මදියි මේ ක්‍රියාවලියේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැන් විනාඩි දෙකකට කලින් මේක ගැන කිවුවානේ මන්ත්‍රීතුමා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ කරාපිටියේ රෝහලට දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ඒකනේ කියන්නේ. රුපියල් ලක්ෂයක් යොදවන්නේ ඒකට නෙමෙයි. මේ කරාපිටිය රෝහලට ලක්ෂයක් දෙන්නේ. මේ පරිත්‍යාගයක් කරන්නේ. මේ කොවිඩ් ප්‍රශ්නයට රුපියල් ලක්ෂයක් යොදවනවා නෙමෙයි මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ අපේ බලප්‍රදේශයට අදාළව නෙමෙයිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. මේ වෙනත් දෙයක්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම ඕකට පොඩි ඌනපූර්ණයක් කරන්නම්. කරාපිටිය රෝහලේ මේ දවස්වල බෙඩ් ශීට්, සරම්වල ලොකු හිඟතාවයක් තියෙනවා. මොකද සමහර වෙලාවට පි.සී.ආර්. පරීක්ෂණය කරන කොට ගෙවල් වලින් මිනිස්සුන්ව ගෙන්වලා ඒ අයට ආපහු යන්න වෙන්නේ නැහැ. යතුරු කැරැල්ලත් සමහර විට ඒ අය ගාව තියෙන්නේ. සමහරු අඳිනවා යතුරුවත් ගෙදරට දෙන්න විදියක් නැතුව. ඇඳිවත පිටින්ම තමයි ඒ අයට දවස් ගාණක් ඉන්න වෙන්නේ. ඉතිං මම හිතන්නේ හෙද කාර්ය මණ්ඩලයත්, වෛද්‍යවරුත් මේ දවස්වල ප්‍රකාශ කරන්නේ ඒ එන අයට පොඩ්ඩක් පිහිට වෙන්න පුළුවන්නම් ලොකු දෙයක් කියලා. ඇඳන් වලට දාන්නවත් බෙඩ්ශීට් නැහැ. සමහරු බිම ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඒකට අපිට කරන්න පුළුවන් ක්‍රමවේදයක් නැහැ. අපි මොකක් හරි අයිතමයක් අරගෙන දෙමු රෝහලට.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඔය රුපියල් ලක්ෂයක මුදල ඉතාමත්ම වටිනවා. ඒක සෑහෙන්න වටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රෙදි වලින් දෙමු. අපි රෙදි අවම මිලට අරගෙන දෙමු. අපි තව පරිත්‍යාගශීලින්ට කතා කරලා අරගෙන දෙමු. එහෙම කිහිප දෙනෙක් ඉන්නවා. ඒවාත් එකතු කරලා රෙදිවලින් දෙමු. එක්කෝ ජැකට් දෙමු. අපි ඒ රුපියල් ලක්ෂයක මුදල ඒ විදියට යොදවමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත</u>**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** සිට්ට්‍රස් වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ඉදිරිපත් වී ඇති කොන්ත්‍රාත්කරුවන් තිදෙනා අතරින් වඩා සුදුසු කොන්ත්‍රාත්කරු තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ මත සහ නර්ඩ් ආයතනයේ විස්තර ලිපිය අනුව තෝරා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතන්නේ ගොඩක් දෙනෙක් මේ සම්බන්ධව දැනුවත්. අපිට ටෙන්ඩර් කමිටුව විදියට කලින් ටෙන්ඩර් තුනක් ලැබිලා තිබුණා. ඒ ටෙන්ඩර් තුන බලලා අපි තීරණයක් ගත්තේ නැහැ මොකක්ද මේකෙ තීන්දුව කියලා. මොකද අපිට තියෙන්නේ ඒ වෙලාවේදී අඩුම මිල ගණනට මේක දෙන එක නෙමෙයි. මේකෙ කාටද සුදුසුකම් තියෙන්නේ කියන එක තෝරගන්න අපිට බැරි හින්දා අපි මේක තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමු කරා. නමුත් ඔබතුමන්ලා දන්නවා තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය වුණේ වෙන මුකුත් නෙමෙයි අඩුම ලංසුව කියන එක. ඒක අපිට ටෙන්ඩර් කමිටුවෙන් වුණත් කර ගන්න පුළුවන් වෙලා තිබුණ වැඩක්. ඒක අපිට තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමු කරන්න අවශ්‍ය නැහැ අඩුම ලංසුවට මේක තෝරන්න වුණානම්. ඊට කලින් ගත්තොත් ඔබතුමන්ලාට මතක ඇති අපි තීරණයක් ගන්න බැරුව හිටියා. අපි මේක නර්ඩ් තාක්ෂණය යටතේ කරනවාද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ තාක්ෂණය යටතේ කරනවාද කියලා ගැටළුවක් තිබුණා. නර්ඩ් ආයතනය කරන්නේ අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ. නමුත් පළාත් පාලන දෙපාර්තමේන්තුව කරන්නේ ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ. මේ ක්‍රම දෙකෙන් අපි මොන ක්‍රමයටද කරන්නේ, කා සමඟද මේක කරන්නේ කියලා අපිට මුලින් තීන්දුවක් ගන්න බැරුව හිටියා. ඒක ඔබතුමන්ලා සියළුදෙනාම දන්නවා. ඉතිං එතනදී අපි අවසානයේදී මේකට තීන්දුවක් ගත්තා. අමුතුවෙන් ඒක ගැන කියන්න ඕන නැහැ. ඒ හින්දා අපි තීරණයක් ගත්තා. නර්ඩ් ආයතනය තමයි ලංකාවේ ඉන්න රජයේ ආයතනයක් විදියට ආදාහනාගාර ඉදිකිරීම පිළිබඳව පළපුරුද්දක් ඇති එකම රජයේ ආයතනය. ඉතිං අපි නර්ඩ් ආයතනය සමඟ එකතු වෙලා අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ මේක හදන්න තමයි තීරණය කරේ. ඒක එහෙම තීරණය කරලා අපි මිල ගණන් කැඳෙව්වා. එතනදී බොහොම පැහැදිලිව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු ජයනන්දන මහතා සහභාගි වුණා. මම ඉල්ලා සිටිනවා අවශ්‍ය කාරණා විතරක් සභාගත කරමු කියන කාරණය. මොකද මේකෙදී අපිට මේ

නිලධාරීන් එක්ක ආරවුලකට ගිහින් මේක කර ගෙන යන්න බැහැ. මේවායේ බිල් වලට පවා අත්සන් කරන්න ඕන ඒ අය. ලක්ෂ විස්සට වැඩි නිසා ඒ අදාළ නිලධාරීන් තමයි අත්සන් කරන්න ඕන. ඒ නිසා මේකෙදී ආරවුලකට යන්න බැහැ. ඒ අයගෙන් මේකට සහතිකයක් අවශ්‍ය වෙනවා. නමුත් මම බොහොම පැහැදිලිව වගකීමෙන් සියළු මන්ත්‍රීවරුන්ට කියනවා. අවසන් තීන්දුව ගැනීම ටෙන්ඩර් මණ්ඩලය සතුයි. මොන දේ වුණත් අවසාන තීන්දුව ගන්න ඕන ටෙන්ඩර් කමිටුව. ටෙන්ඩර් කමිටුව තීන්දුව ගන්න කලින් තමයි මම මේක සභාවට ඉදිරිපත් කරේ. සභාවේ තීන්දුව මොකක්ද කියලා අපිට වැදගත් වෙනවා. සභාවේ තීන්දුව අනුව අපි ටෙන්ඩර් මණ්ඩලයේ තීන්දුව ගන්නවා. ඉතිං ඒකෙදී පැහැදිලිවම ප්‍රධාන ඉංජිනේරුවරයා අපිට ලිඛිතව ලබා දීලා තියෙනවා එතුමාට අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව දැනුමක් සහ පළපුරුද්දක් නැහැ කියලා. ඒක ලිඛිතව එතුමා අපිට ලබා දීලා තියෙනවා. ඒ නිසා එතුමා අපිට කිවුවා අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව දැනුමක් එතුමාට නැහැ. ඒ නිසා අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ කරන්න එතුමාට ඒකට සහභාගි වෙන්න බැහැ කියන එක තමයි අපිට ලිඛිතව දැන්වූයේ. ඊට පස්සේ අපි තීරණය කරා නර්ඩ් තාක්ෂණය එක්ක අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ මේක කරන්න. ඉතිං මම කලින් සඳහන් කරපු විදියට අපි ටෙන්ඩර් කැඳෙව්වා. ඒකට ටෙන්ඩර්කරුවන් තුන්දෙනෙක් ඉදිරිපත් වෙලා හිටියා. ඒ තුන්දෙනා අතරින් අඩුම කෙනාව තෝරනවා නම් අපිට ඒක තෝර ගන්න තිබුණා. නමුත් අපිට ඕනකම තිබුණේ තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ මේකට ගන්න. තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා සහභාගි වුණා ප්‍රධාන ඉංජිනේරු ජයනන්දන මහතා. මොකද ඒක අපි කළ යුතුයි. අපේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කෙනා තමයි කමිටුවේ සභාපතිවරයා විදියට පත්කරේ. ඊට පස්සේ නර්ඩ් ආයතනයේ ඉංජිනේරුවරයාව පත් කළා. ඒ උදය මහතා. ඒ වගේම අපේ තාක්ෂණ නිලධාරි ගුණසේකර මහතාව පත් කරා. ඒ තුන් දෙනා තමයි තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිලධාරීන් විදියට සහභාගි වුණේ. නමුත් ඉතිං මම පුද්ගලිකව වගේම සභාපතිවරයා විදියටත් මේකට මගේ එකඟතාවය පළවෙන්නේ නැහැ. මොකද හේතුව කිසිසේත්ම මේ ආයතනය පිළිබඳව ඇගයීමක් කරේ නැහැ. ඇගයීමක් කරානම් කොතරම් ආදාහනාගාර ප්‍රමාණයක් අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ සිදුකරලා තියෙනවාද, කොහොමද කරලා තියෙන්නේ කියලා ගිහිල්ලා බලන්න ඕන. තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය නම් ඒක තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය වෙන්න ඕන. එහෙම නැත්නම් ඒක ටෙන්ඩර් කමිටුවේ නිර්දේශය නොවිය යුතුයි. ඉදිරිපත් කරපු මිල ගණන් අපි ඒ අයට ලබා දීපු එකත් වැරදියි. ඒ අය හැසිරෙන්න ඕන තාක්ෂණික ඇගයීම් කමිටුව හැටියට. ඒ අස්සේ වාර්තාවේ සඳහන් කරලා තියෙනවා සියයට ගාණක් විදියට හදලා තියෙන වෙනස. ඉතිං ඒක තමයි හදලා ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒ වගේම අපි බොහොම පැහැදිලිව පුවත්පත් දැන්වීමක් දාලා තියෙනවා අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ කරන්නේ කියලා. මොකද අපිට ඕන මේක කල් තියෙන විදියට හදන්න. මේක අපි අවුරුද්දකට, දෙකකට, තුනකට හදන එකක් නෙමෙයි. මේක පරම්පරා ගාණකට අපි හදන එකක්. අපි එතන ඵලකවල නම් ගහලා ඔක්කොම කරගෙන අපිට තව අවුරුදු ගාණක් යන කොට එන මිනිස්සු ඔක්කොම බනීවි. දැන් අපි උදාහරණයක් විදියට අක්මීමන ප්‍රාදේශීය සභාවේ අදාහනාගාරය ගමු. ඒකට යන කොට ඇඳුමක් ඇඳගෙන ගියොත් මුළු ඇඳුමම අළුවලින් නැහැවෙනවා. සම්පූර්ණයෙන්ම දුම එන්නේ යටින්. ඉතිං ඒ වගේ ප්‍රශ්න ගණනාවක් තියෙනවා. අපි ගියපු වෙලාවට ඒ සභාපතිවරයාට දුරකථන ඇමතුමක් අරගෙන ඒක ගැන කියනවා. ඇත්තටම ඉතිං මූලික අඩුපාඩු තියෙන දේවල් තමයි ඒ ප්‍රශ්න. ඉතිං ඒකෙදී අපි ඊට පස්සේ ටෙන්ඩර් කමිටුව විදියට මේවා බලන්න ගියා. අපි ගිහින් බැලුවා ඒ ආයතනවල හදලා තියෙන ආදාහනාගාර ගැන. එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් කියන ආයතනය තමයි තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අපිට තෝරලා දීලා තියෙන්නේ. ඔවුන් සඳහන් කරලා තියෙනවා එකම එක අදාහනාගාරයක් අප්ග්‍රාෆ්ට් ක්‍රමයට ඉදි කරා කියලා. නමුත් එක ආදාහනාගාරයක්වත් ඉදිකිරීමක්වත් නෙමෙයි මේ. ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ තිබ්ච්ච ආදාහනාගාරයක මැෂින් එක අප්ග්‍රාෆ්ට් ක්‍රමයට ද්විත්ව ආදාහනාගාරයක් විදියට සකස් කරලා තියෙනවා. ඒක රුපියල් ලක්ෂ හැටක වැඩක් විතරයි. ඒ අය ඒක විතරයි කරලා තියෙන්නේ. නමුත් ප්‍රේමදාස සහ පුත්‍රයෝ කියන ආයතනය ගත්තම අපි ඒ අය ඉදිකරපු ආදාහනාගාර තුනක් බැලුවා. අපි ඉල්ලලා යැව්වා නර්ඩ් ආයතනයෙන් ඒ අය ඉදිකරපු ආදාහනාගාරවල විස්තර. ඒ අය අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ විතරක් ආදාහනාගාර හතළිහක් විතර ඉදිකරලා තියෙනවා. ඒ වගේම තමයි මට පහුගිය දිනක කොළඹට කැඳවලා තිබුණා අතිගරු ජනාධිපතිතුමාගේ රැස්වීමකට. මම මෙතන තියෙන ලැයිස්තුවේ ඉන්න ප්‍රාදේශීය සභා වල සභාපතිවරුන්ගෙන් මේ ගැන විමසුවා. ඒ කිසිම ප්‍රාදේශීය සභාවක ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය ඉදිකරපු ආදාහනාගාර ගැන කොයි වෙලාවකවත් අඩුපාඩුවක් කිවුවේ නැහැ. මම ඒ සභාපතිවරු හය දෙනෙක් එක්ක විතර කතා කරා. නමුත් ඒ අය අඩුපාඩුවක් කිවුවේ නැහැ. ඉතිං ඔය වගේ කාරණා තමයි මේකෙ මම නම් දකින්නේ. අපි මේ වෙලාවේදී තීන්දුව ගන්න ඕන. අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව පළපුරුද්දක් තියෙන ආයතනය තමයි අපි තෝරා ගන්න ඕන අඩු මුදලට වැඩිය. මුදල වටින්නේ නැහැ කියන එක නෙමෙයි මම මේ කියන්නේ. මුදල වටිනවා වගේම තාක්ෂණය පිළිබඳව දැනුමක් තියෙන්න ඕන.

මේ එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් කියන ආයතනය මම අර කලින් කිවුවා වගේ රුපියල් ලක්ෂ හැටක අළුත්වැඩියාවක් විතරයි කරලා තියෙන්නේ. ඒ අය 2011 දී ඒක කරලා තියෙන්නේ. දැනටත් වෙන එකක්වත් කරලා නැහැ. ඔකම විතරයි කරලා තියෙන්නේ. ඔක කරේ මන්ත්‍රීතුමා නර්ඩ් එකේ සහතිකය ලබා ගන්න. නමුත් ඒක කරෙත් ඒ අය නෙමෙයි. ඩී.එම්.එස්. කන්ස්ට්‍රක්ෂන් කියන වෙනත් ආයතනයකට දීලා ඒක කරේ. ඒ ආයතනයත් නර්ඩ් ආයතනයෙන්ම තමයි සම්බන්ධ කරලා දීලා තියෙන්නේ. අරගොල්ලන්ගේ අධීක්ෂණය

යටතේ උප කොන්ත්‍රාත්තුවක් වෙනත් ආයතනයකට දීලා තමයි මේක කරලා තියෙන්නේ. ඒක කරේ නර්ඩ් සහතිකය ගන්න. එතනින් එහාට අද වෙනකම් එකම ආදාහනාගාරයක්වත් අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ මේ ආයතනය විසින් ඉදිකරලා නැහැ. මේ තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් තෝරපු ආයතනය. ඉතිං මම ඒ ගැන මෙතනදී කියනවා.

දැන් මෙහෙම දෙයක් තියෙන්නේ. අපි නර්ඩ් ආයතනයෙන් විමසුවා ඒක ගැන. අදාළ කොන්ත්‍රාත්කරුවන් තුන්දෙනා ගැන අපි නැවත විමසුවා. නර්ඩ් ආයතනයෙන් අපි මේක ගැන නැවත ඉල්ලීමක් කරා අපි මෙන්න මේ වගේ ගැටළුවක ඉන්නේ කියලා. ඒ පාර ඒ අය ඉදිරිපත් කරලා තියෙනවා ඒ කරපු ආයතන වලින් නැවත විස්තර අරගෙන. මාතලේ නගර සභාවේ ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට තිබුණ එක අප්ග්‍රාෆ්ට් ක්‍රමයට අළුත්වැඩියා කිරීම පමණයි ඔය තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් තෝර ගනිපු එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනය කරලා තියෙන්නේ. ඊට අමතරව දෙවැනියට ඉන්න ආයතනය ගොඩක් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ ආයතනය තමයි මේ සම්බන්ධව ඉන්න ප්‍රවීනයා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එදා තර්කයක් මතු වුණා තාත්තා ඉන්න කොට තමයි මේ ආයතනයේ ආදාහනාගාර ඉදිකරේ කියලා. තාත්තා ජීවත්ව ඉන්න කොට අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ ආදාහනාගාර විසි දෙකක් ඉදිකරලා තියෙනවා. තාත්තා නැති වුණාට පස්සේ ආදාහනාගාර එකොළහක් ඉදිකරලා තියෙනවා අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ. එතකොට අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ ආදාහනාගාර තිස්තුනක් ඉදිකරලා තියෙනවා. මෙතන තියෙන්නේ වෙන කාරණාවක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගාල්ල මහා නගර සභාවේ වාර්තාව ගෙන්වා ගෙන බලන්න පුළුවන්නම්. ඒ සම්බන්ධ වාර්තාවක් පත්තරේ ගිහින් තියෙනවා. මට ඒ පත්තරය හොයා ගන්න බැරි වුණා. මම දිගටම ඒක හෙව්වා. ඒ වෙච්ච අර්බුදය ගැන පත්තරේ ගිහින් තියෙනවා. ඒක තමයි ඇත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් මෙතන තියෙන්නේ. දකුණු පළාත තුළ වෙනම අධිකාරියක් නිර්මාණය කෙරෙමින් පවතිනවා. ඒක බොහොම පැහැදිලියි. නමුත් ඒක එහෙම නොකෙරිච්ච හේතු තුළ වෙනත් විදියකට මේක ආක්‍රමණය කිරීමට තමයි මේ යන්නේ. දේවල් තියෙනවා මම ඒවා කියන්නේ නැහැ. නමුත් මේ කාරණය කිව යුතුයි. මේ ආයතන තුනෙන් මට දුරකථනයෙන් කතා කරපු එකම ආයතනය තමයි ඔය එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනය. මේක නොකෙරී යන ස්වාභාවයක් තියෙන කොට මට දුරකථනයෙන් ඒ ආයතනය කතා කරා. දුරකථන අංකය දැනටත් මගේ ළඟ තියෙනවා. මට කතා කරලා කිවුවා මෙහෙම මෙහෙමයි කියලා. ඔය කාරණයම කියලා කිවුවා. දුරකථනයෙන් ඔබතුමාට කතා කරන්න බැරි දේවල් තියෙනවා නම් වෙලාවක් දෙන්න කියලා කිවුවා හමුවන්න එන්න. මම කිවුවා හමුවන්න එන්න වෙලාවක් දෙන්න අවශ්‍ය නැහැ කියලා. අපි කමිටුවක් විදියටයි, සභාව විදියටයි තීන්දුවක් ගන්නම් කියලා කිවුවා මොකක්ද කරන්නේ කියලා. ඒක මම බොහොම විවෘතව කියනවා. ඒ ආයතනයෙන් විතරයි මට දුරකථනයෙන් කතා කරේ. මොකද මට එතනදී තේරුණා මේ වැඩේ යන විදිය මොකක්ද කියලා. ඒ ටික තමයි මට කියන්න තියෙන්නේ. අපි සාකච්ඡා කරලා මොකක්ද ගන්න ඕන තීන්දුව කියලා බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් මිල ගණන අඩුයි කියලා කිවුවා. දැන් ඒ අයට තීන්දු කරන්න දෙන්න එපා මෙන්න මේ ආයතනයෙන් මේක කරන්න දෙන්න ඕන කියලා. දැන් අපි ඉස්සර වාහන හදන කොට මාතර සමරසිංහ ආයතනයට දාලා වාහන හදලා ගෙනාවා. ඉතිං කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මම කියන්නේ දැන් ඉංජිනේරුවරුත් දොස්තරලා වගේමයි. අපේ දොස්තර මහත්වරු බෙහෙත් නියම කරනවා වගේම ඒ අයත් මේ වැඩේම පටන් අරගෙන තියෙනවා. මේකට ඉඩ දෙන්න බැහැ කොහොමවත්ම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක මම මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් අදහස් විමසුවා. ඒ වගේම විමර්ශන නිලධාරි උදයසිරි මහතාගෙන් අදහස් විමසුවා. ඔය ආකාරයෙන් ගන්න පුළුවන් උපදෙස් සියල්ලම ගත්තා. එතනදී ඒ අයට යම් යම් දේවල් කියා ගන්න බැරුව ඉන්නවා, ඒ අය නිලධාරීන් හින්දා. නමුත් අවසන් තීන්දුව ගන්න තියෙන්නේ ටෙන්ඩර් මණ්ඩලය සතුව. ඒකට කාටවත් අභියෝග කරන්න බැහැ. ඊට කලින් මම හිතුවා වඩා හොඳයි කියලා සභාවෙන් තීන්දුව ගත්තා නම් ටෙන්ඩර් මණ්ඩලයෙන් තීන්දුව ගන්න කලින්. ඒක හින්දා කිසි කෙනෙකුට මේක ගැටළු සහගත එකක් නෙමෙයි. තමන්ට ස්වාධීනව මේ පිළිබඳව අදහස් දක්වන්න පුළුවන් කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක ඇත්තටම අපේ ආසනයේ නායක වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ සිහිනයක් බවට පත්වෙලා තිබුණා. ඉතාමත් ඉක්මනින් මේ කටයුත්ත කරන්න කියලා දිගින් දිගටම එතුමා ඔබතුමාගෙන් ඉල්ලීම් කරා. ඔබතුමත් නිරන්තරයෙන්ම ඒ බව සඳහන් කරා. ඉතිං ඒ නිසා තමයි ටෙන්ඩර් කැඳවලා මේක කරන්නේ. ආදාහනාගාරයක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අත්‍යවශ්‍ය දෙයක්. ඒ නිසා තමයි මේ කටයුත්ත කරන්නේ කියන කාරණාව සිහිපත් කරේ. මතක් කරන්න ඕන මෙතනදී අපේ චමින්ද මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරා පෝද්දල කොට්ඨාශයේ ආදාහනාගාරයක් හදන්න. ඒක විරෝධතා මත සිට්ටස්

වත්ත ප්‍රදේශයේ තමයි හදන්න තීරණය කරේ. ඉතිං එතුමාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ඉදිරිපත් කිරීම වෙනුවෙන්. නමුත් මේ ගෙනාපු වාර්තාවේ තීන්දු පිළිබඳව මම නම් සෑහීමකට පත් වෙන්නේ නැහැ මන්ත්‍රීවරයෙක් විදියට. ඒක පිළිබඳව සෑහීමකට පත් වෙන්න බැහැ. මොකද අපිට සභාවේ සුළු සේවකයෙක්ට දුන්නත් මේ ඉලක්කම් ටික මේවා කරලා අඩුම ගාණ මොකක්ද කියලා බලලා එතනට දෙන්න කියලා තෝරලා දෙන්න පුළුවන්. ඒක බැරි නිසා තමයි තාක්ෂණික ඇගයීම් කමිටුවට මේක ඉදිරිපත් කරේ. මොකද අපි ආදාහනාගාර ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳව දන්නේ නැති නිසා. ඉතිං මේ වන විට ඒ වාර්තාවේ නිර්දේශ දීලා තියෙන්නේ එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනයට. ඒ අයට පුළුවන් කියලා තමයි මේක ලබා දීලා තියෙන්නේ. හැබැයි ඒ වාර්තාවේ අවසානයේ සඳහන් වෙන්නේ මෙම ලංසුකරුවන් තිදෙනා ගත් විට එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනයට ටෙන්ඩරය ලබා දීමට යෝජනා කරන බව කියලා. මේකෙදී තාක්ෂණය පිළිබඳව අධ්‍යයනයක් නොකර අඩුම ලංසුවට තමයි මේක ලබා දීලා තියෙන්නේ. මේ වාර්තාවේ ඒක පැහැදිලිව සඳහන් වෙනවා. ඉතිං අපිට අඩු මුදලට දෙන්න ඕන නම් මේ තාක්ෂණික ඇගයීම් කමිටුවට දාලා මේකට වාර්තාවක් ගන්න ඕන නැහැ. ඒ විතරක් නෙමෙයි පැහැදිලිවම තියෙනවා නර්ඩ් ආයතනය ලබා දීපු වාර්තාවල එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම 2011-11-25 හදලා තියෙන්නේ මාතලේ මහා නගර සභාවට අයත් ආදාහනාගාරයකි කියලා. සිංහල කරපු අය මේක දන්නවා. මෙතන මේ ආදාහනාගාරයකි කියලා තියෙනවා. ආදාහනාගාරය කියලා නවත්වන්නේ නැතුව ආදාහනාගාරයකි කියලා කිවුවම මෙතන එකම එකක් කියන කාරණාව තියෙන්නේ. හදලා තියෙන්නේ එකම එකක් කියන කාරණාව තමයි මේ නීතිමය පැත්තෙන් කියන්නේ. ඉතිං ඒකත් අපි අධීක්ෂණය කරන්න ගියාට පස්සේ දක්කා ද්විත්ව කුටීරය විතරයි හදලා තියෙන්නේ. ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට තිබුණ ආදාහනාගාරයක් අප්ග්‍රාෆ්ට් ක්‍රමයට හදලා තිබුණේ. හැබැයි ප්‍රේමදාස සහ පුත්‍රයෝ කියන ආයතනය සභාපතිවරයා කියපු විදියට ආදාහනාගාර තිස් තුනක් හදලා තියෙනවා. ඒකෙනුත් අවසාන අවුරුදු දහය තුළ අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ අදාහනාගාර එකොළහක් හදලා තියෙනවා. ඉතිං මම සභාවේ යෝජනා කරනවා මේ තාක්ෂණ ඇගයීම් වාර්තාවෙන් දීපු එකට නෙමෙයි, මේක අපි ප්‍රේමදාස සහ පුත්‍රයෝ කියන ආයතනයට ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. මේ ආදාහනාගාර කොන්ත්‍රාත්තුව ඒ ආයතනයට ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, එතකොට මේ මුදලේ කොපමණ වෙනසක් තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රුපියල් ලක්ෂ තිස් පහක වෙනසක් තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** රුපියල් ලක්ෂ තිස් පහක වෙනසක් තියෙනවා නම් මෙහෙමයි. මහා පරිමාණයෙන් කරන කොන්ත්‍රාත්කරුවෙක් වැඩ සියයක් කරන්න පුළුවන්. හැබැයි අළුතෙන් පුරුදු වෙන එක්කෙනා කරන එක වැඩේ හරියට කරන්න පුළුවන්. අපිට රුපියල් ලක්ෂ තිස්පහක ලාභයක් තියෙනවා නම් අපි ඒ ගැන හිතලා බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා ඔබතුමා කියන එක හරි. නමුත් මෙහෙමයි. එහෙමනම් අපිට තීරණය කරන්න තිබුණේ ඉස්සෙල්ලම මේක අපි ඩවුන්ග්‍රාෆ්ට් තාක්ෂණයට කරනවා කියලා. නමුත් දැන් අපිට තියෙන ප්‍රශ්නය අපි අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට කරන්න තීරණය කරලා තියෙන්නේ. මේ එන්නේ සියයට සියයක් ඩවුන්ග්‍රාෆ්ට් තාක්ෂණයට ආදාහනාගාර ඉදිකරන කෙනෙක්. එයා ඩවුන්ග්‍රාෆ්ට් තාක්ෂණයට ආදාහනාගාර ඉදිකරලා තියෙනවා. ඒක හරි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට ඕන ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට කරන්නද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. අපිට ඕන අප්ග්‍රාෆ්ට් ක්‍රමයට කරන්න. ඒකයි වැඩේ තියෙන්නේ. තවම ඔබතුමා මේක තේරුම් ගත්තේ නැහැ. අපිට ඕන අප්ග්‍රාෆ්ට් ක්‍රමයට කරන්න. නමුත් මේ තෝරලා තියෙන කෙනා ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට කරපු කෙනෙක්. මේ තාක්ෂණ දෙකක්. ඒකයි මෙතන තියෙන ගැටළුව.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතනදී අපි ඉල්ලන්නේ මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඉල්ලන්නේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව පළපුරුද්ද තියෙන කෙනෙකුට මේක දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් මේ නිර්දේශ කරන කෙනාට ඒක නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ඒ ආයතනය කරලා නැහැ. ඒ අයතනය එකම එකක් කරලා තියෙනවා උප කොන්ත්‍රාත් දීලා වෙන කෙනෙකුට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක වෙනම කරලා හරි වැඩේ හරියට කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ 2011 දී. ලයිෂන් එක ගන්න ඕන නිසා ඒක කරලා තියෙන්නේ. ඒක තමයි මම මෙච්චර වෙලා මේක තේරුම් කරලා දුන්නේ. ඒ ලයිෂන් එක ගන්න ඕන නිසා 2011 දී වෙන කෙනෙක් ලවා ඒක කරලා තියෙනවා. මෙහෙම දේකුත් තියෙනවා. අපි ඒක එයාම කරා කියමුකෝ. ඇයි එතනින් එහාට එයා නොකරේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් නැවත වතාවක් ඒක කරන්න ඉල්ලලා තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ පළවෙනි යෝජනාව හැටියට ඉදිරිපත් වෙච්ච මේ කාරණය අපි දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කරපු දෙයක්. මම හිතන්නේ මේක අපි, අපේ මංගල සභාවේදී චමින්ද මන්ත්‍රීතුමා විසින් කරපු යෝජනාවක අවසන් අදියර. ඒ යෝජනාවේ ප්‍රතිඵලය ආදාහනාගාරය ඉදිකිරීම කියන කාරණය. ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න සූදානම් වන මොහොත මේ. විශේෂයෙන්ම මේක ගැන සාකච්ඡා කරන කොට දීර්ඝකාලීනව පසුගිය කාලය තුළදී අපි මේ ගැන අධ්‍යයනය කරා. කමිටු හැටියට මේකට තියෙන නෛතික කාරණා, ප්‍රසම්පාදන කමිටු තීන්දු තීරණ, අදාළ වූ නියමයන් හා නීති රීති ඒ සියල්ලටම යටත්ව අපි යම් ක්‍රියාවලියක් පහු කරලා තමයි මේ අවස්ථාවට ඇවිල්ලා ඉන්නේ. මේකෙදී අපි මූලිකවම තීන්දුවක් ගත්තා සභාව හැටියටම මොන ක්‍රමවේදයකට මේ ආදාහනාගාරය ඉදිකරනවද කියන එක ගැන. ඒකෙදී අපි නිශ්චිතවම පැහැදිළි කර ගත්තා රජයේ නිල ආයතනයක වගකීම සහිතව සහ ඒ තාක්ෂණය උපයෝගි කර ගනිමින් මේකට යමු කියලා. නර්ඩ් ආයතනයේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණය අනුව මේක කරන්න ඕන කියලා අපි තීන්දුව අර ගත්තා. ඒ තීන්දුව අරගෙන තමයි අපි මේ ක්‍රියාවලියට ප්‍රවිශ්ට වෙන්නේ. එතකොට ඒකට අදාළව ටෙන්ඩර් කැඳවීම කරන කොට අපි ඊට කලින් නර්ඩ් ආයතනය සම්බන්ධ කර ගෙන සාකච්ඡාවක් කරා. ඒ සාකච්ඡා වලදී අපි තීන්දු කර ගත්තා, මේ තාක්ෂණය උපයෝගී කර ගෙන මේ ගොඩනැගිල්ල ඉදිකරන්න පුළුවන් ආයතන හරහා මේක කරන්න. ඒ වෙනුවෙන් අපි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරා. එතකොට ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අපි මේකට දාපු කොන්දේසි මා සතුව තියෙනවා. ඒ ප්‍රසම්පාදන දැන්වීම මා ගාව තියෙනවා. එතකොට අපි යම් නිශ්චිත කොන්දේසි ප්‍රමාණයක් ඒ ආයතන වලට ඉදිරිපත් කරනවා. ඒ අදාළ කොන්දේසි වලට යටත්ව තමයි ඒ ආයතන ඉදිරිපත් වෙන්නේ. මෙතනදී අපේ අතින් මගහැරුණු එක කාරණයක් තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ අතින් නෙමෙයි ඒ අඩුපාඩුව ආවේ. හිතාමතාම ඒක කරා. ඒක මම ඔබතුමාට කියන්නම්. ටෙන්ඩර් පත්‍රිකාව හැදුවේ අපි නෙමෙයි. මෙතනදී ඒ වැරැද්ද හිතාමතාම කරා. ටෙන්ඩර් පත්‍රිකාව හැදුවේ අපි නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමා මේ මූලාසනයේ ඉන්න මේ සභාවේ ප්‍රධානියා. එතකොට ගරු සභාපතිතුමනි ඔබතුමා කියනවා නම් මේක මගේ කනෙන් රිංගලා ගේම ගැහුවා කියලා. එතකොට ඒක සාධාරණ නැහැ. ඒක එහෙම කියන්න සුදුසු නැහැ ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්න මම කියනකම්. එහෙමනම් මන්ත්‍රීතුමා තාක්ෂණ ඇගයීම් කමිටුවේ වැඩෙත් අපි කරනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කිවුවේ ඔබතුමාගේ වගකීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ටෙන්ඩර් පත්‍රිකාව හදන එක අපිට කරන්න බැහැ. ඒක මට හදන්න බැහැ මන්ත්‍රීතුමා. ඒක මම කියන්නම ඕන. ඒක උපක්‍රමශීලීව තමන්ට ඕන කෙනාව ඇතුල් කර ගන්න හදපු එකක්. මේක බොහොම පැහැදිලියි. දැන් අපිට ඒක තේරෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නේ ඒ මූලික අවස්ථාවේදී අපේ සීමාව තුළ නැතුව වෙන කෙනෙක් හදපු නිසා ඒක මගහැරුණා කියලද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක මම අහන්නේ ඔබතුමාගෙන් මෙච්චරයි. මේකෙදි තාක්ෂණ ඇගයීම් කමිටුව කියන්නේ මොකක්ද, නමුත් ඔබතුමා බලන්න ඒ අය දීපු වාර්තාවේ එකම කාරණයයි තියෙන්නේ. ඒ අය දීපු වාර්තාවේ තියෙන්නේ මිල ගණන් සංසන්දනය කිරීම පමණයි. ඒ වැඩේ මොකක්ද, අපි මේක තර්ක කරන්න යන්න ඕන වැඩක් නෙමෙයි. තර්ක වලට යන්න ඕන මේක බේර ගන්නේ කොහොමද කියලා බලන්න. එතකොට අපිට තේරෙන කාරණාව මේක නෙමෙයිද, තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවේ නිර්දේශ විදියට මිල ගණන් විතරක් දාන්නේ ඇයි. ඇයි ඒ අයට දාන්න බැරි සංසන්දනාත්මකව මේ අය කරපු වැඩ ගැන. ඒකනේ වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාගේ පැත්තෙන් ඔය කියන අදහස මට පැහැදිලියි. ඒ අදහස සම්බන්ධව විවේචනය කරනවා නෙමෙයි මේ. ගරු සභාපතිතුමනි, මේ පැහැදිලි කිරීම අපි කරගෙන ඉවර වෙලා අපේ ගැටළු හෝ ප්‍රතිවිරෝධතා තියෙනවා නම් ඒවා සාකච්ඡාවට ගනිමු. ඒක කිසි ගැටළුවක් නැහැ. මොකද මම මගේ පැත්තෙන් මේ විග්‍රහය කර ගන්න වෙනවා. අපි මේ මොහොතේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපිට මේකෙ තියෙන සියළු කාරණා වලට යම් වගකීමක් තියෙනවා.

අපි මේකට එකඟ වුණා හෝ, විරුද්ධ වුණා හෝ, මතවාදයක් නැතුව හෝ අපි මේකට මැදිහත් වුණොත් වගකීමක් අපිට පවරලා තියෙනවා ප්‍රදේශයේ ජනතාවගෙන්. ඒ ජනතාවට සාධාරණයක් වෙන විදියට මේ නියෝජනය අපෙන් වෙන්න ඕන. ඒ නිසා තමයි මම මේ පැහැදිලි කිරීම කරන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා අපි මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසු කැඳවීමේ ක්‍රියාවලියට කොන්දේසි ඉදිරිපත් කරා. ඒ කොන්දේසි වලට අදාළව ලංසුකරුවන් ඉදිරිපත් වුණා. ඊළඟට එතනදී ගැටළුවක් මතු වුණා. අපි ඒ නර්ඩ් ආයතනයේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණය උපයෝගි කර ගෙන ඒ වෙනුවෙන් ලංසු කැඳවීමක් කරන කොට අපි සෘජුවම නර්ඩ් ආයතනයේ ලියාපදිංචි වෙච්ච සියළුම ආයතන එක්ක සම්බන්ධීකරණය කරලා මේ ලංසු කැඳවීම කරන්න අවස්ථාව ගත්තේ නැහැ. එහෙම වුණේ නැහැ. යම් යම් කරුණු මඟහැරුණා. ඒකට හේතුවක් තියෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා මන්ත්‍රීතුමා. අපි ඒවා දැනටමත් කිරීම අවශ්‍ය නැහැ. හේතුව මොකද දන්නවාද, අපි පුවත්පත් දැන්වීමක් දාලා තියෙනවා. පුවත්පත් දැන්වීමක් කියන්නේ මොකක්ද කියලා දන්නවාද මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක පැහැදිලියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා තුනෙන්ම ඒ දැන්වීම දාලා තියෙනවා. ඔය ආයතනයන් ඒක දැක්කේ නැහැ කියලා අපි හිතන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම කියන්නේ ඒ ආයතන ඒක දැක්කේ නැහැ කියන එක නෙමෙයි. අපි පත්තර තුනක භාෂා තුනකින් දැන්වීම දාලා තියෙනවා. එතකොට මම කියන්නේ ඒක ගැටළුවක් නෙමෙයි. අපේ ක්‍රමවේදයේ තියෙන ගැටළුවකට නෙමෙයි මම මේ කියන්නේ. අපිට ඒක සෘජුවම මඟහැරුණා. ඒ ආදාහනාගාර ඉදිකරනවා කියන එක විශේෂ කාරණයක්. ආයතන කිහිපයයි ඒකට ලංකාවෙම තියෙන්නේ. කඩ අරිනවා වගේ ඒවා හැම තැනම කරන්න බැහැනේ. සිල්ලර කඩ කරන්න වගේ ආදාහනාගාර ඉදිකරන්න බැහැ. කොන්ත්‍රාත් ආයතන ගත්තත් එහෙම කරන කොන්ත්‍රාත් ආයතන කිහිපයයි තියෙන්නේ. ඒ නිසා ඒකෙනුත් විශේෂත්වය අපි අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පාවිච්චි කරමින් තමයි මේකට යන්නේ. එතකොට ඒ කුලකය තවත් කුඩා වෙනවා. එතකොට අපිට බොහොම සීමිත ඉදිකිරීම් ආයතන කිහිපයක් විතරයි ඇත්තටම මෙහාට කැඳවන්න තිබුණේ. ඕනම නම් අපේ අතේ ඇඟිලි ගාණට අඩු සංඛ්‍යාවක් ඒ ආයතන තියෙන්නේ. එතකොට මේකෙ ඒ ක්‍රියාවලියේදී ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් වෙච්ච ආයතන අපෙන් අරන් ගිහින් තිබුණා ටෙන්ඩර් පත්‍රිකා හතර දෙනෙක් විසින්. නමුත් තුන් දෙනයි ටෙන්ඩරයට ඉදිරිපත් වෙලා තිබුණේ. එතකොට ඒ තුන් දෙනාටම අදාළව ඒ ටෙන්ඩරය විවෘත කිරීමේදී ටෙන්ඩර් මණ්ඩලය විසින් මේ තිදෙනාම මේකට සුදුසු බවට නිර්දේශ කරනවා. ඒ ටෙන්ඩර් තුනම පිළිගන්නවා. ඒ ටෙන්ඩර් තුන පිළිගනිමින් ලංසුවේ මිල ගණන් ප්‍රකාශ කරනවා. මේ ටෙන්ඩරය දෙනවා කියන තීන්දුව නෙමෙයි මේ ගන්නේ. මේකෙන් කියන්නේ නැහැ ටෙන්ඩර් එක දෙන්න ඕන කියලා. ඊට පස්සේ මේකට අදාළව තමයි තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවක් අපි සකස් කරන්න යන්නේ. එතකොට දැන් මේකෙන් බළලා මල්ලෙන් එළියට පනින්නේ මෙන්න මේ තත්ත්වයට මේක යන කොට. ප්‍රශ්නය තියෙන්නේ එතනයි. දැන් මේක බොහොම සරලව විසඳන්න පුළුවන් වුණා නම් මේ ප්‍රශ්න පැන නගින්නේ නැහැ. බොහොම පහසුවෙන් මේක ගලාගෙන ගියා නම් හරි. දැන් මේක යන ක්‍රියාවලිය හරහා මේක ඇතුළේ මම අවංකව දැනිච්ච, දැන ගනිපු තොරතුරු තියෙන කාරණා එක්කයි මේ කතා කරන්නේ. ඒ නිසා මම වගකීමෙන් මේක කියනවා. මේකට මම දෙන විග්‍රහය තමයි මේ. ඒක මට අනන්‍යයයි. ඒකට අදාළව මම මේක කියන්නේ. ඒ නිසා මේක තව කෙනෙකුට කරන බලපෑමක් නෙමෙයි. පෞද්ගලිකව තම තමන් ඒක තීරණය කර ගන්න. නමුත් මට අදාළ විග්‍රහය මම කරන්නම්. එතකොට මම මගේ තීන්දුව ගන්නේ මේ විග්‍රහය මත ඉඳගෙන. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේකෙ දැන් තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව බලන කොට අපිට පැහැදිලිව දෙයක් දකින්න හම්බවෙනවා. විවිධ පාර්ශව වල වුවමනාවන් එළියට එන හැටි පේනවා. විශේෂයෙන්ම මේකෙ බරපතල වැරැද්දක් තියෙනවා. රජයේ නිලධාරීන් පවා මේ හැසිරෙන විදිය සුදුසු නැහැ. ඔබතුමා දැන් මෙතනට ඉදිරිපත් කරපු ලියකියවිලි බලන්න. මේවා සාදාචාරාත්මක නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කිසිම ඉල්ලීමක් නොකර අර වගේ ලියුමක් එවන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තමන්ගේ මොළය හෝ දක්ෂතාවය පාවිච්චි කරමින් ඒකට අදාළව පෞද්ගලික මැදිහත්වීම් කරන විදියට, පත්වෙනවා නම් ඒක සුදුසු නැහැ. විශේෂයෙන්ම ටෙන්ඩර් මණ්ඩලය හෝ තාක්ෂණ ඇගයීම් කමිටුව නියෝජනය කරමින් ඒක කරන්නේ. ඒක සාදාචාරාත්මක නැහැ. ඒක නිසා මේ ගැටළුව සඳහා අපේ විවේචනයක් තියෙනවා. ඒ වගේම තමයි මේක ඇතුළේ මේ ආයතන කිහිපය පරීක්ෂා කරන කොට සාදාචාරාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. සමහර නෛතික කාරණා වලදී ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග වල, මුදල් රෙගුලාසිවල තියෙන නෛතික ක්‍රියාවලිය ඇතුළේ සමහර දේවල් ප්‍රශ්න කරන්න වෙනවා. අපේ සුගත් මන්ත්‍රීතුමා මේක ප්‍රශ්න කරපු විදියටම මේකෙ වෙනස තියෙනවා රුපියල් ලක්ෂ තිස්පහක්. මේක සුළුපටු නැහැ. මිලියන තුනහමාරකට එහා ගිය වෙනසක් තියෙනවා.

එතකොට මේ වෙනසට අදාළව තාක්ෂණ දෙකේ වෙනසක් නෙමෙයි තියෙන්නේ. මේ එකම තාක්ෂණය වෙනුවෙන් ඉදිරිපත් වෙලා තියෙන්නේ. ඒ ඒ ආයතන වල තියෙන පළපුරුද්ද හෝ මොනයම් දුර්වලතා හෝ තියෙනවා නම් ඒවා අපිට වෙනම නිරීක්ෂණය කරන්න පුළුවන්. ඒවා විග්‍රහ කරන්නත් පුළුවන්. නමුත් මේකෙදී එකම තාක්ෂණය වෙනුවෙන් තමයි මේ ආයතන තුනම ඉදිරිපත් වෙලා තියෙන්නේ. එතකොට ඒක සම්බන්ධව ප්‍රශ්න කරනවා නම් තාක්ෂණය සම්බන්ධව අපිට ප්‍රශ්න කරන්න බැරි නිසා තමයි තාක්ෂණ ඇගයීම් කමිටුවකට මේක යොමු කරලා ඒ අයට කියන්නේ වාර්තාවක් ලබා දෙන්න කියලා. බරපතලම කාරණය තියෙන්නේ මේක සම්බන්ධයෙන්. අපි ඒ විවේචනය ඉදිරිපත් කරන පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක්, නර්ඩ් ආයතනයේ නියෝජිතයෙක් සහ අපේ සභාවේ නියෝජිතයෙකුත් මේකට පත් කරනවා. එතකොට මේ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් තමයි මේ තාක්ෂණික ඇගයීම් වාර්තාව සපයන්නේ. එතකොට මේක අපිට බැහැර කරන්න බැහැ නිකං ආවට ගියාට. ඒ නිසා බරපතල කාරණාවක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඔබතුමා කියන එක හරි. නමුත් මම අහන්න කැමතියි ඕකේ ඒ අය තාක්ෂණය පිළිබඳ සඳහන් කරලා තියෙනවද කියලා. ඒක ගැන කොහෙද තියෙන්නේ කියලා මට කියන්නකෝ. එතන ඒ අය ඇවිත් නිර්දේශය දීලා තියෙන්නේ මුදල සම්බන්ධව. ඔය තීන්දුව අපිට ටෙන්ඩර් මණ්ඩලයෙන් ගන්න පුළුවන්කම තිබුණා. මම අහන්න කැමතියි ඒ අය මේ එක තැනකටවත් ගිහින් බැලුවද, කරපු එකක්වත් බැලුවද, කමිටුව රැස්වෙන්නේවත් නැතුව ඕක කරන්න හිටියේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපිට එහෙම අභියෝග කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි බැරි. මම මේක මේ වෙලාවේදී කියන එක හොඳ නැහැ. මේකෙ ටෙන්ඩර් මණ්ඩලය විදියට අපිට ඕන තීන්දුවක් ගන්න ඇති තරම් හේතු තියෙනවා. මොකද, මේකෙදී එක කාරණාවක් මත පදනම් වෙලා විතරක් අපිට තීන්දුවක් ගන්න ඕන නැහැ. ඊට පස්සේ පළපුරුද්ද කියන එක ඊළඟ කාරණාව. බොහොම පැහැදිලිව අපි අප්ග්‍රාෆ්ට් තාක්ෂණය තෝරා ගන්නේ ඇයි. අප්ග්‍රාෆ්ට් තාක්ෂණය තෝරා ගන්නේ අපි නර්ඩ් ආයතනයත් එක්ක එකඟ වුණ හින්දා. පළාත් පාලන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරපු ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට අපි එකඟ වුණේ නැහැ. මේකෙ තාක්ෂණය ගැන දැනුමක් අපිට නැහැනේ. අපි තාක්ෂණය ගැනනේ වාර්තාව ඉල්ලුවේ. මේකෙ තාක්ෂණය ගැන අපිට තියෙන සහතිකය මොකක්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රශ්නය තියෙන්නේ ගරු සභාපතිතුමා මේකයි. අපි දන් මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරලා ඒක ගිහින් අවසාන කෙළවරේදී මේ තීන්දු තීරණ වෙනස් කරනවා. එතකොට ප්‍රසම්පාදන කමිටුව හෝ තාක්ෂණ ඇගයීම් කමිටුව ලබා දීපු නිර්දේශ වලට පටහැනිව තීන්දුවක් ගන්න තරම් අපිට සාධාරණ තර්කයක් අවශ්‍යයයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සාධාරණ තර්කයක් තියෙනවා මන්ත්‍රීතුමා. වෙන දේවල් පැත්තකට තියමුකෝ. අපි දැන්වීම් පළ කරලා තියෙන්නේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට මේක කරන්න. අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට මේක කරන්න තමයි අපි දැන්වීම දාලා ටෙන්ඩර් කැඳෙව්වේ. ඔය එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනය එකක් කරා කියලනේ ඉදිරිපත් කරන්නේ. අපි හිතමු ඒකත් ඒ අය කරා කියලා. අනිත් ආයතනය තිස් ගාණක් කරලානේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ විතරක්. එතකොට ඒකම මදිද මේකෙ තියෙන වෙනසට. ඔය කියන තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ වෙනස් කරන්න ඒකම තීන්දුව විදියට ඇතිනේ. නමුත් ඊට වඩා පරිබාහිර කරුණු තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා මට අවස්ථාව දෙන්න. මේකට මම මගේ පැහැදිලි කිරීම කරන්නම්. මගේ පැහැදිලි කිරීම කරමින් මගේ තීරණය පිළිබඳව විග්‍රහයක් කරන්නම්. මේක අපි තවදුරටත් අතරමැදදී එක එක ඒවා කතා කරලා එනකොට මේක තවත් දිග්ගැස්සෙනවා. එතකොට ඔබතුමාට මේක ප්‍රශ්නයක් වෙනවානේ. එහෙම වෙන්න ඕන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවශ්‍ය කාරණා ටික පැහැදිලි කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ වචන වලින්ම කියනවා නම් මේක ඇතුළේ ඒ ඒ පාර්ශවයන්ගේ ඉදිරිපත්වීම සහ මැදිහත් වීම අනුව ඒක හරි පැහැදිලියි. ඒ වුවමනාව මොකක්ද කියලා පැහැදිලියි. එතකොට ඒ වෙනුවෙන් ප්‍රසම්පාදන දැන්වීමක් නිර්මාණය කරනවා. එතකොට ඒකට අදාළව තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශයන් හදනවා. එතකොට එක කණ්ඩායමක් හෝ එක ව්‍යාපාරිකයෙක් ඉලක්ක කර ගෙන මේක නිර්මාණය කරනවා කියන මතය තමයි ඔබතුමාගේ ප්‍රකාශය වුණේ. මේ සභාවට ඒක ගැන මූලික අදහසක් තිබුණා, පොදුවේ ඇතුළේදී මොන දේ කරත්, මේ ක්‍රියාවලිය ඇතුළේදී මොන දේ සිද්ධ වුණත් මූලික අදහස තිබුණා යම් ඉලක්කයක් සහිතව මේක මෙහෙයවනවා කියන එක. ඒක තමයි ඔබතුමා කිව්වේ. අපිටත් ඒක දැනෙනවා. ඒක ඇත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඔබතුමා මුලින්ම මේක කියන්නකෝ. අපි මුලින්ම ඒක ආපු හින්දානේ ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට යන්නේ නැතුව අප්ග්‍රාෆ්ට් ක්‍රමයට මේක කරන්න තීරණය කරේ. ඕක ගැන තොරතුරු ආපු හින්දා තමයි අපි තීරණය කළේ මේක නර්ඩ් ආයතනයේ අධීක්ෂණය යටතේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක පැහැදිලියි සභාපතිතුමා. ඒක තමයි මම කියන්නේ. අපි මූලිකවම තීන්දුවකට ආවා මේකට යම් තාක්ෂණයක් පාවිච්චි කරනවා කියලා. ඒකට එකඟ වෙන්න හේතු කාරණා ගොඩකුත් අපිට තිබුණා. ඒකත් හරි පැහැදිලියි. මොකද ඒවා පසුබිමේ තිබිච්ච ප්‍රශ්නයත් හොයා බැලුවම තිබුණ කරුණු කාරණා එක්ක තමයි ඒ තීරණයට එන්නේ. මෙතනදී කාගේවත් විරෝධතාවයක් තිබුණේ නැහැ. මේකෙදී ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමය වෙනුවට අපි අප්ග්‍රාෆ්ට් ක්‍රමයට යමු, ඒක නර්ඩ් ආයතනය හරහා කරමු, ඒක රජයේ නිල ආයතනයක් නිසා. ඒ නිසා මේ ආයතනයේ තාක්ෂණික උපදෙස් මත මේක ක්‍රියාවට නගමු කියන තර්කය ආවේ. එතකොට ඒ එකඟතාවය අපි තීන්දු කරේ ටෙන්ඩර් කැඳවන්න ඉස්සෙල්ලා. ඒ නිසා ටෙන්ඩර් කැඳවනකොට අපි කොන්දේසියක් දැම්මා අප්ග්‍රාෆ්ට් ක්‍රමයට යනවා කියලා. ඒ අනුව තමයි මම මේක කියන්නේ. එතන සිට අපිට පොදු අවබෝධයක් තිබුණා. ඒකට මම එකඟයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එක තැනක හිටියානේ මේකට. අපි සියළුදෙනා එක තැනක හිටියා මේක අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ කරන්න ඕන කියලා. ඉතිං මන්ත්‍රීතුමා අපිට මේ වෙලාවේදී කරන්න ඕන මේකයි. අපිට මිල ගණන් වලින් තෝර ගන්න ඕන නම් ටෙන්ඩර් කමිටුවේදී තීරණයක් ගන්න තිබුණානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක හරි සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි දිගටම සභාවක් විදියට ඉඳපු ස්ථාවරය තියෙන්නේ. ඉතිං ඒ ස්ථාවරයේදී අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට කවුද ප්‍රවීනයන් වෙන්නේ. අපිට තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් දෙන්න තිබුණේ ඒකනේ. නමුත් ඒ අය ලබා දුන්නේ ඒක නෙමෙයිනේ. ඒ අය තාක්ෂණය පිළිබඳ කාරණාවක් නෙමෙයිනේ ලබා දෙන්නේ. ඒ අදාළ කාරණාවක් නෙමෙයිනේ මේ ලබා දෙන්නේ. ඔබතුමාට ඒක තේරෙන්නේ නැද්ද, තමන්ට අදාළ කාරණාවක් නෙමෙයිනේ ඒ අය ලබා දෙන්නේ. අන්තිමට නිර්දේශ විදියට ලබා දෙන්නේ මිල අඩු මේ ආයතනය නිසා, මේ ආයතනයට ටෙන්ඩර් එක ලබා දීමට නිර්දේශ කරමි කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මට මේ පැහැදිලි කිරීම කර ගන්න අවස්ථාව දුන්නට පස්සේ අපි මේ ගැන කතා කරමු කියන එකයි මගේ අදහස. එතකොට සංයමයකින් කතා කරන්න පුළුවන් වේවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි දෙන්නා ආරවුලකට, ගැටුමකට මෙතනදී යන්න ඕන නැහැ. එහෙම ප්‍රශ්නයක් නැහැ. අපි මතවාද වලින් ගැටිලා හරි තීරණයකට එමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක මම මෙහෙම කියන්නේ වෙන මුකුත් නිසා නෙමෙයි. ඒක අපිට බලපාන්නේ මෙහෙමයි. රජයේ ප්‍රසම්පාදන නීති රීති අනුව, මුදල් රෙගුලාසි අනුව, මේ ක්‍රියාවලිය හරියට වෙන්න ඕන කියන ස්ථාවරයේ මම ඉන්නේ. මේකෙ තාක්ෂණය සම්බන්ධව තියෙන ගැටළු වලට අපිට නිර්දේශ දෙන්න බැහැ. අපිට වඩා තාක්ෂණය සම්බන්ධව අවබෝධයක් සහිතව ඒ අදාළ නිලධාරීන් ඒවා සම්බන්ධව ඉදිරිපත් වෙලා මත ප්‍රකාශ කරලා තියෙනවා. අපිට නෛතික ප්‍රශ්න ටිකක් තියෙනවා මේකෙදි. අපි මේකෙන් නිරවුල් වෙන්න පුළුවන් නම් අපිට මේක කරන්නේ කවුද කියන එක ගැන ගැටළුවක් නැහැ. කොටින්ම අපි කවුරුවත් වෙනුවෙන් පෙනී ඉන්නේ නැහැ. ඒක හරි පැහැදිලියි. මොකද මේ රටේ නිලධාරීන් පවා මම කියන්නේ එක එක ආයතන රකින්න ඉදිරිපත් වෙලා තියෙනවා. ඒවා මේ සමාජයේ ප්‍රසිද්ධම කාරණා වෙලා තියෙනවා. අපිට එහෙම කවුරුවත් රකින්න වුවමනා නැහැ. මේකෙ වැඩේ කෙරෙන කොට මහජන මුදල් වලින් කරන්නේ. එතකොට මේ මහජන මුදල් වලට යම් සාධාරණයක් ඉෂ්ඨ වෙන්න ඕන. මේක අපේ බලප්‍රදේශයේ ඉන්න දුප්පත් ජනතාවගේ බදු මුදල් වලින් කරන එකක්. සියලු දෙනාම පොදුවේ ගෙවන බදු මුදල් වලින් සහ ආදායම් වලින් අපි වැඩ කරන්නේ. අපි ණය මුදලක් අරගෙන කරත්, රජයේ මුදල් දීලා කරත්, පළාත් සභාවෙන් කරත් මේවා රටේ මුදල්. ඒකට තර්කයක් ඔබතුමාටවත්, මටවත් නැහැ. මම කියන්නේ එහෙම ප්‍රතිවිරෝධතාවයක් නැහැ. ඒ අදහසට අපි එකඟයි. මේක කරන්න යනකොට අපිට තියෙන ගැටළුවලට අදාළව මම ඉදිරිපත් කරන්නේ මට තියෙන කාරණා ටික. මම ඒ ටික විග්‍රහ කරාට පස්සේ ඔබතුමාගේ පැත්තෙන් සහ මේ ඉන්න අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ පැත්තෙන් ඒ අයටත් අදහස් තියෙන්න පුළුවන්. අපි මේක කතා කරලා එකඟතාවයකට යමු. ඒ නිසා මම කියන්නේ මෙතනදී ප්‍රධාන ගැටළුව වුණේ මේක. අපි දැන් මේ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කරලා ටෙන්ඩර් කමිටුවේදී ලංසු විවෘත කරලා, ලංසුවල මිල ගණන් සම්බන්ධයෙන් දැනුවත් වෙලා ඊට පස්සේ ඒකට වැඩිමනක් යමක් එකතු කරන්න තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කරා. එතකොට ඒ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මේකට ලබා දෙන නිර්දේශ ඇතුලේ තාක්ෂණික විග්‍රහයක් නැහැ කියලා අපි තර්ක කරන කොට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. දැන් ඔබතුමා කිවුවේ අපිට තාක්ෂණ දැනුමක් නැති නිසා අපි මේක යොමු කරනවා කියලා.

තාක්ෂණය සම්බන්ධව අපිට මේක ගැන විග්‍රහයක් කරන්න බැහැ. ඒක ඒ අය සතු තීන්දුවක් සහ ක්‍රියාවක්. ඒක ඒ අයට අදාළ වගකීමක්. ඒක ඒ නිලධාරීන් සතු වගකීමක්. ඒ නිසා අපි දැන් මේක ඇතුළේ පරස්පරතාවයන් දකිනවා. ඒ පරස්පරතාවයන් සඳහා තමයි දැන් අපි මේ හේතු හොයන්නේ. ඒ පරස්පරතාවයට තමයි අපිට සාධාරණ හේතු ඉදිරිපත් කරන්න වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මට තියෙන ගැටළුව මේකයි. මේකෙ රුපියල් ලක්ෂ තිස් පහක වෙනසක් තියෙනවා. ඒක එකක්. ඒක පැත්තකින් තියන්නකෝ. දැන් අපිට මේක ඉතාම නිවැරදිව, ඉතාමත් ඉහළ තාක්ෂණයකින් යුතුව කරන්න ඕන. මේක සභාවට වත්කමක්නේ එක පැත්තකින්. එතකොට මේක අවසානයේදී රුපියල් කෝටි පහකට වඩා වැඩි වේවි. ඒ සියල්ල අවසන් වෙන කොට එවැනි එකක් වේවි. රුපියල් ලක්ෂ පන්සීයක් මේකට යොමු කරන කොට අපිට මේකට අදාළව විග්‍රහයක් තියෙන්න ඕන. ඒක පැහැදිලි, සාධාරණ, යුක්ති සහගත එකක් වෙන්න ඕන. මේ ජනතාවගේ මුදල්. ඒ නිසා මම කියන්නේ අපි ඉදිරිපත් කරපු කොන්දේසි තමයි ඒ ආයතනවල නිල සුදුසුකම්. ඒ ආයතනයට මොකක්ද තියෙන සුදුසුකම. ඒක තමයි අපි ටෙන්ඩර් දැන්වීමෙන් කැඳෙව්වේ. ඒකට සුදුසු නිසා තමයි ඒ අයව අනුමත කරේ. නැත්නම් අපි ඒ අයව ප්‍රතික්ෂේප කරන්න ඕන. අපි ඒක ප්‍රතික්ෂේප කරන්න ඕන මුල් අවස්ථාවේදීම මොකක් හරි නුසුදුසුකමක් තියෙනවානම්. ටෙන්ඩර් කැඳවීමට අදාළව නුසුදුසුකමක් ඒ අයට තිබුණේ නැහැ. ඒකයි මම කියන්නේ ටෙන්ඩර් කැඳවීමට අදාළව නුසුදුසුකමක් තිබුණේ නැහැ. ටෙන්ඩර් කැඳවීමට අදාළව නුසුදුසුකමක් තිබුණා නම් ඒක එතනදී ප්‍රතික්ෂේප වෙන්න ඕන. ඒ නිසා මේ ටෙන්ඩර් එකට ඉදිරිපත් වෙච්ච කණ්ඩායම් තුනම නිර්දේශ වුණා. ඉන් පස්සේ ඒ අය සම්බන්ධව තාක්ෂණික ඇගයීම් වාර්තාව කැඳවන කොට එක එක අදහස් එක එක පුද්ගලයන්ට තිබුණා වෙන්න පුළුවන් මේක ඇතුළේ. ඊට අමතරව තව අයටත් ඒක තියෙන්න පුළුවන්. මම කියන්නේ කාට කාටත් මේක ඇතුළේ න්‍යාය පත්‍රයන් තියෙනවා. මට ඒකෙ ආයේමත් දෙගිඩියාවක් නැහැ. මම බොහොම විවෘතව කතා කරන්නේ. ඒක ගැන මම දන්න ප්‍රමාණයකුත් තියෙනවා. නොදන්න ඒවත් ඇති. ඒ නිසා මට තියෙන කාරණය මේක ඇතුළේ ඇඟ බේර ගන්න නෙමෙයි. මගේ ඇඟ බේර ගන්න කාරණයක් නෙමෙයි තියෙන්නේ. මේක ඇතුළේ ඊට වැඩිය සාධාරණයක් මේ කාරණයට වෙන්න ඕන. අන්න ඒ සාධාරණය වෙනුවෙන් විතරයි මේ කතා කරන්නේ. එහෙම නැතුව මේකෙ තියෙන ගාණ බලලා ඒක කීයද, අර ගොල්ලන්ට ඒක යනකොට ඊට වඩා වාසිද, කියලා නෙමෙයි මම බලන්නේ. ඒ වාසිය දිහා නෙමෙයි මම බලන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේකෙ ප්‍රධාන කාරණා කීපයයි තියෙන්නේ. එකක් මේ දරණ පිරිවැයේ පරස්පරයේ වෙනසට අපි වග කියන්න ඕන. මේ තීන්දුව ගත්තා නම් ඒක වෙනවා. ඊට පස්සේ මේ ඉදිරිපත් වෙලා තියෙන කණ්ඩායම් තුනම නර්ඩ් තාක්ෂණය පාවිච්චි කරමින් අප්ග්‍රාෆ්ට් ක්‍රමයට මේ කර්තව්‍යය කරනවා කියලා ඉදිරිපත් වෙච්ච ආයතන. එතකොට ඒ ආයතන ප්‍රතික්ෂේප වුණේ නැහැ මේ ටෙන්ඩර් කමිටුවේදීවත්, ඊට පස්සේ තාක්ෂණ ඇගයීම් කමිටුවේදීවත්. දැන් මේක වෙනස් කරන්න තීන්දුවක් ගන්න තමයි දැන් අපි මේ කතා කරන්නේ. එතකොට අපිට තීන්දුවක් දෙන්න පුළුවන් පෞද්ගලික අදහස් අනුව. මට හිතෙන දේ අනුව ඒක එහෙමයි. නමුත් ඒක කොහොමද මේකට සාධාරණ වෙන්නේ ඊට පස්සේ. දැන් එක එක තර්ක ඉදිරිපත් වෙනවානේ. ඒක ඇතුළේ අන්තර් සම්බන්ධතා තිබුණා ඒ ආයතනය සහ නිලධාරීන් අතරේ. ඒක මෙතනදී පෙනුණා. ඒක අපිටත් පෙනුණා. මම ඒකයි මෙතනදී කතාව පටන් ගන්න කොටම විවේචනයකුත් කිවුවේ. ඒක සදාචාරාත්මක නැහැ කියලා කිවුවා එතුමන්ලාගේ මැදිහත්වීම නිසා. ගරු සභාපතිතුමනි, එතුමන්ලාගේ මැදිහත්වීම සදාචාරාත්මක නැහැ. ඒක හරි පැහැදිලියි. ඔබතුමා කියපු විදියට ඒක හරි. එතුමන්ලා අනිසි බලපෑමක් කරා. සමහර ලියුම් බලපෑම්සහගතයි. මේක එච්චර හොඳ එකක් නෙමෙයි. ඒ වගේම තමයි අපි මේකට සභාවක් හැටියට තීන්දුවක් ප්‍රකාශයට පත් කරන කොට මේක ඇතුළේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියකට ඉදිරිපත් වෙච්ච මිල ගණන් වලට සාධාරණයක් වෙන්න ඕන. ඊළඟට මේ ජනතාවගේ මුදල් වලට සාධාරණයක් වෙන්න ඕන. කරුණාකරලා ඒක නිසා අපිට තියෙන්නේ මේ වැඩේ නිවැරදිව වෙනවද කියලා සහතික කර ගන්න. ඒක කාගෙන්ද කර ගන්නේ කියන එක නෙමෙයි ප්‍රශ්නය. මොකක්ද වෙන්නේ, ඒක හරියට වෙනවද, කියලා බලන්න ඕන. කවුද කරන්නේ කියන එක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ. කරන්නේ මොකක්ද, ඒ කරන වැඩේ හරිද කියන එක බලන්න තමයි තාක්ෂණ නිලධාරීන් ඉන්නේ. ඒ ආයතන මේ අයට වගකියන්න ඕන. අපි හිතමු මෙයාලා දෙනවා කියලා සාධාරණ කාලයක වගකීම් සහතිකයක්. මේකට සේවා කරනවාද, පසුසේවා කරනවාද කියලා බලන්න ඕන. ඒකට අපි ගිවිසුම්ගත වෙන්න ඕන. එහෙම ගිවිසුම් ගත වෙලා ඒවාට සාධාරණ, යුක්තිසහගත ක්‍රමවේදයන් අනුගමනය කරන්න ඕන. රුපියල් ලක්ෂ තිස්පහක මුදලට අපෙන් කවුද වග කියන්නේ. එතකොට මේ කාරණය සැහැල්ලුවෙන් තකලා පැත්තකට කරන්න මට නම් බැහැ. මම ඒකයි කියන්නේ. මොකද මේ රජයේ මුදල්. ඔබතුමත් හිටපු රජයේ නිලධාරියෙක් හැටියට සහ මමත් රජයේ නිලධාරියෙක් හැටියට මේකට වගකීමක් තියෙනවා. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලි සහ මුදල් රෙගුලාසි අනුව මට අවබෝධයක් සහ වගකීමක් තියෙනවා. ඒ නිසා මේවා නොදන හිටියා කියලා නැහැ. අපි කාටත් ඒ වගකීම තියෙනවා. රජයේ සේවකයෙක් වෙන්න ඕන නැහැ හැමෝම. එහෙම නැති වුණාට මේ හැම පුරවැසියෙකුටම මේකෙන් ගැලවෙන්න බැහැ. රටේ පොදු නීතිය කාටත් එකයි. ඒ හින්දා මේක ඇතුළේ අපිට පෞද්ගලික වගකීම් දරන්න බැහැ. මේක ඇතුළේ මොකක් හරි වුණොත් මගේ අතින් ගෙවන්න මට සල්ලි නැහැ. ඒ නිසා මේකට තීන්දුවක් ගන්න කොට ඒක හරි පැහැදිලියි. මට ප්‍රශ්නත් තියෙනවා. ඔබතුමාටත් ඒක තිබුණා මේකෙදි පාක්ෂිකව තාක්ෂණික ඇගයීම් වාර්තාව ආවා කියලා. ටෙන්ඩර් දැන්වීමටත් එහෙම කරා කියනවා වගේම, මේක ඇතුළේ අනෙකුත් ක්‍රියාවලියනුත් ප්‍රශ්නගතයි. අනෙක් ක්‍රියාවලි යන්නෙත් එහෙම සබඳතා සහිතව

තමයි. ඒක ඇත්ත. මේ ඇත්ත මට මෙතනදී කියන්න ඕන වෙන මොකක්වත් නිසා නෙමෙයි. ඔබතුමාට තිබුණ ප්‍රශ්නය හරි පැහැදිලියි. නිලධාරීන් අනිසි බලපෑම් කරනවා මේ ක්‍රියාවලිය තමන්ට වුවමනා දිශාවට යොමු කර වන්න. ඒ වගේම තමයි මේකෙ ටෙන්ඩර් කැඳවීමේ ඉඳන් එක එක ආයතනයට මේක යොමු කරවන්න වුවමනාවෙන් ඒ දිශාවන් වලට වෙච්ච කොන්දේසි ටිකක් තමයි මේකට දාලා තිබුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා මම කියන්නේ. මෙතන අපි බොහොම පැහැදිලිව අප්ග්‍රාෆ්ට් කියන තාක්ෂණය යටතේ අපිට ඕනෑ තරම් හේතු තියෙනවා මේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ප්‍රතික්ෂේප කරන්න. මම ඒකට හේතු එකින් එක කියන්නම්. ඇයි අපි මේක මත පදනම්ව විතරක් මේ ගැන කතා කරන්නේ. ඕන තරම් හේතු තියෙනවා මේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ප්‍රතික්ෂේප කරන්න. ඒකට හේතුව මම මුල ඉඳන් කිව්වානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ගැන මමත් විවේචනය කරානේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙමයි මන්ත්‍රීතුමා. අපිට මේකෙ එකක් ඇති. අපිට ඕන අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව පළපුරුද්ද. එච්චරයි. ඉතිං මේ පළපුරුද්ද තියෙන්නේ අහසයි, පොළවයි වගේ. ඕක මදිද අපිට සභා තීන්දුවක් ගන්න. අපිට මන්ත්‍රීතුමා මුදල මත පදනම්ව විතරක් නම් තීන්දුව ගන්න ඕන තාක්ෂණ ඇගයීම් කමිටුවකට මේක දාන්න ඕන නැහැ. අපිට ටෙන්ඩර් මණ්ඩලයෙන්ම ඕක තෝරලා, බේරලා දෙන්න තිබුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම දැන් පැහැදිලිවම කිව්වේ ඒ තියෙන ඒවා වගේම, එතුමන්ලාගේ වැරදි මැදිහත්වීම් සහ අපිට කරන බලපෑම් කිරීම් වගේම මම කියන්නේ අනෙක් ඒවත් මේ සම්බන්ධව බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකම කාරණය මන්ත්‍රීතුමා මුදල් ප්‍රශ්නයනේ. ඒකෙදිත් බොහොම පැහැදිලිව කිව්වා සභා තීන්දුව ඉතා බලවත්. ඒ වගේම ටෙන්ඩර් මණ්ඩලය අවසන් තීන්දුව ගන්නේ. ටෙන්ඩර් මණ්ඩලය සතුයි අවසාන තීන්දුව ගන්න එක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මගේ පැහැදිලි කිරීම කරලා ඉවර කරන්නම්. අපි තවදුරටත් මේක අල්ලගෙන යන්න ඕන නැහැ. මගේ පැහැදිලි කිරීම කරලා මම ඉන්න ස්ථාවරය කියන්නම්. එතකොට අනිත් අය තම තමන්ගේ අදහස කියලා තීන්දුවකට එන්න. ඒක පොදු තීන්දුවට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මට තියෙන ප්‍රශ්නය වෙන්නේ ඔය කියපු ආකාරයේ මේ තියෙන අයථා මැදිහත්වීම අප්ග්‍රාෆ්ට් ක්‍රමයට සහ ඒක ඇතුළෙත් තියෙනවා. අනිත් එක තමයි අප්ග්‍රාෆ්ට් ක්‍රමයට කරන්න අපි තීන්දු කරලා තිබුණේ. ඒක ගැන අපිට ගැටළුවක් නැහැ. එතකොට අපි තාක්ෂණය මොකක්ද කියලා තීන්දු කරා. අපි කරන ක්‍රමවේදය තීන්දු කරා. අපි තීන්දු නොකරේ මේක කවුද කරන්නේ කියන එක. අපි මොකක්ද කරන්නේ කියන එක තීන්දු කරලා තිබුණේ. මොකක්ද වෙන්න ඕන කියලා අපි තීන්දු කරලා තිබුණේ. අපි දැන් මොකක්ද කරන්න ඕන සහ මොකක්ද වුණේ කියන එක තහවුරු කර ගන්න ඕන. එතකොට ඒ දෙක අතරේ අන්තර් සම්බන්ධතාවය තියෙන්නේ ඔය ආයතනය හරහා. ඔය ආයතනය කවුද කියන එක මට නම් වැදගත් නැහැ. ඇත්ත කතාව ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අපිටත් එහෙම වැදගත්කමක් තිබුණේ නැහැ මන්ත්‍රීතුමා. අපිට වැදගත්කමක් තිබුණා නම් අපි ටෙන්ඩර් මණ්ඩලයෙන් තීන්දුවක් ගන්නවානේ ආයතනය පිළිබඳව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම සෘජුවම මේකෙදී පෙනී සිටින්නේ මේකයි. ඒ ආයතනය පොරොන්දු වුණේ මේ තාක්ෂණය පාවිච්චි කරලා ඒක ක්‍රියාත්මක කරන්න. මුදල අඩු නම් එතකොට ඒක හරියට කරනවාද, ඒක නිවැරදිව කරනවාද කියන එක තමයි තාක්ෂණ නිලධාරීන් අවධානය යොමු කර වන්න ඕන. ඒ අදාළ තාක්ෂණික ආයතනය අපි සම්බන්ධ කරලා තියෙනවා. එතකොට තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව මේක නිවැරදි ප්‍රමිතියට සිද්ධ වෙනවා නම් මම කියන්නේ අන්න එතනයි ප්‍රශ්නය තියෙන්නේ. ඒ අදාළ ප්‍රමිතියට සිද්ධ වෙනවා නම් මොකක්ද අපි මේකෙ විරුද්ධ වෙන කොන්දේසිය. අපිට ඒකට තියෙන පදනම මොකක්ද, එතන ප්‍රශ්නයක් තියෙනවා. මේකට යටත්ව මම මගේ තීන්දුව ප්‍රකාශ කරනවා. මේක තව එකකට හරවනවා කියන අදහසට මම එකඟ නැහැ. එහෙම නම් මේකෙ ක්‍රියාවලියේ අවුලක් තියෙනවා නම් මේ ක්‍රියාවලිය නැවත පණගන්න වන්න ඕන. මේ ක්‍රියාවලියේ වැරැද්ද ක්‍රියාවලියෙන්ම නිවැරදි කර ගන්න ඕන. එහෙම නැතුව පුද්ගලයාව මාරු කරලා මේක කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ක්‍රියාවලියේ මොකක්ද නිවැරදි කරන්නේ. දැන් කොහොමත් මන්ත්‍රීතුමා මෙහෙමයි. දැන් අදාළ ආදාහනාගාරය ඉදිකරන තැන අපි ගෙපල කපලා ඒ ටික ඉවර කරලා තියෙනවා. අපිට මේ කොරෝනා ප්‍රශ්නයත් එක්ක නැවත ඕක ටෙන්ඩර් කරොත් මේකට තව අවුරුද්දක් විතර යනවා. එතකොට අපේ කාලයේදී  අපි මේක ඉවර කරන්නත් ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කල් මරන්න ඕන කාරණයක් නෙමෙයි මම මේ කියන්නේ. මේකෙ තියෙන ගැටළුව, වෙලා තියෙන ප්‍රශ්නය වන්නේ මේ මුදල සහ මේකට අපි වගකියන්න ඕනද කියන කාරණය තියෙන්නේ. මේ අඩු මුදලට ඒ තාක්ෂණය පාවිච්චි කරලා ඒ කියන විදියට සහතිකය දෙනවා නම් මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැනේ මන්ත්‍රීතුමා. එහෙම වෙන්න බැහැනේ. හොඳටම දන්නවා මෙතනදී වංචාවක් කරා කියන එක. මේ ආයතනය එකයි කරලා තියෙන්නේ. අනිත් පැත්තෙන් අර ආයතනයත් අපි ඉල්ලලා තියෙන තාක්ෂණය යටතේ ආදාහනාගාර තිස් ගාණක් ඉදිකරලා තියෙනවා. එතන පළපුරුද්ද තියෙනවානේ. මම අහන්නේ මෙච්චරයි. අපි ටෙන්ඩර් මණ්ඩලය විදියට ඒක තාක්ෂණ ඇගයීම් කමිටුවට ලබා දුන්නේ ඇයි. මේක අපි ටෙන්ඩර් මණ්ඩලය විදියට තාක්ෂණ ඇගයීම් කමිටුවට දුන්නේ තාක්ෂණ ඇගයීම් වාර්තාවක් දෙන්න කියලා. නමුත් ලබා දුන්නේ තාක්ෂණ ඇගයීම් වාර්තාවක් නෙමෙයි. ඒ අය ලබා දුන්නේ මිල ගණන්වල වෙනස. ටෙන්ඩර්වල වෙනස විතරයි ඒ අය ලබා දීපු එකම වාක්‍යය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙමනම් මේක අභියෝගයට ලක් කරන්න. මේ තාක්ෂණ ඇගයීම් කමිටුවේ තුන් දෙනෙක් ඉන්නවා. ඒක අභියෝගයට ලක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණය පිළිබඳව ඒකෙ සඳහන් කරපුවා මට කියන්නකෝ. තාක්ෂණය පිළිබඳව ඔතන සඳහන් කරලා නැහැ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එකම තාක්ෂණයට කරන්න තමයි කවුරුත් එකඟ වෙලා තියෙන්නේ. ඒක අභියෝගයට ලක් කරන්න ක්‍රමයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට කරන්න එකඟ වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පළපුරුද්ද සම්බන්ධ විස්තර අපි කැඳවලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ ඇගයීම් කමිටුවට අපි බලන්න කිවුවේ පළපුරුද්දනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තාක්ෂණ සුදුසුකම් බලන්න කියලා අපි ඒ අයට දැනුම් දුන්නද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි දැනුම් දීලා නැත්තේ. තාක්ෂණ කමිටුව පළපුරුද්ද බලන්නේ නැද්ද, මාර කතාවක්නේ කියන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දැන් මෙතනදී ආදාහනාගාරය සම්බන්ධව ඇත්තටම අපිටත් පොඩි ගැටළුවක් තියෙනවා රුපියල් ලක්ෂ තිස්පහක වෙනසක් තියෙනවා කියලා කිවුවම. දැන් මෙතනදී අපි කියන්නේ මෙහෙමයි. දැන් සාමාන්‍යයෙන් අපි ගෙයක් හදන කොට ප්ලෑන් එකක් දානවා. ඒ ප්ලෑන් එකට ගේ හදනවද කියලා තාක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කරනවා. දැන් අපි සාමාන්‍යයෙන් සභාවෙන් මොනවා හරි එකක් හදනවා නම් ප්ලෑන් එකක් දානවානේ. ඒ ප්ලෑන් එකේ තියෙනවා අත්තිවාරම මෙච්චර තියෙන්න ඕන, මේක මෙච්චර තියෙන්න ඕන, අරක මෙච්චර තියෙන්න ඕන කියලා. එතකොට එහෙම තියෙනවා නම් හරි. දැන් ආදාහනාගාරය හදන්න ප්ලෑන් එකක් ඇතිනේ. ප්ලෑන් එකක් නැතුව ඒක හදන්නේ නැහැනේ. ඒ ප්ලෑන් එකේ තියෙනවා කොන්ක්‍රීට් මෙච්චර දාන්න ඕන, අරක මෙහෙම වෙන්න ඕන, මේක මෙහෙම වෙන්න ඕන කියලා. ඒ අනුව මේක කෙරෙනවා නම් රුපියල් ලක්ෂ තිස් පහක වෙනසක් එන්න විදියක් නැහැ. මට තේරෙන්නේ එහෙම. එහෙම වෙනසක් එන්න විදියක් නැහැ. රුපියල් ලක්ෂ තිස් පහක් කියන්නේ ලේසි පහසු ගාණක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් මම කියන්නම් මන්ත්‍රීතුමා. ඒකටත් මම දකින දේ කියන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ නිසා මම කියන්නේ මෙහෙමයි. මේකට අපි සම්බන්ධ වුණාම විගණන විමසුම් එනවා. එතකොට මේකෙදී තව එකක් තමයි රජයේ ප්‍රධාන නිලධාරීන් තුන්දෙනෙක් මේකෙ ඉන්නවා. ඒ තුන්දෙනා තමයි මේක මෙහෙමයි කියලා තීන්දු කරන්නේ. නමුත් දැන් මෙතනදී ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේ අය තීන්දු කරන එකට අපිට එකඟ වෙන්න බැරි වෙලා තියෙනවා. අපි ඒ අය දෙන එකට එකඟ වෙන්නේ නැත්නම් ඒක අපිට තීරණය කරන්න බැහැ. අපි ඒකට පළපුරුද්ද තියෙන අය නෙමෙයිනේ. එතකොට ඊට එහා ඉන්න කෙනෙක්ගේ අනුමැතිය අපි ගන්න ඕන. ඒකට අපිට තීන්දු කරන්න බැහැනේ මෙයා හොඳයි කියලා. මෙයා හොඳ නැහැ, අරයා හොඳයි කියලා අපිට තීරණය කරන්න බැහැ. එතකොට මේක සම්බන්ධව පළපුරුද්දක් තියෙන අය මේක හොඳයි කියලා කියනවා නම්, අපි ඒක හොඳ නැහැයි කියලා කියනවා නම්, අපි ඊට වඩා දක්ෂ, පළපුරුදු අය වගේ තමයි පේන්නේ එතකොට. දැන් එහෙම වෙන්නත් බැහැ. එක්කෝ මේකෙදී හොඳ පළපුරුද්ද තියෙන අය වෙන්න ඕන. අපි ගමු කොළඹින්.

මේක කොළඹට දාන්න. කොළඹට දාලා එහෙන් අනුමැතිය ගන්න. එහෙම නැත්නම් ඒ සම්බන්ධව දක්ෂ, පළපුරුදු කට්ටියකට මේක දීලා ඒකෙන් අනුමැතිය ගන්න ඕන. එහෙම අනුමැතියක් අරගෙන කරන්න. මේක ඉතා ඉක්මනින් කරන්න පුළුවන්. මේක මහා ලොකු දෙයක් නෙමෙයි. මේකෙ වැඩ කටයුතු හුඟක් දුරට ගිහිල්ලා තියෙනවානේ. ඒ නිසා තව පොඩි ප්‍රමාණයක් තමයි තියෙන්නේ. ඒ කියන්නේ මේක අනුමත කර ගන්න එක. ඒක අනුමත කර ගන්න ඒකට සභාපතිතුමා පොඩ්ඩක් උනන්දු වෙලා වැඩ කර ගන්න. රුපියල් ලක්ෂ තිස් පහක් කියන එක අපේ සභාවට ඔරොත්තු දෙන්නේ නැහැනේ සභාපතිතුමා. රුපියල් ලක්ෂ තිස්පහක් කියන්නේ ලේසි පහසු වැඩක් නෙමෙයිනේ. වාහනයක් ගන්න පුළුවන් මුදලක්නේ ඒක. මේ සම්බන්ධව තව සැරයක් පොඩ්ඩක් කල්පනා කරලා බලලා දෙයක් කරන්න. දැන් අපි ඒ අයට ප්ලෑන් එකක් දුන්නට පස්සේ ඒ අය හදන එක අපේ තාක්ෂණ නිලධාරීන් අනුමත කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක එහෙම කාරණයක් නෙමෙයි මන්ත්‍රීතුමා. අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව දැනුමක් නැහැ කියලා ඉංජිනේරුවරයා දෙන කොට ඔබතුමා කොහොමද කියන්නේ මේක ඕන කෙනෙකුට කරන්න පුළුවන් කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කොයි ඉංජිනේරුවරයාද එහෙම කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපතිවරයා කිවුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම කියලා එයා මේක අනුමත කරන්නේ කොහොමද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක තමයි කියන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඉතිං එහෙම නම් මේක දාන්න කොළඹට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම දාන්න බැහැ. කොළඹට දාලා කරන්න ඕන කාරණාවක් නෙමෙයි මන්ත්‍රීතුමා මේක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිට නම් මේකට එකඟ වෙන්න බැහැ. එහෙම වුණොත් මේක අපිට බාධාවක් වෙනවා. ඒ නිසා අපිට මේ වගකීම ගන්න බැහැ. එහෙම වුණොත් ඒක ඉහළ නියෝගයක් අරගෙන කරන්න. නැත්නම් අපිටත් විගණන විමසුම් එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මොකද කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම අපේ අතින් වුණ පොඩි පොඩි වැරදි කිහිපයක් තියෙනවා. ඒ වැරදි කිහිපය තමයි මේක. මේ ඉංජිනේරු මහතා පිළිබඳව වගේම මේ කවුරුවත් පිළිබඳව මට එහෙම විශ්වාසයක් නැහැ. අපි දන්නවානේ මේ අය වැඩ කරන විදිය. දැන් අපේ අනිත් හැම දේවල් වලටම සහතික දෙන කොට ඔහොම දෙනවා. හැබැයි ඒවා පවතින්නේ නැහැ. ඉතිං වැඩේ තියෙන්නේ මේ හැම කෙනෙක්ම මතු කරන දේ අපි දැක්කා. ඒ කියන්නේ රුපියල් ලක්ෂ තිස්පහක වෙනසක් තියෙනවා. ඒක හරි දරුණුයි. නමුත් එකක් තියෙනවා මේ ටෙන්ඩර් කැඳවනකොට ඒ දාලා තියෙන කොන්දේසි එක්ක මේ තුන් දෙනා තමයි ඉදිරිපත් වෙලා තියෙන්නේ. එතකොට ඒකෙන් ටෙන්ඩර් කමිටුව පිළිගන්නවා මේ තුන් දෙනා ඒ සඳහා සුදුසුයි කියන එක. ඒ කියන්නේ මේ අයට අත්දැකීම් තියෙනවා. ඉතිං දැන් මෙතනදී ප්‍රශ්නයක් තියෙනවා. වැඩියෙන් කරලා තියෙන්නේ කවුද කියන ප්‍රශ්නය උඩ පළපුරුද්ද පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා. හැබැයි මේකෙදී ඇත්තටම මෙහෙම ගියොත්, අනිත් එක්කෙනාට නොදුන්නොත් එහෙම ඒ අයට කවදාවත් මේ අත්දැකීම එන්නේ නැහැ. එහෙම කතාවක් ඇත්තටම තියෙනවා. හැමදාම එයා ඉන්නේ එතනනේ සභාපතිතුමා. ඉතිං ඒක හින්දා ඉතාමත් ප්‍රවේශමෙන් තීන්දුවක් ගන්න ඕන ගරු සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අපි කැමති නැහැ අබේසේකර මන්ත්‍රීතුමා සැත්කමක් පළවෙනියට පුරුදු වෙන්න දෙන්න. එහෙම එකක් තියෙනවා. පුරුදු වෙන එක අපෙන් නොවිය යුතුයි. අනෙක් ඒවා ඕන එකක්. ඒ අයට අත්දැකීම් ගන්න අපි ඉඩක් ලබා දෙන්න බැහැ. මේක මම කලිනුත් කිවුවානේ. අවුරුද්දක්ද, දෙකක්ද, අපි ඉන්න කාලයට විතරක්ද හදන එකක් නෙමෙයිනේ අබේසේකර මන්ත්‍රීතුමා මේක. මට මතු කරන්න තව කාරණාවක් තියෙනවා. මෙතනදී පොඩි වැරදි තර්කයක් ගෙනියනවා දීපු ඇස්තමේන්තුව කිට්ටුවටම ඇවිල්ලා කියලා මේ දෙවැනියට ඉන්න කෙනා. නමුත් එයා දන්නවා මේකට යන සැබෑ වියදම මොකක්ද කියලා. මට ලේකම්තුමා කලින් කිවුවා වගේ හරියටම මේකෙ පොඩි වෙනසයි තියෙන්නේ අපිට දීපු ඇස්තමේන්තුවයි, මිල ගණන අතරයි. නමුත් අදාළ හරියට කරන කෙනා දන්නවා මේකට යන මුදල කොහොමද කියලා. ඒ ඇරෙන්න මේක රුපියල් ලක්ෂ තිස් පහක් අඩුවෙන් හදන්න බැහැ. මම නම් දකින්නේ මෙතනදී පළපුරුද්ද නැතිකම උඩ මේක ගන්න ඕන නිසා කරපු වැඩක් මේක. ඒ අයගේ ඩවුන්ග්‍රාෆ්ට් මිල ගණන් අනුව දාපු ගාණක් තමයි මේකෙ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඇත්තටම එකක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් කෙටිම කාරණය තමයි මම නම් මේකේදී මෙච්චර පැහැදිලිව මේක පෙන්වලත් අපිත් මේ නිලධාරීන්ට යට වෙනවා නම් ඇත්තටම මෙහෙම සභාවක් යනවාට වඩා හොඳයි අබේසේකර මන්ත්‍රීතුමා නිලධාරීන්ටම මේක කර ගන්න කියලා නිකං ඉන්න එක. මම නම් ඉන්නේ ඒ මතයේ. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං ඇත්තටම මේකෙදී ගරු සභාපතිතුමා අපිට බොහොම පැහැදිලිව කරන්න තිබුණ තව දෙයක් තියෙනවා. දැන් අපි ඇත්තටම මේ ක්ෂේත්‍රයේදී ඒ දේවල් ගැන බලන්න ඕන. දැන් අපි ලයිට් බඩු ගන්න කොට ලංකාව පුරාම ඉන්නවා දහස් ගණන් අය. නුවර ඉන්නවා, කොළඹ ඉන්නවා, ලංකාවේ හැම තැනම ඉන්නවා. හැබැයි මේකට ඉන්න අයව අපි නර්ඩ් එකෙන් ගත්තා නම් හරි. අපි ඒ අයටත් දැනුම් දුන්නා නම් ඒ අයත් එනවා. එතකොට අපි එහෙම කරා නම් වඩා හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් පත්තර දැන්වීමක් දැම්මා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හරි. ඔබතුමා කියන විදියට පත්තරේ දැන්වීමක් දැම්මම මේ අය එනවා. ඉතිං අපි දන්නවා මේ ටෙන්ඩර් එකක් යන කොට යන්නේ කොහොමද කියලා. මොකද හේතුව කොළය අරගෙන කීයක් හරි දීලා දානවා. දැන් මෙතන රත්නතුංග කන්ස්ට්‍රක්ෂන් කියලා එකක් තියෙනවා. එයා නව බලපත්‍රලාභියෙක්. දැන් මෙයාට කවදාවත්ම, කිසිම දවසක අත්දැකීම් එන්නේ නැහැ. එතකොට මේ දෙන්නම විතරයි ඉන්නේ. මෙතනදී එතකොට ඒකාධිකාරයක් ගොඩ නැගෙනවා. අපි අනිත් ආයතන දෙක පැත්තකින් තියමුකෝ. මේ රත්නතුංග කන්ස්ට්‍රක්ෂන් ආයතනය නව බලපත්‍රලාභියෙක්. එයා 2021 දී තමයි ලියාපදිංචි වෙලා තියෙන්නේ. එතකොට එයාට කිසි දවසක මේකට එන්න වෙන්නේ නැහැ. එතකොට මේ දෙගොල්ලොම තමයි ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා මතුකරන කාරණයේ පොඩි වැරැද්දක් තියෙනවා. මේක තාක්ෂණ දෙකක්. මම මතුකරේ ඒක දැන්. ඉතින් එතනදී අබේසේකර මන්ත්‍රීතුමා මේ අය 2011දී කරලා තියෙන්නේ ඒක. අපි කියමුකෝ ඒක කරා කියලා. මාතලේ නගර සභාවේ එක ඒ. ඇයි එතනින් එහාට එකක්වත් කරලා නැත්තේ. මේ හදන්නේ වෙන එකක් නෙමෙයි අබේසේකර මන්ත්‍රීතුමා. මේ හදන්නේ දකුණු පළාතේ ඒකාධිකාරියක් ගොඩ නගන්න. දකුණු පළාතට අනිත් අයට ඇතුල්වෙන්න බැහැ කියන එක මේ ගොඩ නගන්න හදන්නේ. ඉතින් අපි ඒකට ඉඩ දෙන්න ඕනද. හොඳටම ඒක පැහැදිලියිනේ. වෙන මුකුත් ඕන නැහැ මේකෙ. අපි මාතලේ ගිහින් බලලා ආවට තීරණයක් ගත්තේ නැහැනේ. අපි තීරණයක් මුකුත් ගත්තේ නැහැනේ. ඔබතුමා වෙනදාට ඔය ගැන බොහොම විවෘතව කතා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව ඉන්නවා. මට ඔය ඉංජිනේරුවෝ ගැන, අපේ නිලධාරීන් ගැන දුකක් එනවා. මොකද දන්නවාද, ඇත්තටම මේ දෙයම තමයි අනිත් තැන්වල කරන්නේ. වරලත් ඉංජිනේරුවරයා සහතිකය දෙනකොට මෙතුමන්ලාට කරන්න දෙයක් නැති වෙනවා. මුකුත් කියාගන්න බැරි වෙනවා. ඒක තමයි මේ වෙලා තියෙන්නේ. ඉතින් මට මේක ගැන නම් කියන්න තියෙන්නේ අප්‍රසන්න කතාවක් ඇත්තටම. ඉතින් මම දන්නවා අමරසූරිය කියන එක්කෙනා ඉන්න කාලයේදී කරේ මොනවාද කියලා. ඒවා හොයලා බලලා ඔබතුමන්ලා අපි ඒවාට හැප්පුනානේ. නමුත් වැඩක් තියෙන්නේ මේකෙදී පවා ප්‍රධාන ප්‍රශ්නයක් එනවා. අපි මේ මොන මේවා එක අරගෙන කිවුවත් මේ තුන්දෙනාම අප්ග්‍රාෆ්ට් ක්‍රමයට මේක කරන්න පුළුවන් අය. එයාලට ඒකට අවශ්‍ය පහසුකම් තියෙනවා කියලානේ ඒ අය ඉදිරිපත් වෙලා තියෙන්නේ. අපි මේ අර්ථකථනයන් දීගෙන යන්නේ මෙයාට අත්දැකීම් තියෙනවා, අරයට නැහැ කියලානේ. නමුත් අත්දැකීම් නැති කෙනාට කවදාවත් අත්දැකීම් ගන්න හම්බවෙන්නේ නැහැ එහෙම නම්. මට තියෙන ප්‍රධාන ප්‍රශ්නයක් ඇත්තටම ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අපි තීරණය කරේ ඇයි අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ මේක කරන්න. අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ මේක කරන්න තීරණය කරේ අපිට මේක අප්ග්‍රාෆ්ට් ක්‍රමයට කරන්න ඕන හින්දා. දැන් ඔබතුමා කියන්නේ මොළය සම්බන්ධව ඉන්න ශල්‍ය වෛද්‍යවරයෙකුට අක්මාව සම්බන්ධව පළපුරුද්ද නැතුව ඔබතුමාගේ අක්මාව දෙන්න කැමතිද පුරුදු වෙන්න පරීක්ෂණ කරන්න. ඒකට ඔබතුමා කැමතිද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පුරුදු වෙන්න කරනවා කියන එක අදාළ කර ගන්න ඕන වෙන්නේ නැහැ. මම නම් කියන්නේ නර්ඩ් ආයතනයේ ලියාපදිංචි මේ තුන් දෙනාටම ආදාහනාගාර හදන්න සුදුසුයි කියලා කියනවා නම්, ඒ තුන් දෙනාම අයදුම්කරලා තියෙනවා නම්, එතකොට තීන්දු කරලා තියෙන්නේ මෙහෙම නම් අපි හොයලා බලමු ඒ පැත්ත. තුන් දෙනාම සුදුසුයි කියලා කියනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් අපි මෙහෙම කරමු. එහෙම දෙමුකෝ. ඒකනේ කියන්නේ. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව අනුව ඒක ලබා දෙමු. එතකොට ඒක ඉවරයිනේ. එච්චරයිනේ ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒකට අපි විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ඕන ඒකනේ. ඒ මට්ටමට වැටෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. තවත් මන්ත්‍රීවරු මේ පැත්තේ ඉන්නවා. අපි ඔක්කොම මේ පැත්ත බලාගෙන හිටියේ මෙච්චර වෙලා. අතින් කියන ඒවා, කටින් කියන ඒවා සහ ඔබතුමා වචනයෙන් කියන ඒවා හොඳට ඇහුම්කන් දුන්නා. හොඳට බලන් හිටියා. කරුණාකරලා මේ ගරු සභාවෙන් ඉල්ලනවා. මුල ඉඳලම ඔබතුමා බොහොම හොඳට පැහැදිලි කරා. වුණ කාරණාව සහ වෙච්ච කාරණාව අතර සම්බන්ධතාවය කිවුවා. කරුණාකරලා මේ මන්ත්‍රීවරුන්ගේ අදහස් අරගෙන බෙදීමකට ගිහිල්ලා මේකට තීන්දුවක් ගන්න. ඒ වගේම ගරු චනක චමල් මන්ත්‍රීතුමාගේ යෝජනාව මම ස්ථිර කරනවා. මේක ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනයට දෙන්න. ඒ යෝජනාව මම ස්ථිර කරනවා. ඒකට විරුද්ධනම් ඔබතුමා බෙදීමකට ගිහිල්ලා ගන්න ඕන තීන්දුව ගන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිට නම් සභාපතිතුමා මේකට එක පාරටම තීන්දුවකට යන්න වෙන්නේ නැහැ. හේතුව දැන් බලන්න නර්ඩ් ආයතනයෙන් කියලා තියෙනවා "මෙම තිදෙනාම අපගේ බලපත්‍රලාභීන් බැවින් ඔවුන් විසින් ආදාහනාගාරය ඉදිකිරීමෙන් පසු කාර්යක්ෂමව හොඳ සේවාවක් ලබා දීමට කටයුතු කරනු ඇත " කියලා. ඒ වගේම "ඔවුන්ගේ මූල්‍යමය තත්ත්වය පිළිබඳව අපිට කිසිවක් ප්‍රකාශ කළ නොහැක. ඒ සම්බන්ධ විස්තර ඔවුන්ගෙන් ලබා ගැනීමට කටයුතු කරන්න." කියලා තියෙනවා. ඒ කියන්නේ මූල්‍ය තත්ත්වයන් වල ප්‍රශ්නයක් විතරයි තියෙන්නේ. ඒ කියන්නේ ඒ අය සුදුසුයි කියලා කියනවා. එහෙම සුදුසුයි කියලා කියද්දී අපිට බැහැ රුපියල් ලක්ෂ තිස් පහක් වැඩි එකට මේක දෙන්න. දැන් බලන්න සිරස වගේ මාධ්‍ය ආයතන එළව එළවා ගහනවා මේවාට. මාධ්‍ය මේවාට ගහනවානේ. එළව එළවා ගහන්නේ. ඒ නිසා මේක අපිට තීන්දු කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මන්ත්‍රීතුමා මෙහෙමනේ තියෙන්නේ. ඒ මොකද අපිට තීන්දු කරන්න බැරි. අපි සභා තීන්දුවක් ගන්නවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි ඒ සම්බන්ධව පළපුරුදු අය නෙමෙයිනේ. අපිට බැහැ ඒක කරන්න. ඉංජිනේරුවරයා එහෙම කියනවා නම් අපිට එහෙම කරන්න බැහැ. ඒක නිසා ඒ සම්බන්ධව ඊට වඩා පළපුරුදු කෙනෙක්ගේ අනුමැතිය ගන්න. ඒක අරගෙන තීන්දුවක් ගන්න. එහෙම කරන්න. එහෙම නැත්නම් අපි ඇත්තටම මේකට බෙදීමකට යමු. අපිට මේකට එකඟ වෙන්න බැහැ. එහෙම නැත්නම් අපි ඇත්තටම බෙදීමකට යමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කොහොමත් ඕක නොකර ඉන්න මට්ටමේ තමයි ඔය කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි උදවු කරන්නම්. අපිත් කොළඹ ගිහින් කරන්න පුළුවන් උදවුවක් කරන්නම්.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** කොළඹට දාලා ඕක මේවා කරන්නම්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ආදාහනාගාරය සම්බන්ධව තාක්ෂණ ඇගයීම් වාර්තාවක් අපිට මේ කමිටුවෙන් ලැබිලා නැත්නම් අපි මේ සෙල්ලම් කරන්නේ ලක්ෂ තුන්සිය තිහක වගේ වැඩකට. එතකොට මේකෙ වැදගත්කම තියෙන්නේ අපිට ගාල්ලෙන් මේකට හරි තාක්ෂණ ඇගයීම් වාර්තාවක් ලබා ගන්න බැරි නම් අපි එතනින් එහාට යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම ගන්න බැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඇයි ගන්න බැරි. මේක රුපියල් සියයක, දෙසීයක වැඩක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක ගැන ඉන්නකෝ මම කියන්න. මම දැන් කොමසාරිස්තුමාට දුරකථන ඇමතුමක් ගන්නම්. මම මේක ගැන කොමසාරිස්තුමාගෙන් විමසුවා. කොමසාරිස්තුමා බොහොම පැහැදිලිව දන්නවා මේකට වුණේ මොකක්ද කියන එක. එතුමා කිවුවේ ටෙන්ඩර් මණ්ඩලයෙන් තීන්දුවක් ගන්න අවසාන තීන්දුව ගැනීම ටෙන්ඩර් මණ්ඩලය සතුයි කියලා. ඒකට අභියෝග කරන්න කාටවත් බැහැ. ටෙන්ඩර් මණ්ඩලය තමයි අවසාන තීන්දුව ගන්නේ. අපි මේ වැඩි හොඳට තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ගන්න ගියා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එතකොට ඒ ගන්න තීන්දුවට තාක්ෂණ ඇගයීම් වාර්තාවක් ලබා දෙන්නේ කවුද, ටෙන්ඩර් මණ්ඩලයෙන් ගන්නේ තීන්දුවනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් අපි ඉල්ලපු එකට තාක්ෂණ ඇගයීම් වාර්තාවක් අපිට ලබා දීලා තියෙනවාද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තමයි අපි මේකට කොළඹින් වාර්තාවක් ඉල්ලන්න කියලා කියන්නේ. මේකට දකුණු පළාතෙන් වාර්තාවක් හම්බ වෙන්නේ නැත්නම් ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම ඉල්ලන්න බැහැ මන්ත්‍රීතුමා. දකුණු පළාතෙන් වාර්තාව හම්බවෙන්නේ නැත්නම් අපිට ඒක කොළඹින් ඉල්ලන්න පුළුවන්ද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේකට වගකියන කෙනෙක් නැහැනේ එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කෙළින්ම අමාත්‍යාංශයෙන් මේක ඉල්ලන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම ඉල්ලන්න බැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පුළුවන්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමා උත්සාහ කරලා බලන්න. මේක කොළඹින් ඉල්ලන්න. ටෙන්ඩර් කමිටුවට බලය තියෙන එක හරි. ඒකට ඔබතුමන්ලා කියන කතාවත් හරි. ඒ වුණාට මේකෙ රුපියල් ලක්ෂ තුන්සිය විස්සක්, තුන්සිය තිහක් එක්ක මේ සෙල්ලම් කරන්නේ. බලය තියෙන්න පුළුවන් ටෙන්ඩර් කමිටුවට. මේකෙ තාක්ෂණය පිළිබඳ වගකීම රජය ගන්න ඕන. මෙන්න මේ ආයතනයට දිගටම පළපුරුද්දක් තියෙනවා, ලංකාවේ මෙච්චර ප්‍රමාණයක් කරලා තියෙනවා කියලා. මේකට තීන්දු ටෙන්ඩර් මණ්ඩලයට ඕන විදියට ගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද බැරි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් මේක ගැන ඔබතුමන්ලා ඔය කියන ආයතනය ලංකාවේ ආදාහනාගාර තිස් තුනක් ඉදිකරලා තියෙනවා නම් ඒක රජය දන්නවානේ. එතකොට රජය තීන්දුවක් දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රජය තීන්දුවක් දෙනවා කියන්නේ මොකක්ද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේක ගැන තාක්ෂණ ඇගයීම් වාර්තාවක් දෙන්න එපැයි අපිට. ඒ තාක්ෂණ ඇගයීම් වාර්තාවේ දෙන්න ඕන මේ ආයතනය ලංකාවේ මෙච්චර ප්‍රමාණයක් ආදාහනාගාර ඉදිකරලා තියෙනවා ඒ නිසා මේ ආයතනය සුදුසුයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නර්ඩ් ආයතනය පිළිඅරගෙන තියෙනවානේ මෙච්චර කරලා තියෙනවා කියලා. නර්ඩ් ආයතනය පිළිඅරගෙන තියෙනවානේ අදාළ ආයතනය එකයි, අනිත් ආයතනය තිස් තුනයි කියලා. ඒක නර්ඩ් ආයතනය පිළිඅරගෙන තියෙනවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඇයි ඒක තාක්ෂණ ඇගයීම් කමිටුව දෙන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාක්ෂණ ඇගයීම් කමිටුව දෙන්නේ නැති හේතුව මොකක්ද කියලා මම දැන් කිවුවානේ. ඒක දෙන්නේ නැති හේතුව ගැන පටන් ගත්ත වෙලාවේ ඉඳන් කිවුවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් අපි කියන්නේ ඒක තමයි. මෙහෙන් දෙන්නේ නැත්නම් අපිට වැඩිය හොඳයිනේ මේක කොළඹට දාලා ගන්න එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එහෙම වෙන්න ඕන නැහැ. අපි ටෙන්ඩර් මණ්ඩලයෙන් තීන්දුවක් ගත්තානේ. ඇයි අපි එහෙම වෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ටෙන්ඩර් මණ්ඩලය තීන්දුවක් ගන්න කොට ඒකට වගකියන්නේ නර්ඩ් ආයතනයද, මේකෙ තාක්ෂණය පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනයෙන් අපි මේක ගැන ඉල්ලුවා. නර්ඩ් ආයතනයෙන් අපිට ඒක එවලා තියෙනවා. ඒ අය ඉල්ලීම් කරේ අදාළ ආයතන වලින් කියලා. අපි පත් කරපු තාක්ෂණ ඇගයීම් කමිටුව තියෙනවානේ. ඒකෙන් තෝරපු ආයතනය කරලා තියෙන්නේ අප්ග්‍රාෆ්ට් ක්‍රමයට එක ආදාහනාගාරයයි. ඒකත් එහෙම නෙමෙයි කරලා තියෙන්නේ. අපි හිතමු ඒකත් කරා කියලා. අනිත්

ආයතනය අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ ආදාහනාගාර තිස්ගාණක් ඉදිකරලා තියෙනවා. එතකොට ඒක බොහොම පැහැදිලියිනේ අත්දැකීම් කාටද තියෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කමිටුවෙන් දෙන්නේ නැහැනේ ඒක. නර්ඩ් ආයතනය දෙන එක හරියි කියලා කමිටුව දෙන්නේ නැහැනේ අපිට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනය දීපු එක හරි නොකියා කොහොමද, ඒ කරපු ඒවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තාක්ෂණ ඇගයීම් කමිටුව දෙන්නේ නැහැනේ. ඒකට තාක්ෂණ ඇගයීම් කමිටුව දීලා නැහැනේ මේ තාක්ෂණය හරියි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනයෙන් තමයි අපි ඇස්තමේන්තුව කැඳවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම අහන්නේ මේක. දැන් ඔබතුමන්ලා ඉල්ලලා තියෙනවානේ කමිටු වාර්තාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට මම කියන එක තේරෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ වාර්තාව අපිට පිළිගන්න බැරිනම් ඊට උඩින් මේක පරීක්ෂා කර ගන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඊට උඩට ගිහින් මේක පරීක්ෂා කර ගන්න. ඇයි ඒකට යන්න බැරි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේකෙ දෙපැත්තක් තියෙනවා. මම දකින ආකාරයට අත්දැකීම් බහුලයි ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනයට. දැනට එයාලා ඉදිකරලා තියෙනවා ආදාහනාගාර හතළිහක් විතර. ඒක ගැන මේකෙ සඳහන් වෙනවා. ඒ වගේම පියා සමඟ එකතු වෙලා කරලත් තියෙනවා. එයා තනියමත් කරලා තියෙනවා එකොළහක්. එතකොට ඒ ආයතනය පනහක් විතර කරලා තියෙනවා. ඉතිං අත්දැකීම් බහුල මේ වගේ ආයතනයකට මේක දෙන එක මේ අවස්ථාවේදී වඩා කාලෝචිතයි කියලා තමයි මම දකින්නේ. මෙතන පොඩි ගැටළුවක් තියෙන්නේ රුපියල් ලක්ෂ තිස් පහක වෙනසක් තියෙන එක. ඒ වුණාට රුපියල් ලක්ෂ තිස් පහක් අඩුවෙන් කරනවා කියලා බාගෙට කරලා ආපහු සල්ලි ඉල්ලුවොත් මොකද කරන්නේ. එතනත් ගැටළුවක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවානේ. දැන් අපි සභාවේ පාරවල් ඕන තරම් කොන්ත්‍රාත් කරනවානේ. අපි හැමදාම එකම කොන්ත්‍රාත්කරුවෙකුට දිගින් දිගටම දෙන්නේ නැහැනේ. අළුතෙන් කොන්ත්‍රාත්කරුවෙක් ආවොත් එයාටත් ඉඩ දෙනවා. දැන් ඒක දෙනකොට තාක්ෂණ නිලධාරීන් විසින් ක්‍රමවේදයක් දෙනවා මේ ක්‍රමයට හදන්න ඕන කියලා. තාක්ෂණ නිලධාරීන් විසින් ඒක අධීක්ෂණය කරනවා. එතකොට සුදුසුකම් බලලා අඩු එකටනේ දෙන්නේ. ඉතිං ඒ විදියට රුපියල් ලක්ෂ දහයක, පහක වෙනසක් නම් තියෙන්නේ අපිට කල්පනා කරලා බලන්න තිබුණා. එතකොට ප්‍රශ්නයක් නැහැ. දැන් රුපියල් ලක්ෂ තිස්පහක් කියලා කියන්නේ ලේසි පහසු මුදලක් නෙමෙයි. එච්චර වෙනසක් වෙන්න බැහැ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වෙන්න බැරි හේතුව මම කියන්නම්. හේතුව තමයි මේ අයට මේක ගැන අත්දැකීම් නැහැ. මේ අය ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට කරන ගමන් තමයි මේක දාලා තියෙන්නේ. අත්දැකීම් නැතිකම මේකෙ තියෙන්නේ. මම නම් දකින්නේ එච්චරයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක මුළු මුදලෙන් දහයෙන් එකක්. එතකොට ඒක ලේසි පහසු මුදලක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මොකක්ද මේකට කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා තීන්දුවක් ගන්න, ඒක අදාළ නැහැ. අපි නම් මේකට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් බෙදීමකට යන්න වෙනවා. බෙදීමක් යෝජනා කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඇත්තටම මේක මෙහෙම කරන්න එපා සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඔයගොල්ලොත් වගකියන්න ඕන. මම මේකට කීයටවත් එකඟ වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** යෝජනාව ස්ථිර කරලා තියෙනවා ගරු සභාපතිතුමා. ඒක එහෙම වෙන්න දෙන්න බැහැ. අකමැතිනම් බෙදීමකට ගිහිල්ලා තීන්දුවක් ගන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** චමින්ද මන්ත්‍රීතුමා මේක ලොකු ප්‍රශ්නයකට මැදි වෙනවා. ඒකයි මම මේ කියන්නේ.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ගැටළුව එන්නේ අපි රුපියල් ලක්ෂ තිස්පහක වෙනසක් ඇතුව තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් නිර්දේශ කරපු ආයතනය අතහැරලා දෙවෙනි එකට දුන්නොත්නේ. දෙවෙනි ආයතනයට දුන්නම අපිට මතු වෙන ගැටළුවනේ තියෙන්නේ. මම ඒකට හේතු ඉදිරිපත් කරන්නම්. පළවෙනි කාරණය අපි තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් නිර්දේශ විදියට විමසුවේ තාක්ෂණය සහ අප්ග්‍රාෆ්ට් ක්‍රමයේ පළපුරුද්ද පිළිබඳව. මොකද ඒක බොහොම පැහැදිලියිනේ. අපි සභා තීන්දුව අරගෙන තියෙනවා මේක අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට කරනවා කියලා. අපි බේරෙන්න ඕන. අපිට අධිහාරයක් ගෙවන්න ආවොත් බේරෙන්න එපැයි. ඒකනේ ඇත්ත කතාව. අපි විවෘතව කතා කරමු. අපි තීරණය කරලා තියෙන්නේ මේක අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට කරන්න. මොකද අපි දිගින් දිගටම මේවා ගැන කතා කරා. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයා ලබා දීලා තියෙනවා එතුමාට අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව දැනුමක් නැහැ කියලා. නිකං නෙමෙයි ඒක ලිඛිතව දීලා තියෙනවා. අපි පත් කරපු තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපතිවරයා විසින් ලබා දීලා තියෙනවා එතුමාට අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳ දැනුමක් නැහැ කියලා. නමුත් අපිට අවශ්‍ය වෙන්නේ නර්ඩ් ආයතනයේ අධීක්ෂණය සමඟ අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට මේක කරන්න. ඉතිං එතනදී අපි පුවත්පත් දැන්වීම් පවා දාලා තියෙනවා අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව කියලා. එතනදී බොහොම පැහැදිලිව අප්ග්‍රාෆ්ට් තාක්ෂණයේ අත්දැකීම් වෙනස්. ඒක කවුරුත් පිළිගන්න ඕන කාරණාවක්නේ. එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනය ඉදිකරලා තියෙන්නේ ආදාහනාගාර එකයි. ඊට පස්සේ ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනයෙන් ආදාහනාගාර තිස් ගාණක් ඉදිකරලා තියෙනවා. එතකොට අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව අත්දැකීම් ගැන ආයෙමත් තර්ක කරන්න දෙයක් නැහැ. ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනයට අත්දැකීම් බහුලයි අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව. අපිට අවශ්‍ය වෙන්නේ තාක්ෂණය පිළිබඳව.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක කරන්නේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා නෙමෙයිනේ. අධිකරණයෙන් නීතිය හමුවට ගියත් යන්නේ ටෙන්ඩර් එක නොලැබෙන කෙනා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ඒ වැරදි මතයක්. ඔබතුමා කතා කරන්නේ කාරණා දෙකක් පිළිබඳව.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එතුමා දැනුවත් නැහැ කියපු එක අපිට අදාළ නැහැ. ටෙන්ඩර් එක හම්බවුණේ නැති කෙනා අධිකරණයට යනවා. එතකොට කමිටුවේ සභාපති නෙමෙයිනේ යන්නේ. අඩු එක්කෙනාට ටෙන්ඩරය නොලැබී යන නිසා එයා අධිකරණයට යනවා. එහෙම නැතුව මේ කමිටුවේ සභාපතිවරයාට එරෙහිව යනවා නෙමෙයිනේ. ටෙන්ඩර් එක දාපු කෙනාට හම්බවුණේ නැති වුණොත් නීතිය ඉදිරිපිටට යනවා. එතකොට මොකද කරන්නේ. ඒකට උත්තරයක් දෙන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මටත් තේරෙනවා මේක දිගින් දිගට යන කොට මම එක ආයතනයකට දෙන්න ඕන කියන හැඟීමක් යනවා කියන එක. ඒක මට තේරෙනවා. නමුත් මට ඒක නෙමෙයි ඕන. මට ඕන අපි මේකෙ නැති වුණත්, මේක කරලා ප්‍රශ්නයක් ඇති නොවෙන්න මේ වැඩේ කර ගන්න. අනිත් එක ලේකම්තුමා කියනවා මේක අතහැරලා දාලා නැවත ටෙන්ඩර් කරන්න කියලා. මම දන්නේ නැහැ එතකොට අපේ කාලය තුළදී මේක කරන්න වෙන්නේ නැහැ. මම ඒක හොඳටම දන්නවා. මේක මේ වෙලාවේදී අතහැරියොත් ඒක තමයි වෙන්නේ. ඒ වගේම අපි නැවත මිල ගණන් කැඳවලා මේ ප්‍රශ්නයම නැවත මතු වුණොත් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙම ගියොත් ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය ඔය ගාණ අඩු කරලා දාවි. මම ඇත්තටම මුල ඉඳන්ම මේකට විරෝධතාවයක් යොමු කරා. අපි මාතලේ ගිහින් එන්න ඉස්සෙල්ලා මේ අය තොරතුරු දැන ගෙන ලියුම් සකස් කරලා තිබුණා. ඉතිං මම මුල ඉඳන්ම ඕකට විරෝධය පළ කරා. මම ඉන්නේ මේ මතයට. හැබැයි මම විරුද්ධව ඡන්දය ලබා දෙන්නේ ඔබතුමන්ලා ගන්න තීන්දුවට නෙමෙයි. ටෙන්ඩරය අවලංගු කරන්න ඕන. නැතුව මෙහෙම ගියොත් මේ ප්‍රශ්නය නැවත

මතු වෙනවා. ඔබතුමාට විරුද්ධව උසාවියේ නඩුවක් දැම්මොත් මොකද කරන්නේ ඒ ආයතනයට ආපු ටෙන්ඩරය නොදී හිටියා කියලා. ඒක තාක්ෂණ ඇගයීම් කමිටුවත් නිර්දේශ කරා. ඒක නිසා මේක වැඩි මිලට දෙන එක වැරැද්දක්. තාක්ෂණ ඇගයීම් කමිටුව නිර්දේශ කරලා තියෙන්නේ මේ ආයතනය. ඔබතුමන්ලාගේ කාලය ඇතුළත කරන්න ඕන කියන එකනේ ඔබතුමන්ලාගේ තර්කය තියෙන්නේ. හැබැයි මතක තියා ගන්න ඔබතුමන්ලාගේ කාලයේ මේක නොවුණත් කමක් නැහැ, ඒක නිවැරදිව කරන්න. දැන් ඔබතුමන්ලා මේකට නැවත මිල ගණන් කැඳවන්න යන්න බැහැ කියන්නේ ඔබතුමන්ලාගේ කාලයේදී මේක ඉවර කර ගන්න බැරි වේවි කියලා. මෙතන වැරැද්දක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ කාලයේදී නෙමෙයි, අපේ කාලයේදී.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ කාලයේදී මේක ඉවර කර ගන්න ඕන. හැබැයි ඔබතුමා කියපු කතන්දරය සීයට සීයක්ම ඇත්ත. සම්පූර්ණයෙන්ම වැරදි විදියට මේ ලිපිගොනු සකස් වෙලා තියෙනවා. අදහස් උදහස් සම්පූර්ණයෙන්ම වැරදියි. අපිට ඕන තරම් ලිපි යවන්න පුළුවන් ඒ ලිපි හයිලයිට් කරලා. ඒ ලිපි දෙකත් අමුණලා මෙන්න මේ හේතු නිසා ඔබතුමා නැවත කොහොමද කියලා අහන්න සුදුස්සෙක්ව තෝරන්නේ. ඒවා වැරදියි. නමුත් මේ ටෙන්ඩරය අවලංගු කරනවා නම් මම ඡන්දය ලබා දෙනවා. නැතුව මේක දෙපැත්තට අදින එකට මම නැහැ. මොකද ඒ ටෙන්ඩරය ලැබිය යුතු සුදුස්සෙක්ව නිර්දේශ කරලා තියෙනවා, ඒකෙ ප්‍රධානියා විසින්. එතකොට එයා උසාවි ගියොත් අනිවාර්යයෙන්ම එයාට නොලැබිච්ච එකේදී මෙතන වැඩියෙන් යන ගාණ එයාට ලැබෙන්න ඕන. එයා උසාවි යන්නේ මේකයි. එයා සුදුසුසෙක් නෙමෙයි කියලා කවුද කියන්නේ. අපි කියනවා. හැබැයි අදාළ ඉංජිනේරුවරයා කියනවා එයා සුදුසුයි කියලා. එයාගේ හේතුත් ඒකට කියනවා. එයාගේ ටෙන්ඩරය රුපියල් ලක්ෂ තිස් පහක් අඩුයි කියලා කියනවා. නමුත් එයාගේ සුදුසුකම් අපිට දැන් කතා කරන්න පුළුවන්. නඩුව ඇතුළත් කරන්නේ මෙහෙම. එයාට ටෙන්ඩරය දෙන්න කියලා තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් නිර්දේශ දුන්නා. නමුත් එයාට ඒක නොදී වැඩි මිල එකකට ඒක දීලා තියෙනවා. ඒ නිසා මේ වෙච්ච පාඩුව අයකරලා දෙන්න කියලා කියනවා සභාවෙන්. එතනදී ඔබතුමාට අභියෝගයකුත් තියෙනවා. වෙන අය වගේ නෙමෙයි, මම ඔබතුමාගේ පැත්තේ හිට ගන්න කෙනෙක් කියලා මුලින්ම කිවුවේ ඒකයි. මෙතන මේ ප්‍රශ්නය තියෙනවා. ලේසිම දේ මේක ටෙන්ඩර් කමිටුවේදීම තීරණය කරන්න තිබුණා. ඇත්ත කතාව ඒක. ඒක මම මුල ඉඳලම කිවුවා. අඩු මිලට දෙනවා නම් ඒ තීරණය අපිට ගන්න තිබුණා. අපි මේක තාක්ෂණය අතින් ඔස්තාර්ලාට යොමු කරලා තමයි අනාගත්තේ. ඒ අයගේ තාක්ෂණය පිළිබඳව මේකෙ කිසිම සඳහනක් නැහැ. හැබැයි මගේ මතය අනුව මම ඡන්දය ලබා දෙන්නේ නැවත ටෙන්ඩර් කැඳවීමකට යනවා නම් විතරයි. මම එතන ඉන්නවා. නැතුව මේකෙදී මේ කඹ ඇදිලි වලට මම අහුවෙන්නේ නැහැ. මමත් රජයේ නිලධාරියක් විදියට දන්න කියන නීති තියෙනවා. මේ වගේ ඔස්තාර්ලා නොවුණත් අබ ඇටයක තරම් හෝ දෙයක් දන්න කෙනෙක් හැටියට මම ඔබතුමන්වත්, අනෙකුත් මන්ත්‍රීවරුන්වත් බේර ගන්න පුළුවන් ක්‍රමය කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවසාන තීන්දුව ගන්න ඕන ටෙන්ඩර් මණ්ඩලය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකට ටෙන්ඩර් මණ්ඩලයෙන් තීන්දුව ගන්න සභාවෙන් අයින් කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය වටෙන් ගිහිල්ලා කරන දේ මට තේරෙනවා. එක්කෝ අපි තීන්දු කරලා දෙමු. නැත්නම් මේවා වටේ ගිහින් වෙන්නේ, මේක නැවත ටෙන්ඩර් වෙලා මේ කාලය තුළ අපේ කාලය අවසන් වෙන්න කලින් කරන්න වෙන්නේ නැහැ. ඒක තේරුම් ගන්න. මේක අපේ කාලය තුළ නොකෙරෙන මට්ටමට යන්නේ. ඒක තේරුම් ගන්න. මේක නැවත ටෙන්ඩර් කරලා කොරෝනා ප්‍රශ්නයත් එක්ක යන්න ගියොත් මේක යන්න හම්බවෙන්නේ නැහැ. ඒක තේරුම් ගන්න. සුගත් මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවා දැන් අපිට අවුරුද්දක් විතර ගිහිල්ලා තියෙනවා. ටෙන්ඩර් පටිපාටියට මේක කර ගන්න බැරුව දැන් අවුරුද්දක් විතර වෙනවා මේකට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ වැඩේ කෙරෙන්න ඕන නම් අඩුම එකට දුන්නම ඉවරයි. අඩුම එකට දෙන්න. අපි කැමතියි බෝපෙ පෝද්දල ආදාහනාගාරයක් හැදෙනවාට. මෙතන මන්ත්‍රීවරු විසි දෙකක් ඉන්නවා මේක අධීක්ෂණය කරන්න. තාක්ෂණ නිලධාරීතුමන්ලා ඉන්නවා. ඕක අපිට බලාගන්න බැරිකමක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අඩුම එකට දෙන්න ඕන කියලා එකක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙහෙමයි ලියනගේ මන්ත්‍රීතුමා. ටෙන්ඩර් පටිපාටියේ තියෙන්නේ මෙහෙම. ටෙන්ඩර් දහයක් දැම්මා නම් අඩුවෙන් ඉල්ලපු කෙනාට මේක දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මම කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක එපා කියලා නැහැනේ. මේ තුන් දෙනාම පැහැදිලිව දීලා තියෙනවා මේක කරන්න පුළුවන් කියලා. ඒක අපිට වැඩක් නැහැ. අපිට ඕන වැඩේ කෙරෙන්න. ඒක හින්දා රුපියල් ලක්ෂ තිස් පහකට අපිට වග කියන්න බැහැ. ඒක හින්දා මේක අඩුම එකට දෙන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි හිතමු මේක අඩුම එකට දුන්නා කියලා. නමුත් ඒකෙ කිසි ප්‍රමිතියක් නැත්නම් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කවුද, ප්‍රමිතියක් නැහැ කියලා කියන්නේ. මේ තුන් දෙනාම නම් කරලා තියෙනවා පුළුවන් කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** නමුත් පළපුරුද්ද අතින් ඉන්නේ ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය. ඒක මෙහෙමයි. වෛද්‍ය නාමල් ගමගේ මහතා බයිපාස් සැත්කමක් කරන එකයි, අළුතෙන් වෛද්‍ය විද්‍යාලයෙන් තේරිච්ච ගමන් ළමයෙක් කරන බයිපාස් සැත්කමක් කරන එකයි අතර වෙනසක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උදුල මන්ත්‍රීතුමා මෙහෙමයි. මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා බුද්ධිමත්ව මේක දැකීම සම්බන්ධව. මම ඇත්තටම කණගාටු වෙනවා සමහර මන්ත්‍රීවරු හිටපු ස්ථාවරයන් වෙනස් වීම පිළිබඳව. අපි මාතලේ ගිහින් බලලා එනකොට හිටපු ස්ථාවර වල නෙමෙයි සමහර මන්ත්‍රීවරු දැන් ඉන්නේ. විශේෂයෙන්ම අබේසේකර මන්ත්‍රීතුමා හිටපු ස්ථාවරයේ නෙමෙයි දැන් ඉන්නේ. ඒකට කමක් නැහැ. මේක වැරදි තැනකට යනවා. මම දිගින් දිගටම එක ආයතනයකට ලබා දෙන්න උත්සාහ කරනවා කියලා. ඒ නිසා අපි මේක නැවත ටෙන්ඩර් කරමු. හැබැයි එතකොට තේරේවි. එතකොට මට අන්තිමට කියන්න එපා අපේ කාලයේදී මේක කරගන්න බැරි වුණා කියලා. ඒ චෝදනාව අපේ මන්ත්‍රීවරු මට කරන්න එපා. ඒක මම මේ වෙලාවේදී ඉතාමත් වගකීමෙන් කියනවා. අපේ කණ්ඩායමේ මන්ත්‍රීවරු ඒ චෝදනාව මට කරන්න එපා මේක මම කරා කියලා. සුගත් මන්ත්‍රීතුමන්ලා වගේ අය ගැන මට හිතා ගන්න බැහැ. සුගත් මන්ත්‍රීතුමා මේක පටන් ගන්න කොට ඔබතුමා අප්ග්‍රාෆ්ට් ක්‍රමය ගැන දන්නේ නැතුව කතා කරේ. ඔබතුමා මේකෙ වෙනස දැක්කෙත් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ ආයතන තුනටම අප්ග්‍රාෆ්ට් ක්‍රමයට කරන්න පුළුවන් කියලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක තමයි මම කිවුවේ. එක ආයතනයක් අප්ග්‍රාෆ්ට් ක්‍රමයට එකක්වත් කරලා නැහැ. තව ආයතනයක් එකයි කරලා තියෙන්නේ. අනිත් ආයතනය තිස් ගාණක් කරලා තියෙනවා. අන්න ඒකයි මේ කියන්නේ. හරි අපි මෙහෙම කරමු. මම යෝජනා කරනවා මේක නැවත ටෙන්ඩර් කරන්න. එතකොට හරිනේ. මට ඕන නැහැ එක ආයතනයක්වත්. නමුත් මම කැමති නැහැ නිලධාරීන්ට මුකුත් කියන්න. මේක ගිය විදිය ඒ ටු ඉසෙඩ් මම දන්නවා. ඇයි අපි මේක වෙනස් කරේ. ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට යන්න ගිහිල්ලා ඇයි අපි අප්ග්‍රාෆ්ට් ක්‍රමයට මේක කරන්න වෙනස් කරේ. මේකෙදී නිලධාරීන්ට යටවෙලා මේක අඩු එකට දෙන්න බැහැ. ඒකට මම එකඟ නැහැ. ඒකයි මම මෙච්චර වෙලා තර්ක කරේ. නැතුව වෙන ආයතනයකට මේක දෙන්න ඕන හින්දා නෙමෙයි. අනිත් එක මම කියනවා, මම ඒක වගකීමෙන් කියනවා. මගේ දුරකථන පරීක්ෂා කරන්න. ඒක පරීක්ෂණයකට දාන්න. අදාළ තෝරලා දීපු ආයතනය, එම්.එන්.ජී. කුන්ස්ට්‍රක්ෂන් ආයතනයේ හිමිකරු මට කතා කරපු වොයිස් රෙකෝඩින් ගන්න. ඒකට මම සභා තීන්දුවක් ගන්නවා. එතකොට මම මෙච්චර වෙලා කතා කරපු එක මේ මන්ත්‍රීවරුන්ට තේරේවි කවදා හරි. ඒක මම ගන්නවා. සුගත් මන්ත්‍රීතුමා කියන්නේ මේකට දෙන්න ඕන කියලා. මේකට දෙන්න වුවමනාව තියෙනවා නම් මෙච්චර දඟලන්න ඕන නැහැනේ. මට මේකට සුගත් මන්ත්‍රීතුමා ලේසිම මේ තේරිච්ච ආයතනයට දෙන එක. මට ඕන ඒක නෙමෙයි. මට ඕන මේ වැඩේ කරන්න. එහෙමනම් අපිට ඕන නැහැ මේ ජේ.සී.බී. එක කැඩුණ වෙලාවේදී, කුලියට ජේ.සී.බී. වලින් එහේ කපන්න. එහෙම ඕන නැහැ මේක හදිසි නැත්නම්. මෙතනින් මේක කරන්න ඕන හින්දා තමයි මේක කරන්න හැදුවේ. ඒකටත් මේ ඇත්ත කතාව තේරුම් නොගෙන තමන්ගේ වගකීම හරියට ඉෂ්ඨ කරන්න බැරිනම් මටත් කරන්න දෙයක් නැහැ. අරකට බයේ, මේකට බයේ එහෙම කරමින් මේක කරන්න බැහැ. සභා තීන්දුව අරගෙන මේක කරගෙන යන්න බැරිනම් ඇත්තටම තේරුමක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා මේක පොඩ්ඩක් අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන් කිවුවානේ අඩුම ලංසුවට මේක දෙමු කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම මේ සභාවේ අධිහාර ගෙවපු කෙනෙක්. අපි අමාරුවේ වැටුණ වෙලාවේදී බේර ගන්න කෙනෙක් හිටියේ නැහැ. ඒක වෙලාම බලන්න ඕන. ඒක වුණාට පස්සේ මම රුපියල් පනස් පන්දාහක් ගෙව්වා. අන්තිමට උසාවි යන්නත් වුණා. මට විතරක් නෙමෙයි අනිත් මන්ත්‍රීවරුන්ටත් උසාවි යන්න වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මම මේකත් දැන් කියනවා. මේකත් ඉතාම වගකීමෙන් කියනවා. ලියලා තියා ගන්න. ටෙන්ඩර් එක නැවත කැඳෙව්වත් යන්නේ ඔය ආයතනයට. ඒක ලියලා තියා ගන්න අද දිනයත් එක්ක. මේක නොවුණොත් වැඩක් නැහැ. අනිවාර්යයෙන්ම මේක නැවත ටෙන්ඩර් කරමු. මම මේ ටික කියලා තියන්න ඕන. එතකොට කවදා හරි දවසක තේරුම් ගනීවි මේකෙන් මොකක්ද වුණේ කියන එක. සමහරු ඒක තේරුම් නොගෙන ඉන්නවා. තවත් සමහරු ඒක තේරුම් අරගෙන හැසිරෙන විදිය ගැන මට හිතා ගන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඔබතුමා මොන ප්‍රශ්නය තිබුණා වුණත් ඔය ගනිපු තීන්දුව තමයි ගන්න තියෙන යථාර්ථය. නැත්නම් මේක දෙපැත්තට ඇදිලා ගියා නම් මොනවා හරි නීතිමය ප්‍රශ්නයකට ගියත් මම කැමති නැහැ මේ එක මන්ත්‍රීවරයෙකුටවත් හානියක් වෙනවට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ප්‍රියන්ත මන්ත්‍රීතුමා අපි මේක කරන්න එපා කියලා නෙමෙයි කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එපා කියන එක නෙමෙයි මේ කියන්නේ. දෙපැත්තෙන්ම තේරුම් අරගෙන එක පැත්තකට හරි යන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක තැනකවත් සඳහන් කරලා තියෙනවාද තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් මෙන්න මේ තාක්ෂණය පිළිබඳව පදනම් කර ගෙන මේක දුන්නා කියලා. ඒක මට පෙන්වන්නකෝ. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ප්‍රතික්ෂේප කරන්න පුළුවන් පළවෙනි කාරණය ඒක. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවේ මට පෙන්වන්නකෝ ඒක ගැන. ඒ තීන්දුව ගත්තේ තාක්ෂණය පදනම් කර ගෙන කියලා මට පෙන්වන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මුදල සම්බන්ධව විතරයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුදල මත පදනම්ව විතරයි මේක තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම කැමති නැහැ මේ එක මන්ත්‍රීවරයෙක්වත් මේ වගේ පොදු කටයුත්තකදී උසාවි ගානේ යනවාට. ඒකට අකමැති නිසා තමයි මම මුල ඉඳන්ම මේක කිවුවේ. මේක වෙනස් කරන්න බැහැ. මොකද ඉංජිනේරුවරයා දීලා තියෙනවා නම් මේ ආයතනය නිර්දේශ කරලා නැවත වෙන කෙනෙකුට ඒක අපිට දෙන්න බැහැ. එහෙම දුන්නොත් ගැටළුවක් වෙනවා. නැවත යැව්වත් මේකම නිර්දේශ කරාවි. නැවත ටෙන්ඩර් කරොත් හැබැයි මීට වඩා ගණන් මිම් වල වෙනසක් වේවි. සමහර විට ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනයටත් මීට වඩා අඩුවෙන් දෙන්න වෙනවා මේක. ඒ නිසා හොඳ තීන්දුවක් ගන්න පුළුවන්. මම මුදල් කමිටුවේ, ටෙන්ඩර් කමිටුවේ ඉන්න නිසා සභාව ගේන තීන්දුවට මට එකඟ වෙන්න බැහැ කියලා මම මුල ඉඳලම කිවුවා. මම මේක දැක්කා මුල ඉඳන්ම. ඒක නිසා මම මේකෙ වැරැද්ද දුර ඉඳලම දැක්කා. මම එදා ඉඳන් කිවුවා මේකට නැවත ටෙන්ඩර් කිරීමකට යන්න ඕන කියලා. අපිට මෙහෙම වෙන ආයතනයක් යෝජනා කරලා මේක දෙන්න බැහැ. ඒක ගැටළු සහගත තත්ත්වයකට පත් වෙනවා. ඉතිං කොහොම වෙතත් අවසානයේදී මේ එක මන්ත්‍රීවරයෙකුටවත් උසාවි ගාණේ යන්න ඕන නැහැ පොදු දේකට. මේ ගනිපු තීන්දුව හොඳයි කියන එක තමයි මම නැවත කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. මම අහන්නේ මේ තාක්ෂණ ඇගයීම් කමිටුව තනිකරම ටෙන්ඩර් කමිටුවේ තීන්දුවනේ අර ගත්තේ. මම කියන්නේ තාක්ෂණ ඇගයීම් කමිටුව බැලුවද මේ කරපු එකක්වත්. අපි හිතමු මාතලේ ආදාහනාගාරය වැඩ කරනවාද, සර්විස් පිළිබඳ වාර්තා තිබෙනවාද, මේවා කොච්චර කාලයකින් කරලා තියෙනවාද, ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය කරපුවා මොනවාද, ඒ අය කරපු ඒවායේ හොඳ මොනවාද, නරක මොනවාද, කියලා බලන්න ඕන. අපි තාක්ෂණ ඇගයීම් කමිටුවට කාලයක් දුන්නේ ඕවා බලන්නනේ. මම කියන්නේ ඒවා බැලුවාද, ඒවා බලලාද මේක හැදුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම කියන්නේ සභාපතිතුමා මේකට හොඳම දේ තමයි මේ. ඔබතුමා සභාවෙන් ලියුමක් යවන්න මේකට. මෙන්න මෙහෙම ගාල්ලේ කමිටුවෙන් තීන්දුවක් අරගෙන තියෙනවා නමුත් මේ කමිටුව මෙහෙම දෙයක් කරේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා අපිට තීන්දුවක් දෙන්න කියලා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කරන්න. එතකොට පළාත් පාලන අමාත්‍යාංශයෙන් අපිට නිර්දේශ එවාවි මොකක්ද කරන්න ඕන කියලා අපේ සභාවෙන්. ඔබතුමා මේකෙ දකින අඩුපාඩු තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. මේකට නැවත ටෙන්ඩර් කැඳවමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම යවන්න. එතකොට ඒ අය කියනවා මොකක්ද කරන්න ඕන කියලා. එතකොට ඒ අය වගකීම ගන්නවා. එතකොට අපිට වගකීමක් එන්නෙ නැහැනේ. එතකොට අපිට වගකීමක් නැහැ. වගකීම ඒ අයට යන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගණන් අඩු කරලා තියෙන්නේ ඒ අයට දෙන්න ඕන නිසා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය සුදුසුයි කියලා ඕන කෙනෙක් දන්නවා. ඒක නිසා කොහොමත් අරකට දෙන්න ඕනකමට ගාණ අඩු කරලා. ගාණ අඩු කරාට පස්සේ තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් ඒකට නිර්දේශය වුණේ මේක. ඒ අය කමිටුව විදියට බලලා තියෙන්නේ ගාණ අඩු එක විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි ඔකෙදී කිය කිය හිටියේ නම් ඔහොම නෙමෙයි. ඔකෙ තියෙන කාරණා මෙහෙමනේ. ඔකෙ ගල් තියෙනවා. ඒ ගල් පුපුරනවා. ඔකට තාක්ෂණ කටයුතු ගණනාවක් තියෙනවා පළපුරුද්දත් එක්ක. ඉතිං මම දන්නේ නැහැ ඕවා ගැන නොසලකා ඔහොම දීලා වැඩේ කරන්න බැහැ අනනවා. ඒ නිසා ඊට වැඩිය හොඳයි නැවත මිල ගණන් කැඳවන එක. මේ කියන එක තේරුම් ගන්නත් බැහැනේ. පුන පුනා කියනකොට තේරෙන්නේ මට අවශ්‍ය ආයතනයට දෙන්න ඕන හින්දා මේක කරනවා කියන එක. මටත් ඒක දැන් තේරෙනවා. ඒක හින්දා මම මේ කාරණා දෙකත් කියලා තමයි යන්නේ. මට විශ්වාස කරන්න බැහැ අපේ කාලය තුළදී මේක කෙරේවි කියලා. ඒක එකක්. අනිත් එක ලියලා තියා ගන්න. ඔය ආයතනයටම තමයි ඔය ටෙන්ඩර් එකත් යන්නේ. මේකෙ මොන කෙනා තාක්ෂණ ඇගයීම් කමිටුවට පත් කරත්, ඒ බලපෑම නිලධාරීන් හරහා වෙනවාම තමයි. ඒක මම අද කියලා ඉන්නම්. මම අභියෝග කරනවා. දකුණු පළාතේ එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය විතරයි වැඩ කරන්නේ. මම අභියෝග කරනවා. ඕන මන්ත්‍රීවරයෙක් පුළුවන්නම් ගිහිල්ලා හොයලා කියන්න එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය හැරෙන්න වෙන ඒවා කරලා තියෙනවද කියලා. මම නිශ්ශබ්ද වෙලා හිටියා නම් නැවත මේ යටත්වීමක්. අපිවත් යට කිරීමක් කරමින් යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ කමිටුව වෙනස් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපිට තාක්ෂණ ඇගයීම් වාර්තාවක් ගන්න බැරිද, මේ ආයතන තුනෙන්. තාක්ෂණය පිළිබඳව ඇගයීම් වාර්තාවක් ගන්න බැරිද ආපහු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණය පිළිබඳ ඇගයීම් වාර්තාවක් ඉල්ලලා තමයි ඔක දුන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒකෙ තාක්ෂණය ගැන නෙමෙයිනේ සඳහන් වෙන්නේ. මේ තුන් දෙනා ගැන කරුණු දක්වලා නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තේරුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** තාක්ෂණය පිළිබඳව වාර්තාවක් අවශ්‍ය වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ටෙන්ඩරය දැන් අවලංගු කරානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනය දෙනවානේ සහතිකය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අඩුවට හැදුවට වැඩක් නැහැ නියම තාක්ෂණයට හදන්නේ නැත්නම්. ආදාහනාගාරයේ නියමිත ප්‍රමිතිය නැත්නම් වැඩක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනය සහතිකයක් දෙනවා නම් තව මොකටද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකෙදී සභාපතිතුමා ගෙවන්න ඕන ක්‍රමය පවා කතා කරා. එතකොට මෙතන ප්‍රශ්නයක් තියෙනවා. නැත්නම් අපිට කමක් නැහැ මොකක් වුණත්. දැන් මේකෙ තියෙනවා මුදල පිළිබඳව ප්‍රශ්නයක්. මේකෙන් අපි බේරෙන්න ඕනනේ. එතකොට මෙතන පැහැදිලිව මෙහෙම තියෙනවා. "මෙම තිදෙනාම අපගේ බලපත්‍රලාභීන් බැවින් ඔවුන් විසින් ආදාහනාගාරය ඉදිකිරීමෙන් පසු කාර්යක්ෂම හා හොඳ සේවාවක් ලබා දීමට කටයුතු කරනු ඇත." ඒ කියන්නේ මේ අවධානම ගන්නවා නර්ඩ් ආයතනය. නර්ඩ් ආයතනය මෙතනදී අධීක්ෂණය කරනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා අබේසේකර මන්ත්‍රීතුමා. නර්ඩ් ආයතනය එන වාර ප්‍රමාණය මේකත් එක්ක වෙනස් වෙනවා. තියෙන අත්දැකීම් එක්ක ඒක වෙනස් වෙනවා. නර්ඩ් ආයතනයෙන් එන වාරයකට අපි රුපියල් විසි හත් දහස් ගාණක් ඒ අයට ගෙවන්නත් ඕන. එතකොට ඔය ගාණ ඇවිල්ලා. එතකොට අන්තිම ප්‍රතිඵලය ගත්තම අපිට වෙන පාඩුවක් තියෙනවා. නර්ඩ් ආයතනයට අධීක්ෂණයට රුපියල් විසි හත් දහස් ගාණක් ගෙවන්න ඕන එක වාරයකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සභාපතිතුමා කතා කරලා බලන්න. ඒක මම දන්නේ නැහැ. ඒක ගැන කියන්න මම දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මේකට නැවත ටෙන්ඩර් කැඳවමු. ඒක වඩාත් හොඳයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙ ප්‍රශ්නයක් තියෙනවා. ඒක ආවොත් මේක නවත්වන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද කරන්නේ. නැවත ටෙන්ඩර් කරනවාද, මම ඒ යෝජනාව වෙනස් කරනවා. අපි කොහොමත් ඒ යෝජනාව තීන්දුවක් ගන්න දාලා තියෙන්නේ. නැවත මේක ටෙන්ඩර් කරන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පුළුවන් තරම් ඉක්මනට නැවත ටෙන්ඩර් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම ඉල්ලීමක් කරනවා. ඒ ටෙන්ඩර් එකේ තියෙන අඩුපාඩු හදා ගන්න. C5 කියලා කතාවක් තියෙනවා. ඒක අඩු කරොත් තව කීප දෙනෙක්ට මේකට ඉල්ලුම් කරන්න පුළුවන්කම තියෙනවා. ඒවගේම තමයි පළපුරුද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව ඉතිං අපිට අදාළ නැති කාරණා තියෙනවා. දැන් කොහොමත් වෙච්ච දේ වැඩක් නැහැ. මම කිසි දේකට ඇඟිලි ගැහුවේ නැහැ. ටෙන්ඩර් පත්‍රිකාව හදන්න පවා මම ඇඟිලි ගැහුවේ නැහැ. නමුත් එතනදී අපිට වැරදිච්ච කාරණා කිහිපයක් තියෙනවා. ටෙන්ඩර් පත්‍රිකාව හැදිමේදී වැරදුණා. අප්ග්‍රාෆ්ට් තාක්ෂණය කියන එක හයිලයිට් වුණේ නැහැ. අනිත් එක මේකෙ තව එකක් තියෙනවා. මට ඒක කිවුවේ නර්ඩ් ආයතනයෙන්. මේකෙ ආදාහනාගාරය ගැන වෙනම සහතිකයක් යනවා. ඉදිකිරීම ගැන වෙනම සහතිකයක් යනවා. නර්ඩ් ආයතනය සහතික දෙකක් දෙනවා. ඔය පිළිබඳව මුකුත් සඳහන් කරලා නැහැ ටෙන්ඩර් පත්‍රිකාවේ. ඔය සියළු දේවල් අපි හරියට කරමු මේ සැරේදී.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම ඒ පිළිබඳව තමයි මේ කතා කරේ. අපි අප්ග්‍රාෆ්ට් ක්‍රමයට ආදාහනාගාරය හදන්නනේ දැන් තීරණය කරලා තියෙන්නේ. අප්ග්‍රාෆ්ට් ක්‍රමයට හදපු ඒවා තුන හතරක්වත් පළපුරුද්ද තියෙන්න ඕන කියලා ටෙන්ඩරයට දාන්න. අඩුම තරමේ තුන හතරක්වත් හදපු තැනකට දෙන්න කියලා ටෙන්ඩරයට ඇතුළත් කරන්න. ඒකෙ පළපුරුද්ද බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම දාන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා මම හැම සභාවකදීම කිවුවා මේ C5 කතාව අඩු කරන්න කියලා. මොකද බිල්ඩින් එක සහ ආදාහනාගාරය කොටස් දෙකකට ගන්න ඕන කිවුවා. හැබැයි ලේකම්තුමා කිවුවා එහෙම කරන්න බැහැ මේක තනි එකක් කියලා. කුටීරයයි, ගොඩනැගිල්ලයි තනි එකක් කිවුවා. හැබැයි අද පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් දීපු වාර්තාවේ තියෙන්නේ බිල්ඩින් එකට තමයි C5 ඕන කියලා. හැබැයි සභාවේ කතා කරන කොට කිවුවේ මේක දෙකක් විදියට කරන්න බැහැ, එකක් විදියට ගන්න ඕන කියලා. C5 අනිවාර්යයෙන්ම මේ දෙකටම ඕන කිවුවා. හැබැයි වාර්තාවේ දීලා තියෙනවා බිල්ඩින් එකට විතරයි C5 ඕන කියලා. මම කලින් සභා වලත් මේක ගැන කිවුවා. එතකොට මේ සභාවේදීම කිවුවා ඒක ඕන නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අරහෙන් වර්ග කරලා එවලා තියෙනවා. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවපු එකේ දෙකකට වර්ග කරලා තියෙනවා. ආදාහනාගාරයේ බිල්ඩින් එකට ඒක ඕන. නමුත් කුටීරයට ඒක ඕන නැහැ කියලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා ටෙන්ඩරයට පළපුරුද්දයි, අත්දැකීමුයි ගන්න බැරි කමක් නැහැනේ. ඒක ගන්න පුළුවන්නේ. පළපුරුද්ද නැතුව කොහොමද ටෙන්ඩරයක් දෙන්නේ. සභාපතිතුමා විශේෂ සභාවක් අරගෙන පත්තරේට දාන්න කලින් ඕක සභාවට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි නැවත පුවත්පත් දැන්වීමට වියදම් කරන්න වෙනවා රුපියල් අසූපන්දාහක් විතර. කාලය යනවා. කමක් නැහැ. ඔය විදියට කරමු. නැවත ටෙන්ඩර් කැඳවීමට හේතුව වෙන්නේ තාක්ෂණ ඇගයීම් කමිටුව ලබා දීපු වාර්තාව පිළිගන්න බැරි එක. ඒක පිළිගන්න බැරි කාරණය තමයි පක්ෂග්‍රාහී වීම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඕවා පටලවන්න එපා. අපිට රුපියල් ලක්ෂ තිස් පහකට වගකියන්න බැහැ. ඇයි මන්ත්‍රීවරු මේකට කතා කරන්නේ නැත්තේ. මම විතරයිනේ මේකට කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක තමයි කතාව. බොහොම පැහැදිලිව ගාණ වැඩියි. අපිට ඒකට වගකියන්න බැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවේ දන් තීන්දුව විදියට ඕන නම් දනට අඩු මිල ගණන විදියට තියෙන එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනයට දෙන්න අපි කැමතියි. ඒකෙ ගැටළුවක් නැහැ. ඔබතුමා කියනවා නම් මේක නැවත දම්මමත් මේ තීන්දුව එනවා නම් ඒකට වැඩිය හොඳයි දැන්ම අපි දෙන එක. එතකොට ආපහු ටෙන්ඩර් ගාස්තු ගෙවන්න ඕනත් නැහැ. මුකුත් නැහැ. එහෙමනම් අපි කියන්නේ ඔබතුමාට නැවත මේ ගැන අවිශ්වාසයක් තියෙනවා නම් අපේ සභාවේ තීන්දුව තමයි මේ. අපි දැන් වුණත් කැමතියි එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනයට මේක දෙන්න. ඒකට වෙන හේතුවක් පෙන්වා ගන්න අවශ්‍ය වෙලා තියෙනවා. අපි දන්නේ නැහැ ඒකට හේතුවක්. අපි කියන්නේ එම්.එන්.ජී. කන්ස්ට්‍රක්ෂන් ආයතනයට මේක දෙන්න. ඒ අය වැඩේ කරගෙන යාවි. එතකොට වැඩේ ඉවරයි. ඔබතුමන්ලාගේ කාලය ඇතුළත මේක ඉවර කරගන්න පුළුවන්. ඔබතුමාට අවිශ්වාසයක් තියෙනවා නම් නැවත මේකම එනවා කියලා, ඒ නිසා නැවත ටෙන්ඩර් කරන එක වැඩකුත් නැහැ. ඒ නිසා ඔබතුමා කැමති නම් ටෙන්ඩර් කරන්න. එහෙම නැත්නම් ඔබතුමාට පුළුවන් මේක සභාවේ සාකච්ඡා කරන කොට මෙහෙම මෙහෙම වුණා කියලා අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරලා තීන්දුවක් දෙන්න. එතකොට අමාත්‍යාංශයෙන් කියාවි මේකට මොකද කරන්න ඕන කියලා. එතකොට වැඩි කාලයක් යන්නේ නැතුව, ආයෙමත් ටෙන්ඩර් කරන්නේ නැතුව මේ වැඩේ කරගෙන යන්න පුළුවන්. අපි දැන් පහළ අධිකරණයට ගිහින් ඉහළ අධිකරණයට යනවා වගේ මේක අමාත්‍යාංශයට යවන්න පුළුවන්. එතකොට අමාත්‍යාංශයෙන් තීන්දුවක් දේවි, ඒක ගන්න තියෙන්නේ එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අමාත්‍යාංශයෙන් නම් තීන්දු එන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, තව කාරණයක් කියන්න ඕන. දැන් ගිය සභාව තිබුණේ අප්‍රේල් මාසයේ 09 වෙනිදා. හැබැයි ඊට කලින් ටෙන්ඩර් මණ්ඩලය රැස්වුණා. ටෙන්ඩර් මණ්ඩලය මිල ගණන් ටික දන්නවා. ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකයෝ ටික මේක අධ්‍යයනය කරානේ. එතකොට මේ මිල ගණන් තුන ගැන දන්නවා. එතකොට මේ රුපියල් ලක්ෂ තිස් පහේ පරතරය ගැනත් දන්නවා. ඊට පස්සේ අප්‍රේල් මාසයේ සභාව තියන කොට ඔබතුමන්ලා මේක ගැන දැනුවත්ව තමයි මෙතනට එන්නේ. හැබැයි එතකොට කියන්නේ මොකක්ද, පළපුරුද්ද ඕන, මේක බලන්න යන්න ඕන. සභාවේ මුදල් වියදම් කරලා අපි ගිහින් මේක බලමු. අන්න ඒ යෝජනාව තමයි එදා කරන්නේ. එතකොට කියන්නේ නැහැ මේක අඩුම එකට දෙන්න ඕන කියලා. වැඩිම එකේ කතන්දර එදා තිබුණේ නැහැ. එදා කිවුවේ සභාවේ තියෙන සල්ලි ටිකත් අරගෙන ගිහිල්ලා මේක බලලා එමු කියලා. දැන් අද කියනවා අඩුම එකට දෙන්න ඕන කියලා. මොකද මේක සභාවට තල්ලු කරා කියන එකනේ කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක නොකරම ඉන්න පුළුවන්නම් හොඳයි මට හිතෙන විදියට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඕක අපිට ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔය යෝජනාව බොහොම ඈත ඉඳලා ගෙනාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට දැන් ඒක මතක් වුණේ. අපි ඇයි ගියේ මේවා බලන්න සභාවේ මුදල් වියදම් කරලා. ඒ ප්‍රශ්නය මට දැන් ආවේ. අපි ගියානේ මේවා බලන්න. අපි හැමෝටම එන්න කිවුවා. ටෙන්ඩර් කමිටුවේ අයට එන්න කියලා අපි ගියානේ ඒක බලන්න. එවෙලේ අපි බලලා එනකොටත් යම් යම් තීන්දු තීරණ ගත්තානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ගියේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ටෙන්ඩර් කමිටුවේ අය ගියානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ටෙන්ඩර් කමිටුව ඕකේ අන්තිම තීන්දුව ගන්නවා නම් අපි මෙහෙම කතා කරන්නේ නැහැනේ. සභාවකට මේක දාන්න අවශ්‍යතාවයකුත් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ නිර්දේශ දීලා තියෙන කොට තමයි අපි ගියේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මමත් ටෙන්ඩර් කමිටුවේ ඉන්නවා. ඒ වුණාට ගරු සභාපතිතුමනි, මේ මුදල් ගැටළුව තමයි අපිට තියෙන්නේ. ඊළඟට ගරු සභාපතිතුමාට ඇවිත් තියෙන ලිපි බැලුවම අපිට සැකයක් මතු වෙනවා. ඒ නිසා සභාපතිතුමනි, මුදලේ ගැටළුව තියෙන්නේ. රුපියල් ලක්ෂ තිස්පහක් කියන්නේ ලොකු මුදලක්. ඒ මුදලට අපිට වගකීමක් ගන්න

වෙනවා කවදා හරි. ඒ ගැටළුව නැත්නම් හෙට වැඩ පටන් ගත්තත් ආදාහනාගාරයේ අවශ්‍යතාවය තියෙනවා. අපි මේ ගැන කතා කරලා තියෙනවා. ඒ නිසා මේ මුදලට වගකීම දරන්නේ කවුද කියන එක තමයි ගැටළුව තියෙන්නේ. ටෙන්ඩර් කමිටුවේ අපිට සභාව ඉදිරියේදී ඕකට වගකීමක් ගන්න වෙනවා. මොකද මීට පෙර සිදුවීමක් අපිට සුගත් මන්ත්‍රීතුමා කියනවා. ඒ යම් යම් තීන්දු තීරණවල වැරදි නිසා තමයි ඒක වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා. මම නැවත මේක ගැන කතා කරත් ඔච්චරම තමයි. මේකට අපිට තීන්දුවක් ගන්න පුළුවන්. දැන් මෙහෙමනේ. සියළුදෙනාම කියන්නේ මේ රුපියල් ලක්ෂ තිස් පහේ ප්‍රශ්නය හින්දා තමයි මේක වෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක විතරක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියළුදෙනාම කියන්නේ ඒක. ලියනගේ මන්ත්‍රීතුමා පවා කියනවානේ මෙතනදී නිලධාරීන්ගේ බලපෑමක්, මැදිහත්වීමක් වෙච්ච ඒවා. ඒක බොහොම පැහැදිලියිනේ. ඒ නිසා මම අහන්නේ අපි රුපියල් ලක්ෂ තිස්පහ ගැන හිතලා ටෙන්ඩර් මණ්ඩලයේදී ඔය තීන්දුව ගන්න තිබුණානේ. තාක්ෂණ ඇගයීම් කමිටුවයි, ටෙන්ඩර් කමිටුවයි එකට අරගෙන ඔය තීන්දුව ගන්න තිබුණානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙ තියෙන එකම ප්‍රශ්නය මේකයි. සභාපතිතුමා බොහොම පැහැදිලිව මුලින්ම මේක නර්ඩ් ආයතනයට දෙන්න තීන්දු කරා. නර්ඩ් ආයතනය සහතිකය දෙන්නේ එයාලා යටතේ ඉන්න ආයතන වලට විතරයි කියලා කිවුවා බොහොම පැහැදිලිවම. ඉතිං අද මේකෙදී බොහොම පැහැදිලිවම කියනවා මේ ආයතන තුන ගත්තම එයාලා ගැන නර්ඩ් ආයතනය වගකියනවා කියලා. එයාලා යටතේ තියෙන්නේ, ඒ නිසා වගකියනවා කියලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ඇයි තාක්ෂණ ඇගයීම් කමිටුව එකක් අයින් කරේ. තාක්ෂණ ඇගයීම් කමිටුව ඔය ආයතන තුනෙන් එකක් අයින් කරනවානේ. මම අහන්නේ එහෙමනම් ඇයි එකක් අයින් කරේ. දැන් ඔය තර්කය ගෙනාවොත් ඒකනේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රත්නතුංග කන්ස්ට්‍රක්ෂන් ආයතනයද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ඒක අයින් කරේ ඒ අය අප්ග්‍රෙඩ් ක්‍රමයට කරලා නැති හින්දා. හොඳ තර්කයක් මෙතුමා ගේන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මෙහෙම තියෙන්නේ. එයා නව බලපත්‍රලාභියෙක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා නව බලපත්‍රලාභියෙක්. අප්ග්‍රෙඩ් ක්‍රමයට කරලා නැති නිසා එයාව අයින් කරන්නේ. මේ හොඳ තර්කයක් මතු කරේ. එතකොට මේක හොඳටම පැහැදිලියිනේ අබේසේකර මන්ත්‍රීතුමා. ඇයි තාක්ෂණ ඇගයීම් කමිටුව එකක් අයින් කරේ. අන්න ඒකත් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ තාක්ෂණ ඇගයීම් කමිටුවේ කතාවක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරේ පළපුරුද්ද නිසානේ. එතනදී පළපුරුද්ද බැලුවා. එකක් නොසලකා හැරලා යන්න තීන්දු කරලා තිබුණා. මම ඒක දැක්කානේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එකක්වත් නොසලකා හැරලා යන්න තීන්දු කරලා නැහැ. රත්නතුංග කන්ස්ට්‍රක්ෂන් ආයතනයත් දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ තියෙන්නේ. "Did not submit the similar nature of work done in last ten years"මේ තියෙන්නේ ඒක. "Observations, Rathnathungha Constructions did not mention any similar works. The bidder is registered in 2021 at NERDC, but the bidder got experience with building construction", ඒ කියන්නේ ඒක අයින් කරනවා. එයාව අයින් කරනවා. මේ තියෙන්නේ ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නර්ඩ් එකේ සහතිකය අරගෙන තියෙන්නේ 2021 දී කියලා ඒ තියෙන්නේ. එයාව අයින් කරලා නැහැ මේකෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එයාව අයින් කරලා නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය ගැනත් තියෙනවා."Premadasa & Sons did not submit their financial statements" ඒකත් අයින් කරන්න පුළුවන්. එහෙම නම් ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනයත් අයින් කරන්න ඕන ඊට කලින්ම. ඒ අය ටෙන්ඩර් පටිපාටියට අනුව අවශ්‍ය ලියකියවිලි භාර දීලා නැහැ. ඊට කලින් අයින් කරන්න ඕන ඒ අයව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙ එක තැනක තිබුණා ඒ අයව අයින් කරා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ අය ඒ වගකීම ගන්නවා. මේ ලියුම ඉස්සෙල්ලා දැක්කා නම් අපි යන්න ඕනත් නැහැ මේවා බලන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය කොළේ වහලා දාලා තියෙන්නේ. ඒ අය ලියකියවිලි ටික හරියට දීලා නැහැ. "Premadasa & Sons did not submit their financial statements" ඒ අය හරිනම් එතනින්ම අයින් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි න්‍යාය පත්‍රයට යමු නැවත. ඒකට අවසන් තීන්දුව විදියට නැවත ටෙන්ඩර් කරන්න තීරණය කරමු බොහෝ දෙනාගේ ඉල්ලීම මත.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මෙහෙම තියෙන්නේ සභාපතිතුමා. දැන් ඒක මම නැවතත් කියනවා. ඒකට මුළු සභාවම කියලා කියන්න එපා මේක අනවශ්‍යයයි කියලා. ඇත්තටම මේක කවදාහරි කෙරෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ අබේසේකර මන්ත්‍රීතුමා. මේක අපි විවෘතව කතා කරමුකෝ. සියළුදෙනාම පිළිගන්න කාරණාවක්නේ මෙතනදී නිලධාරීයෙකුගේ බලපෑම එල්ල වුණා කියන එක. ඒක බොහොම පැහැදිලියිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනයෙනුත් තියෙනවානේ මේ බලපෑම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට නර්ඩ් ආයතනයේ බලපෑමට වැඩිය මේක ලිඛිතව පෙන්වලා තියෙනවානේ මේ තියෙන බලපෑම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනයේ බලපෑම ගැනත් ඔබතුමා කිවුවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අඩුම එකට දෙන්න ඒකට යට වෙන්න නම් මට බැහැ. ඒක පැහැදිලිව කියනවා. මේකෙදී ඒ වු ඉසෙඩ් පෙන්වලා තියෙනවා මේ නිලධාරියාගේ බලපෑම ගැන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට කමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නොවෙන්න නම් නැවත ටෙන්ඩර් කරන්න වෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මෙහෙම තියෙන්නේ. ඒ නිලධාරියාගේ බලපෑම මොකක් වුණත් නර්ඩ් ආයතනය ඒකට වගකියනවා නම් හරිනේ. නර්ඩ් ආයතනය වගකියනවානේ මේ තුන් දෙනාටම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ අබේසේකර මන්ත්‍රීතුමා. දැන් අපේ සභාවෙන් ඉල්ලුවොත් කවුද ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෝ කියලා, ඒක අපි දෙන්න ඕන. නමුත් මේකේදී අපි දන්නවානේ මේකයි පළපුරුද්දයි කියන්නේ දෙකක් කියලා. ලියාපදිංචිවීමයි, පළපුරුද්දයි කියන්නේ දෙකක් අබේසේකර මන්ත්‍රීතුමා. අවුරුද්දෙන් අවුරුද්ද ඒක නැවත අළුත් කර කර ඉන්න පුළුවන්. නමුත් එකක්වත් කරලා නැත්නම් මොකද කරන්නේ. මට තනියම වගකීම ගන්නවා කියලා කියන්න බැහැ. මේකට මෙහෙම යට වෙන්න බැහැ. මම තනියම වගකීම ගන්නවා කිවුවොත් තව කතාවක් කියාවි. නමුත් මෙතන මේ පළපුරුද්ද බොහොම පැහැදිලියිනේ. අපි ටෙන්ඩර් කරලා තියෙන්නේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ කරන්න. මෙතනදී පළපුරුද්ද බොහොම පැහැදිලියි අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැබැයි මේකෙ මෙහෙම තියෙන්නේ සභාපතිතුමා, දැන් අපේ උදුල මන්ත්‍රීතුමා පෙන්වපු උදාහරණය නම් වැරදියි. නාමල් ගමගේ වෛද්‍යවරයා කරන සැත්කමයි, අළුත් වෛද්‍ය ශිෂ්‍යයෙක් කරන සැත්කමයි වෙනස් කියපු එක මහ මෝඩ එකක්. නාමල් ගමගේ වෛද්‍යවරයා විතරක් නෙමෙයි තව කරන අය ඉන්නවා. නාමල් ගමගේ වෛද්‍යවරයා හැරණම තව කවුරුවත් හැදිලා එන්නේ නැහැනේ ඒක කරන්න දෙන්නේ නැත්නම්. එහෙමනම් නාමල් ගමගේ වෛද්‍යවරයා විතරයි මේක කරන්නේ හැමදාම ලංකාවේ. මේක තුළ එක දේකුත් අපි බලන්න ඕන. මේක තුළ ගොඩනගනවා එක දෙයක්. ඒ කියන්නේ මේ අය පමණක් කියලා. එහෙම වුණාම කාටවත් අත්දැකීම් එන්නේ නැහැනේ. එහෙම එන්න විදියක් නැහැ සභාපතිතුමා. වෙන දේකට නෙමෙයි මේක කිවුවේ. දැන් මේ විදියට තවත් කතාවක්නේ අත්දැකීම් බලන එක.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපෙන් අත්දැකීම් ගන්න දෙන්න බැහැ. ඒකයි මම කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අත්දැකීම් අපෙන් ගන්න එක අපිට අවධානමක් නැහැ. ඒ අවධානම ගන්නවා නර්ඩ් ආයතනය. වැරදි විදියට කරනවා නම් අපි නඩුවක් දැම්මොත් ඒ අය නඩුව වෙනුවෙන් පෙනී ඉන්නවා. ඒක ඒ අයගේ බැඳීමක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනය එක එක වෙලාවට, එක එක විදියට ඒ අයට ඕන තීන්දු ගන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනය විශ්වාස නැහැ. මෙතනට ඇවිල්ලා අපිට එක කතාවක් කිවුවේ. ගියාට පස්සේ ඒක නෙමෙයිනේ කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට නම් ඔය එක ආයතනයක්වත් පිළිබඳවවත් විශ්වාසයක් නැහැ. මම ඕකේ දෙතුන් දෙනාටම කතා කරලා තියෙනවා. නර්ඩ් ආයතනයටත් කතා කරලා තියෙනවා. මම කියන්නේ මේකෙ කතාව පැහැදිලියි. අපි ඕක දිගට අරන් යන්න ඕන නැහැ. මේක ආයෙමත් ටෙන්ඩර් කරලා දාමු. එතකොට මේක ඉවරයි. අපි ඕක ඉවරයක් කරමුකෝ. .

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ලංකාවේ ආදාහනාගාර ඉදිකරන ආයතන අටක්ද කොහෙද තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මේකෙදී නැවත වෙන්නෙත් අරක. මට කියන්න බැහැ ඒක නොවෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා මම කියන්නේ C5 කියන කතන්දරය නිසා තමයි මේක මෙතන හිරවෙලා තියෙන්නේ. C5 කතාව නිසා අර සියළු ආයතන වලට ටෙන්ඩර් එක දාන්න විදියක් නැහැ. මේකට මම කියන්නේ එක ආදාහනාගාරයක් හරි හදලා තියෙනවා නම් C5 කියන කතාව වැඩක් නැහැ මෙතනට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මන්ත්‍රීතුමා. එතනදී නර්ඩ් ආයතනය හරියට කිවුවා නම් මේ අයයි සුදුසු කියලා හරි. ඒ අයත් ඇඹරෙනවා. ඒක ඉතිං අපිට වුණත් වෙනවා එක වෙලාවකට. මොකද අපිට වුණත් මෙහේ දහ දෙනෙක් මොකක් හරි එකකට ලියාපදිංචි වුණොත් සාමුහිකත්වය කියන එක උඩ අපිට දෙන්න වෙනවා මේ දහ දෙනාම කරත් එකයි කියන එක. එහෙම වැඩක් තමයි මෙතන වෙලා තියෙන්නේ. ඒකට එතනින් එහාට යන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ එහෙම ලියාපදිංචිවීමක් නෙමෙයි. තාක්ෂණය පිළිබඳව ඒ අය සහතිකයක් දෙනවා හැකියාව තියෙනවා කියලා. කවුරුහරි ලියාපදිංචි වෙනවා කියන එක නෙමෙයි මේ කියන්නේ. එහෙම ගැලපුවොත් වැරදි අර්ථයක් යනවා. දැන් අපිට ව්‍යාපාරිකයෝ ලියාපදිංචි වෙන කොට ඒක සම්බන්ධ වෙන එකයි, මේකයි දෙකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතනදී මොකක්ද දන්නවාද කරේ. ඔතන ඔය ටෙන්ඩර් ලියකියවිලි ටික වැරැද්දුවා. ඒකට ටෙන්ඩර් පත්‍රිකාවේ දැම්මා නම් අදාළ ඉදිකිරීමට සහ දාහක කුටීරය කියන දෙකටම නර්ඩ් ආයතනයේ සහතිකය ඕන කියලා ඒක හරි. දෙන්න ඕන එක පැහැදිලි වෙනවා ඒකෙන්. එතනයි වැරැද්දුවේ. ඒක හිතාමතා අවශ්‍ය විදියට කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉදිකිරීම් වලට නර්ඩ් ආයතනයේ සහතිකය ගන්න එක සාධාරණ නැහැ. මොකද CIDA එක ඉල්ලලා තියෙනවා. ඒක වෙන කතාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් නර්ඩ් ආයතනයට ඉදිකිරීම අධීක්ෂණය කරන්න දෙන්නත් බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනය අධීක්ෂණය කරන්නේ ඒකෙ තාක්ෂණය පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඉදිකිරීම පිළිබඳව තාක්ෂණය දෙන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේක කියන්නේ කාටවත් පක්ෂග්‍රාහීව නෙමෙයි. ගොඩනැගිල්ල ඉදිකිරීම කියන්නේ එක තාක්ෂණයක්. ඉදිකිරීම් වලට තාක්ෂණය දෙන්නේ CIDA ආයතනයෙන්. ඒකෙ අංක තියෙනවා එකේ ඉඳන් හත වෙනකම්. ඒක මෙතනට ගන්න පුළුවන්. මම කියන්නේ සාධාරණ විදියට මේක කරන්න. ඒකයි අපේ යෝජනාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කොහොම ගියත් ඕකට දැන් තීන්දුවක් ගත්තානේ. මේක අපි නැවත ටෙන්ඩර් කරමු. නැවත ටෙන්ඩර් කරන්න යෝජනා කරා. ඒක ස්ථිර කරා. ඒක හරි. ඒක ගැන ආයේ හිතන්න දෙයක් නැහැ. ඒක සාධාරණ වේවි. නමුත් ඔතන නැවත තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාධාරණය ඉෂ්ඨ වේවිද කියන එකේ නම් ලොකු බරපතල සැකයක් තියෙනවා. ඒක මම දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඇතුළත් කරන්න ඕන කොන්දේසි ටික දාලා ගන්න. එතකොට ඒ අයට ඒකට නැත්නම් එන්න බැහැනේ. එතකොට ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනය මීට වැඩිය අඩු මිල ගණන් වලට එන්න පුළුවන්.

(ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතනදී තව ප්‍රශ්නයක් වෙනවා ඉතිං. මිල ගණන් ඉදිරිපත් කරපු ආයතන තුනට නැවත ගැටළුවක් තියෙනවා. ඒ වුණාට අපි නැවත මිල ගණන් කැඳවන්නෙත් ඒ ඇස්තමේන්තු මිළ ගණන් වලට නම්, නැවත දාන්නෙත් ඒ ගණන්ම නම් ප්‍රශ්නයක් තියෙනවා. ටෙන්ඩර් දාන අය දන්නවා ගාණ මේකයි කියලා. හරි ඒ විදියට මේක ක්‍රියාත්මක කරමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** හපුගල - වටරැක නැගෙනහිර, කළුපහන පාරේ චන්ද්‍රදාස මහතාගේ බේකරිය ඉදිරිපිට ජයවර්ධන මහතාගේ ඉඩම දෙසින් අනවසරයෙන් බැම්මක් ඉදිකිරීම හේතුවෙන් පෙර පැවති කාණුව අවහිර වී වර්ෂා දිනයන්හීදි ජලය එකතු වී ගමනාගමනයට බාධා ඇතිවීම සිදුවන බැවින් එය වැළැක්වීම සඳහා ප්‍රධාන මාර්ගයේ සිට අතුරු මාර්ගය දෙසට අඩි දෙකක් පළල කාණුවක් ජයවර්ධන මහතාගේ ඉඩම තුළින් කැපීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

අනවසර ඒවා නම් කඩන්නම ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** කලේගාන සති පොළ, ලැන්දෑවේ පිහිටි මහාබෝධි සමාගමට අයත් ඉඩම වෙත රැගෙන යාම සඳහා එම ඉඩම රජයට පවරා ගන්නා ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** කලේගාන සති පොළ පිහිටි භූමියේ ඉදිකිරීමට නියමිත වෙළඳ සංකීර්ණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන දේශීය ණය අරමුදලින් කොටසක්ද, රේඛීය අමාත්‍යාංශ මගින් කොටසක්ද සහ සභා අරමුදල් වලින් කොටසක්ද වන පරිදි සපයා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** කලේගාන සති පොළ පිහිටි භූමියේ ඉදිකිරීමට නියමිත වෙළඳ සංකීර්ණය සඳහා දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර ඇති ඇස්තමේන්තුව අනුව විවෘත ටෙන්ඩර් කැඳවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** ලබුදූව ක්‍රීඩාංගනයේ ඉදිරිපස කණුව සහ පැතිකාණුව, දැල් ආවරණය, ඉදිකර ඉදිරිපස ගේට්ටුව සවිකර, රාත්‍රී විදුලි ආලෝකරණ පද්ධතියක් සමගින් ක්‍රීඩාංගනය සඳහා අවශ්‍ය අනෙකුත් සංවර්ධන කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනෙකුත් සංවර්ධන කටයුතු කියලා මම අදහස් කරේ මේකයි. ආදාහනාගාරය ඉදිකරන භූමියේ පස් කැපෙනවා. ඒ පස් ගෙනල්ලා දාලා මේක හදන්න ඕන. පිට්ටනිය එහා පැත්ත සම්පූර්ණයෙන්ම වතුර පිරෙන ගතියක් තියෙනවා. ඒක සම්පූර්ණයෙන්ම පස් දාලා

නවීකරණය කරන්න යෝජනා කරේ. මොකද මේක සභාව සතු ක්‍රීඩාංගනයක්. ඒ වගේම පෝද්දල ක්‍රීඩාංගනයට, හපුගල ක්‍රීඩාංගනයට රුපියල් ලක්ෂ පහළොව බැගින් මුදල් වෙන් වෙලා තියෙනවා රජයෙන්. ඒ නිසා අපේ සභාවට තියෙන තවත් ක්‍රීඩාංගනයක් නිසා තමයි මේක යෝජනා කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 2020-12-31 දිනට අවසන් වූ වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි වෙන්දේසි කරන ලද ද්‍රව්‍යයන් හා විනාශ කරන ලද ද්‍රව්‍යයන් ඉන්වෙන්ට්‍රි ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන හා අබලි ලේඛනයන්ගෙන් කපා හැරීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** ආම්ටේජ් හිල් මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** ඩාලින්ටන් වත්තේ 04 වන හරස් මාර්ගය සහ 05 වන හරස් මාර්ගය අතර කොටස තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා, මට ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂ දෙකක මුදලක් ඇවිල්ලා තියෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්. ඒ මුදලෙන් මේ පාරේ අඩක් පමණ කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහාටද ආවේ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගයන්ත කරුණාතිලක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ඇවිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔයගොල්ලෝ මුලින් කරන්නකෝ. ඉතුරු ටික අපි කරන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** අප ප්‍රාදේශීය සභාවේ WP PF - 7464 අංක දරණ කැබ් රථයේ ටයිමිං බෙල්ට් පද්ධතියේ අළුත්වැඩියාව සඳහා මාතර, සමරසිංහ මෝටර්ස් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද රු.107,846.00 දරණ මිල ගණන ගරු සභාපතිතුමා විසින් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අනුමත කර, යාන්ත්‍රික ඉංජිනේරු අධීක්ෂණය යටතේ අදාළ අළුත්වැඩියාව ඉටු කර තිබීම අනුමත කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාම අළුත්වැඩියාව කරේ නැහැ. මොකද එහේ කොවිඩ් හින්දා වහලා තියෙන්නේ. කැබ් එකේ ටයිමිං බෙල්ට් එක දාන්න ඕන.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** හපුගල, සරසවි අසපුවේ, 07 වන හරස් පටුමගේ කේ.සී.ඩබ්. මුදලිගේ මහත්මියගේ නිවස අසළ කාණු පද්ධතිය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමා සභා ගර්භයෙන් බැහැරට ගිය නිසා මම ඒ යෝජනාව ඉදිරිපත් කරන්නම්.

**12.** පලිවතුගොඩ ග්‍රාමසේවා වසමේ සිල්වරින් ගාර්ඩන් පළමු මාර්ගය (රණධීර රාළහාමිගේ නිවස අසළ මාර්ගය) කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 13.** නරාවල, මගදෙණිය, පන්විල, අද්දරගොඩ, මුලන නැගෙනහිර, මුලන බටහිර යන ග්‍රාම සේවා වසම් වල අනවසර ඉදිකිරීම් බහුලව සිදු කෙරෙන අතර එම ග්‍රාම නිලධාරි වසම්වල වැඩ කටයුතු සිදු කිරීමට දැනට සිටින තාක්ෂණ නිලධාරියා වෙනුවට වෙනත් තාක්ෂණ නිලධාරිතුමෙක් හෝ තාක්ෂණ නිලධාරිතුමියක් අනුයුක්ත කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව අවශ්‍ය වෙන්නේ නැහැ. 2021-06-01 දින ඉඳන් ස්ථාන මාරු ක්‍රියාත්මක වෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** 2021-06-01 දින වෙනකම් නරාවල කොට්ඨාශයේ එතකොට ඕන විදියට අනවසර ඉදිකිරීම් කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මොකක්ද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** 2021-06-01 දින වෙනකම් ඒ කොට්ඨාශයේ අනවසර ඉදිකිරීම් කරන්න පුළුවන් ඒ මිනිස්සුන්ට.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** අපේ කොට්ඨාශයෙත් අනවසර ඉදිකිරීම් වෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක ගැටළුවක් නැහැ. මම ඒක මේ පාරත් බලන්නම්. ඒක කරලා දෙන්න. මේක බාලගිරිදෝෂය වගේද කියලා බලන්නම්. ඒ විශ්වාසය තියාගෙන ඉන්නම්.

මම ඇත්තටම මගේ වෙලාවේදී අදහස් දක්වන්න ගත්තේ මේකයි. විශේෂයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕන. පහුගිය කාල සීමාව තුළ කන්දෙගොඩ වත්තේ මාර්ගය හරහා තියෙන බෝක්කුව ඉදිකරලා දුන්නා සභාවේ අරමුදල් වලින්. මෙවර ඇතිවෙච්ච ගංවතුර ව්‍යසනයේදී වලවත්ත, අද්දරගොඩ ප්‍රදේශය ගංවතුරට යට වුණේ නැහැ. ඇත්තටම ගිය වැසි අවස්ථාවේදී විශාල ගංවතුරක් ආවා. මට මහා සභා රැස්වීමටවත් එදා එන්න වුණේ නැහැ. මහා සභා රැස්වීම තියෙන දවසක තමයි ඒ වර්ෂාව ඇද හැලුණේ. මට එදා මහා සභා රැස්වීමටවත් එන්න වුණේ නැහැ. අපේ තාක්ෂණ නිලධාරි ගුණසේකර මහතා කම්කරුවොත් සමග ඇවිල්ලා මට ඒ අවස්ථාවේදී ලොකු හයියක් වුණා. ඒ වෙනුවෙන් ස්තුතිය පුද කර සිටිනවා. ඉතිං මේ අවස්ථාවේදී මම තමයි වාසනාවන්තම මන්ත්‍රීවරයා වෙන්නේ. ඒ ගංවතුර තත්ත්වය මේ සැරේ ආවේ නැහැ. පොඩ්ඩක්වත් ආවේ නැහැ. ආපු වතුර ටිකත් බැහැලා ගියා. ඒ පාලම ඉදිකිරීමේදී විශාල බාධක ආවා. අබේසේකර මන්ත්‍රීතුමත් මට කිවුවා මොකක්ද අර කරලා තියෙන්නේ කියලා. පාලමක් ඉදිකරලා මිනිස්සු තරහා කරගෙන තියෙනවා කියලා කිවුවා. හැබැයි අද ඒකෙ ප්‍රතිඵල ජනතාවට ලැබිලා තියෙනවා. ඒ වෙනුවෙන් සභාවට මේ වෙලාවේදී මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 14.** අවිධිමත් දුරකථන කණු සිටුවීම සහ අනාරක්ෂිත දුරකථන කණු ඉවත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත දැනුවත් කළද වසර දෙකකට ආසන්න කාලයක් ඉක්මවා ගිය නමුත් කිසිදු පියවරක් ගෙන නොමැති බැවින් මාර්ගයේ ගමන් ගන්නා ජනතාවගේ ආරක්ෂාව සඳහා නැවතත් දැනුම් දී දින දහයක් ඇතුළත එම අනාරක්ෂිත දුරකථන කණු ඉවත් නොකරන්නේ අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමට එම කණු කඩා ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, බෝගහවෙල්ල මාර්ගයේ දුරකථන කණු කිහිපයක්ම ඇල වෙලා තියෙනවා. ඒක නිසා වාහන ගමන් කරන්න බැහැ. මම හිතන්නේ එක කණුවක් තියෙනවා නිවසකටත් ඇල වෙලා. අවිධිමත්ව හිටවලා තියෙන එකට සහ අනාරක්ෂිතව තියෙන එකට දැන් වසර දෙකකට විතර කලින් සභාව හරහා ලිඛිතව දැනුම් දුන්නා. නමුත් මේකට කිසිදු පියවරක් අරගෙන නැහැ. මේකට දැන් වසර දෙකක් ඉක්මවා ගිහිල්ලා තියෙනවා. මම ගාව ඒකෙ පිටපතකුත් තියෙනවා. අපි දැන්

නැවත වරක් මේ කණු ඉවත් කරලා අනතුරුදායක තත්ත්වය පහව යන ලෙස හිටවන්න කියලා ඉල්ලීමක් කරමු. නැත්නම් අපි ඒ අනතුර ඉවත් කරන්න කටයුතු කරමු කියලා මම යෝජනා කරේ. විශේෂයෙන්ම මම මේකට හේතුව විදියට ගත්තේ බෝගහවෙල්ල මාර්ගයයි. ඒ කණු කිහිපයක්ම වාහනයක් ගමන් කරන්න බැරි විදියට ඇලවෙලා. ඉතිං ඒකට මොකක්ද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට මේ කණු ඉවත් කරන්න බැහැ. අපි ලිඛිතව මේ අයට දන්වලා යවමු. එහෙම නැත්නම් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඔය පිළිබඳව කතා කරමු. මොකද අපිට කණු කඩා ඉවත් කරන්න හැකියාවක් නැහැ. ඕකේ සේවාවන් ලබා ගන්න අයගෙන් ඊට පස්සේ අපිට ගැටළු එනවානේ. අපි ඒවාට මුහුණ දෙන්න එපැයි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** දන්වලා තියෙනවා අවස්ථා කිහිපයක්ම. මම අවස්ථා කිහිපයකදීම දැනුම් දුන්නා කිසිම පියවරක් ගත්තේ නැහැ. ඒ ලියුම් ඇතිනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** වාහනයක් යන්න බැරි විදියට කණු ඇල වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඕක ගැන කතා කරමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 15.** ගිංතොට තුනී ලෑලි සංස්ථා භූමිය අප ප්‍රාදේශීය සභාවට අත්පත් කරගෙන සංරක්ෂිත තුරුගොමු සහිත ශාරීරික සහ මානසික සුවය ගෙන දෙන සංචාරක නිවාඩු නිකේතනයක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 16.** කරාපිටිය, ගල්කැටිය මාර්ගයේ, විවේකාරාම පන්සල අසළ අතුරු මාර්ගයේ හියුම් පයිප්ප යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 17.** අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති කාපට් යොදා සංවර්ධනය කර ඇති මාර්ග හරහා ජලය ලබා දීමේදී මාර්ගය පළුදු කිරීමට අවසර ලබා නොදී සිටිය යුතු අතර ජලය අවශ්‍ය අයට පොළව විද උමං මගින් බට යොදා නල ජලය ලබාදීමට පමණක් අවසර ලබා දිය යුතු බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා, ඒකට බට යොදන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැනට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගයන් තමයි ගොඩකන්ද - කරාපිටිය, උළුවිටිකේ මාර්ගය. ඒ මාර්ගයේ කිසිම තැනක මාර්ගය පළුදු කරන්න දෙන්නේ නැහැ. දෙපැත්තෙන් කාණුව හාරලා ඒක කරන්නේ. ජල සම්පාදන මණ්ඩලයත් ඒක දන්නවා. පොළව යටින් යන්නේ. කාපට් එක යටින් විදලා ගන්නවා. ඒකට මම හිතන්නේ රුපියල් දොළොස් දහසක වගේ මුදලක් වැය වෙනවා. මම ඒක නිසා යෝජනා කරේ සියළුම කාපට් මාර්ගවලට පොළව යටින් විදින්න කියලා. නැත්නම් කාපට් එක දාපු ගමන් පාර කඩනවා. පාරෙන් ඇති වැඩකුත් නැහැනේ එතකොට. ඒ නිසා පාර දෙපැත්තෙන් හාරලා මේවා කරනවා. අපි මේ පිළිබඳව ජල සම්පාදන මණ්ඩලයට දැනුම් දෙන්න කියන එකත් කියනවා. ලිඛිතව දැනුම් දෙන්න ඒක. හැබැයි ඒ වගේම තමයි මේක අපිට සභාවට අරගෙන කිරීමේ හැකියාවකුත් තියෙනවා. සාමාන්‍ය කෙනෙක් පොළව විදින්න රුපියල් පහළොස් දහසක් ගන්නවා. හැබැයි එක දවසෙන් පාර විදින්න පුළුවන්. මමත් මේ සභාවේ වැඩ කරන දෙන්නෙක් යොදවා ගෙන ගොඩකන්දේ සංස්කෘතික මධ්‍යස්ථානයට වතුර දෙන වෙලාවේදී පාර විද්දා එක දවසෙන්. ඒ ගාස්තුව සභාවට අරගෙන කරන්න පුළුවන් ඒ අයටත් මුදලක් ගෙවලා. විශේෂ අතිකාල දීමනාවක් ගෙවලා වගේ ඒක කරන්න පුළුවන්. එතකොට පාර කඩන්නේ නැහැ. පාර යටින් විදලා ඒක කරන්නේ. එහෙම කරලා දෙන්න වුණත් අපිට පුළුවන්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඒකට උපනපූරණයක් එකතු කරනවා. දැන් පාර කඩලා සමහර ඒවාට මුකුත්ම කරන්නේ නැතුව මාස ගාණක් තියෙනවා. ගොඩකන්දට එන පාරේ වෛද්‍ය විද්‍යාලය ගාවත් කඩලා තියෙනවා වතුර බට දාන්න. දැන් එතනින් යන්නත් බැහැ. මුකුත් කරන්නෙත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔය කඩපු එකට නිශ්චිත මුදලක්ද දන්නේ නැහැ ගන්නේ. දැන් නිකං පාරවල් වලට කඩන්න ගන්න ගාණද දන්නේ නැහැ ගන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කාපට් එකටත් තාර පාරට අය කරන මුදල තමයි අරගෙන තියෙන්නේ. කාපට් පාරවල් ගැසට් කරලා නැති නිසා ගන්න බැහැලු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක මාර කතාවක්නේ. අපිට රුපියල් දෙතුන් දාහක් අරගෙන කාපට් එක කඩන්න දෙන්න පුළුවන්ද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඊයේ දැන් එතනට ඒ.බී.සී. ටිකක් දැම්මා. අපි පාර කඩන්න නොදී හිටියම ඉවරයිනේ. එතකොට පොළව විදලානේ ගන්න ඕන. කාපට් පාරවල් කඩන්න දෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කඩන්න නොදෙනවා කියන යෝජනාව එනවා එක්කම ඔබතුමන්ලාම තමයි ඊට පස්සේ කියන්නේ අනේ මේ මනුස්සයාට වතුර ගන්න ඕන. ඒ නිසා මේක ගන්න දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඉතිං රුපියල් පහළොස්දාහක් ඒකට යනවා. ඉදිරියට වතුර ඕන අයට බටයක් දාලා තියා ගන්න කියන්න පාර කාපට් කරන කොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දන්වලා යවන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කාපට් පාරවල් වලට දැනට නිර්දේශ දෙන්න එපා කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙපැත්තෙන්ම තාප්ප ඉදිකරලා තිබුණොත් කොහොමද, ඒ අය පොළව විදින්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** පාර අයිනෙන් පොඩි වලක් හාරන්න අඩි එකහමාරේ විතර ඉඩක් ඕන. මම සංස්කෘතික මධ්‍යස්ථානය ගාව පාර ඒ විදියට විද්දා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. මේක හැමතැනකම කරන්න බැහැනේ. දැන් අපි හිතමු කාපට් පාර අයිනටම කොන්ක්‍රීට් කාණුවක් ඉදිකරලා තියෙනවා නම් කොහොමද පාර විදින්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සාමාන්‍යයෙන් අතුරු මාර්ගයක නම් පාර කඩන්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොඳම දේ ඕක නෙමෙයි. අපේ තාක්ෂණ නිලධාරීන් හරියට තීරණයක් ගන්න ඕන. උදාහරණයක් කියන්නම්. මම දන්නේ නැහැ ඒ පාර කැඩුණා කියලා. බෝගහවේල්ල පාර කැඩුණා කියන එක අපේ තාක්ෂණ නිලධාරීන්ගෙන් ඇහුවම එහෙම මතකයකුත් නැහැ. එහෙම මතකයකුත් නැහැ ඇත්ත කතාව.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කාපට් එක කරන්න ඉස්සෙල්ලා බට දා ගන්න කියලා කියන්න තිබුණා. හරියටම කාපට් එක දැම්මට පස්සේ ඒක කැඩුවා වතුර ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක කැඩුවා. මම ඒ ගැන කතා නොකරම හිටියා. කාපට් එක දාලා දවස් දෙකයි. මම ඒ ගැන කතා නොකර මේක කියන්නේ. මේකට පාර දෙපැත්තෙන් විදලා ගන්න පුළුවන්. අපි ජල සම්පාදන මණ්ඩලයට මේ දැනුම් දීම කරමු.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පන්විලත් ඕකම කරා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ජල සම්පාදන මණ්ඩලයට කිවුවම පාර හරහා බටයක් දාලා දෙන්න කියලා, ඒ අය ඒකට ලෑස්තියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මන්ත්‍රීතුමා. දැන් මෙතන මෙහෙමනේ. මෙහේ අයගේ වැරැද්ද තියෙන්නේ. අපිට ජල සම්පාදන මණ්ඩලයට දන්වන්න දෙයක් නැහැ. අපිට එවනවානේ මාර්ගය පළුදු කරන්න. අපේ තාක්ෂණ නිලධාරීන් ඒ තීන්දුව ගන්නවා නම් ඉවරයි. අපි ජල සම්පාදන

මණ්ඩලයට දන්වලා යවන්න දෙයක් නැහැ. දැන් වෙන්නේ එහෙම නෙමෙයිනේ. තාක්ෂණ නිලධාරීන් ඒක දන්නෙත් නැහැ. එහෙට කොළය අරගෙන යනවා, එතනදී මැෂිමන්ට් එක බලලා කරනවා. ඒකට පාර කාපට් කරලද, තාර දාලද කියලා නැහැ. එහෙම නම් කාපට් පාරවල් ලකුණු කරලා එවන්න කියලා යවමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පාර විදින්න රුපියල් දොළොස්දාහක් ගෙවන්න දුප්පත් මිනිස්සුන්ට හරි අමාරුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඉතිං මිනිස්සුත් මාර අසාධාරණයි. තමන් වතුර ගන්න ඉන්න බව දැන දැනම සද්ද නැතුව ඉන්නවා පාර කාපට් කරනකම්. මාර මිනිස්සු ඉන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කලින් බටේ දාන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අවුරුදු කීයක් තිස්සේ වතුර නොදී හිටියද මිනිස්සුන්ට. ඉතිං ඒ මිනිස්සු බට දාලා ටැප් හයිකරලා බලන් හිටියා. ඒ මිනිස්සු වතුර ගන්න කොට පාර කාපට් කරලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** තව දෙයක් තියෙනවා සභාපතිතුමා. පාර කැඩුවට පස්සේ ආයේ සකස් කරන්නෙත් නැහැනේ. ඒ විදියටම තියෙනවා. උත්සාහය ගේ ගාව මාසයකට වැඩියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් දැන් අපි ප්‍රීමික්ස් හදන එක නවත්වලානේ තියෙන්නේ. ඒක පළවෙනි ප්‍රශ්නය. දැන් ඉදිරියට කොහොමත් ඒක කරනවා. ඒක පරිපාලන තීන්දුවක් ගන්න එකක්. මේ මතු වෙච්ච හින්දා ඒක කියන්නේ. දැන් අපේ සියළුම කම්කරුවෝ, උප කාර්යාලයේ අයයි, මෙහේ අයයි දෙකේම ඉන්න සියළු අයව එක තැනකට යොදවන්න ඉන්නේ. අපේ වැඩ පරිපාලකවරයා සම්පූර්ණයෙන්ම ඒ කාලය තුළ ඉන්න ඕන. උදේ 8.30 ඉඳන් හවස 04.30 වෙනකම් වෙලාව ඇතුළත වැඩ පරිපාලකවරයාට වෙන කොහේවත් යන්න බැහැ. වැඩ පරිපාලකවරයා අදාළ ස්ථානයේ ඉන්න ඕන. ඒ වගකීම වැඩ පරිපාලකවරයා ගන්න ඕන. දැන් ඊයේ ලබුදූව - ගොඩකන්ද පාරට උදේ 10.00 ට ගියේ. අදාළ ස්ථානයට ගියේ උදේ 10.00 ට. දවල් 12.20 වෙනකොට ඒ අය නැහැ. හය දෙනෙක් වැඩ කරා. එක්කෙනෙක් විතරයි මැෂින් එකේ වැඩ කරේ. ඉතුරු පස් දෙනා බලන් ඉන්නවා වාඩි වෙලා. අර එක්කෙනා මැෂින් එකෙන් කපනවා. ඔහොමයි වැඩ කෙරෙන්නේ. ඒක හින්දා අනිවාර්යයෙන්ම ඊළඟ මේවා එක හදන කොට දෙපැත්තෙම අය එක තැනකට දාන්නේ. එතන වැඩ පරිපාලකවරයා අදාළ වෙලාවේදී ඉන්න ඕන. මට කවුරුවත් මුකුත් කියන්න එන්න එපා. ලියනගේ මන්ත්‍රීතුමා තරහා වෙන්න එපා. ඊයේ ඒ වැඩේ කරේ උප කාර්යාලයෙන් ගියපු අය. එතකොට කියන්න එපා උප කාර්යාලයේ අය වැඩ කරනවා කියලා. හැම වෙලාවේම කියන්නේ ඒකනේ. සමහරවිට මන්ත්‍රීවරු අනුව ඒක වෙනවා ඇති. මම ඒක නැහැ කියන්නේ නැහැ. නමුත් ඊයේ විතරක් නෙමෙයි අදාළ කාලය තුළදී ඕක වෙනවා. ඒක හින්දා උදේ 08.30 ට මෙතනින් යන්න ඕන. කැම එක එක්කෝ අදාළ තැනට ගේන්න ඕන. ඒකට තමන් විසින් වැඩපිළිවෙලක් යොදවා ගන්න ඕන. නැත්නම් මේ චෝදනාව මට දිගින් දිගටම ගන්න බැහැ. කාටවත් නෙමෙයි මේ චෝදනාව එන්නේ මට. ඊයේ ලබුදූව පන්සලේ හාමුදුරුවෝ කතා කරලා තමයි මම ඒක බලන්න ගියේ. එතකොට මට කටඋත්තර නැහැ ඒ වෙච්ච සිද්ධිය අනුව. ගොඩකන්දට සම්බන්ධ වෙන පාර එක දිගටම සුද්ධ කරන්න කියලා යෙදෙව්වේ. ගිහිල්ලා බලන්න කපලා තියෙන ප්‍රමාණය. එතකොට ඒක බලාගන්න පුළුවන්.

මේ යෝජනාවට ලියනගේ මන්ත්‍රීතුමා පාර කපන්න ඕන ස්ථානවල පාර කපන්න වෙනවා. මම කිවුවා වගේ ස්ථානවල ඒ අනුව කටයුතු කරමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එහෙමනම් කමක් නැහැ සභාපතිතුමා. හැබැයි ඒක ආපහු යථා තත්ත්වයට පත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක යථා තත්ත්වයට පත් කරන්න ඕන අපි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක කෙරෙන්නේ නැහැනේ. වෛද්‍ය විද්‍යාලය අසලින් එන පාරේ ලොකු වළක් හාරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගොඩකන්ද මාර්ගය පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධනය කරේ. ඒ පාර තවම කඩලා නැහැ. අවුරුදු පහක් යනකම් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ මාර්ග සංවර්ධන අධිකාරියෙන් කිසිම කාපට් මාර්ගයක් කඩන්න දෙන්නේ නැහැ. දැන් ඔය ගොඩකන්ද පාර අවුරුදු පහ පැනලත් දැනටත් ජලය ලබා දෙන්නේ උමං මාර්ගයෙන්. මම ඊයේ පෙරේදා සංස්කෘතික මධ්‍යස්ථානයට වතුර අරගෙන දුන්නා. පොළව විදලා අරන් දුන්නේ. හෝළුවාගොඩ පාරෙත් විදලා තියෙනවා. ඒ පැත්තේ හැම තැනකම ඒක කරනවා. ඒක ගැටළුවක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි මන්ත්‍රීතුමා. දැන් අපි අරක කරන්න බලමු. ඒක ප්‍රායෝගික නැති තැනුත් තියෙනවා. ගුණසේකර මහතා කියන්නේ යටින් කුහරයක් දැම්මට පස්සේ මේක අස්ථාවර වෙනවා කියලා. ඒක ඊට වැඩිය හානියක් වෙන්න පුළුවන් කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එහෙම නෙමෙයි යන්නේ. ඔතනදී පාර දෙපැත්තෙන් වළ වගේ හාරලා අඟලේ බටයක් විතරයි පාර හරහා යන්නේ. අඟලේ බටයෙන් තමයි පාර විදින්නේ. අඟල් බාගේ බටයක් තමයි ඇතුළට යවන්නේ. අඟලේ බටේකින් විදලා අඟලේ පයිප්ප බටයක් පාර හරහා යවනවා. ඒක ඇතුළෙන් අඟල් බාගයේ බටයක් යවන්නේ. ලොකු මේවා එකක් වෙන්නේ නැහැ. පාර හරහා යන්නේ අඟලේ බටයක්නේ.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලමු ස්ථානය අනුව.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 18.** අධිබලැති විදුලි රැහැන් පිහිටා ඇති භූමිවල නිවාස ඉදිකිරීමට අනුමැතිය ලබා නොදිය යුතු අතර, මේ පිළිබඳව තාක්ෂණ නිලධාරීන්ගේ දැඩි අවධානය යොමුකළ යුතු අතර, අනුමත කරන ලද භූ සැලසුම් සහ නිවාස සැලසුම් අත්හිටුවීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** විශේෂයෙන්ම සභාපතිතුමා ඒක මම ගෙනාවේ මේකයි. ඊයේ, පෙරේදා අපි ගියා කපුහෙම්පල තරංගා ලෑන්ඩ් සේල් ආයතනය විසින් කරපු වෙන්දේසි ඉඩමක් බලන්න. එතන ඉඩම් කට්ටි පහළොවකට වැඩියි. පර්චස් හයේ ඉඩම් කෑලි ඒවා. අධිබල විදුලි රැහැන් සමග ඒවා තියෙන්නේ. ඉතිං දැන් මේවා අනුමත කරලා මිනිස්සු අරගෙනත් ඉවරයි. විකුණලා ඉවරයි ඒවා. දැන් එතකොට මේවා අනුමත වුණේ කොහොමද, ඒකෙ හොඳම කතාව තමයි මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මිනිස්සුන්ට කරන අසාධාරණයක්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ මිනිස්සුන්ට කියනවා තට්ටු දෙකට ගෙදර හදන්න බැහැ, තනි තට්ටුවට විතරයි හදන්න පුළුවන් කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතන වොට් තිස්තුන් දාහ නෙමෙයි, ඊටත් වැඩි එකක් යන්නේ. කොහොමවත් ඒක යට ගෙවල් හදන්න දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක හරියටම මැද තියෙන්නේ. මම ඇහුවම කිව්වා මේක සභාවෙන් අනුමත කරලා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි නෙමෙයි නාගරික සංවර්ධන අධිකාරියෙන් කරපු එකක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා, මේක කොහොම කරත්, අවසානයේ අපේ සභා බලප්‍රදේශයනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අනිත් එක ඒකෙ පාරවල් ගන්න දෙයක් නැහැ. කාණු දාපුවා, බෝක්කු දාපුවත් එහෙමයි. පස් දාලා නැහැ. කම්බි දාලත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපි විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන්නම්. මොකක්ද එහේ තත්ත්වය කියලා ඉල්ලීමක් කරන්නම්. විදුලිබල මණ්ඩලයෙන් ඉල්ල ගන්න ඕන අධිබල විදුලි රැහැන් යට ඉදිකිරීම්වල තත්ත්වය මොකක්ද කියලා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 19.** පෝද්දල උප කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ කසළ එක්රැස් කිරීම සඳහා එක ට්‍රැක්ටරයක් ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා තව ට්‍රැක්ටර් රථයක් යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මොකද, දැන් කොට්ඨාශ හයකට ට්‍රැක්ටර් තුනක් වැඩ කරනවා. ඉතුරු කොට්ඨාශ හයටම එක ට්‍රැක්ටරයයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තුනක් නෙමෙයි මෙහෙටත් ට්‍රැක්ටර් දෙකයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ලොකු එකක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලොකු එක කරාපිටියටත් යනවා, තොටගොඩටත් යනවා, ලොකු එක හැම පැත්තටම යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහේ දැනට රියදුරන් දෙන්නෙක් විශ්‍රාම ගියා. යන විදිය ගැන බැලුවම කොහොමද යන්නේ කියලා හිතන්න ඕන. ඒකට තව දෙන්නෙක් ගන්න අනුමැතිය නැහැ. ඒක ආවම බලමු මොකක් හරි කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කිරිමැටිමුල්ල වත්ත ප්‍රධාන මාර්ගයේ කුණු ට්‍රැක්ටරය යන්නේ නැහැ කියලා දෝෂාරෝපණයක් තියෙනවා. ගිය සමිති වාරයේදීත් ඒක මතක් කලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එතකොට අරහේ තනි ට්‍රැක්ටරයෙන් කුණු අදින්න බැහැනේ.

දිගටම කුණු ගන්නේ නැහැ. ඊළඟට බලන කොට ඒවා කාණු වලට ගෙනත් දාලා. ඒ කුණු දාපු කාණු උතුරනවා පහුගිය දවස්වල යනකොට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අනිත් එක තමයි මාර්ග පිරිසිදු කිරීම, පසුගිය මාසයටම, අප්‍රේල් මාසයටම හම්බ වුණේ නැහැ. කරාපිටියේ එක පාරකවත් යන්න බැහැ. කිරිමැටිමුල්ල පාර, බෝගහවේල්ල පාර, ඉන්ග්ලන්ඩ්හිල් පාර එකකවත් යන්න බැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** බෝගහවේල්ල පාරේ කුණු දානවා. ගෝනි පිටින් ගෙනත් දාලා තියෙන්නේ. ට්‍රැක්ටරයට කිවුවම ඒවා බාර ගන්න බැහැ කියනවා. ඒවා කවුරු දානවද දන්නේ නැහැ. බෝතල් ගෝනි පිටින් දාලා ගිහිල්ලා. එතන ගෝනි වගයක් ගොඩ ගැහිලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කාණුවල වතුර පිරෙනවා. දැන් මේකයි වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කැලෑව වැවිලා නිසා ඒක තවත් වැඩියි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ලැබෙන දිනය අරගෙන ඒක මේවා කරන්න. පෞද්ගලිකවත් ඇවිල්ලා ඔබතුමාට කතා කරා. මේ මාර්ග එකින් එක සුද්ද කරලා දාන්න අවශ්‍ය වැඩපිළිවෙලක් හදලා දෙන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** බෝගහවේල්ල පාර සුද්ධ කරනවානම් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේ සෙනසුරාදා දෙන්නත් බැහැනේ. මම ඔබතුමාට මේ සෙනසුරාදාට දෙන්නම් කිවුවා. නමුත් සෙනසුරාදා ඉඳන් දිගටම සංචරණ සීමා දානවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙමයි. සංචරණ සීමා දැම්මට දැන් මෙහේ ඉන්නවානේ දෛනික පඩි ලබන සේවක කණ්ඩායමක්. ඒ අයව ගෙන්වමු. ඒ අය ගෙන්වලා ඒකට දාමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෛනික පඩි ලබන අය තමයි ඔය දාන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ අය ගෙන්වමු සංචරණ සීමා දාන දවස් වලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය කරන වැඩ ගැන ගත්තොත් එහෙම කතා කරලා වැඩක් නැහැ. මේ වැඩ පරිපාලකවරයෙක් ඉන්න කොට වැඩ කරන්නේ මෙහෙමයි. මම පහුගිය දවසක උදේ 09.00 ට එනකොට කවුරුවත්ම නැහැ. බලනකොට උදේටත් අත්සන් කරලා, හවසටත් අත්සන් කරලා. ඕකයි වෙන්නේ. ගෙන්නුවොත් වෙන දේ මම කියන්නම්. ඕකට අර වැඩපිළිවෙල හදලා මම උත්තරයක් දෙන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා ඃ-** සභාපතිතුමා මම ඉස්සෙල්ලම කම්කරුවන්ගේ ප්‍රශ්නය ගැන පොඩ්ඩක් කතා කරන්නම්. දැන් වැඩ නොකරන තත්ත්වයක් තියෙනවා කියන එක මම පිළිගන්නවා. නමුත් යම් යම් ප්‍රදේශවල වැඩ කරනවා. පෙරේදා මගේ ප්‍රදේශයේ වැඩ කරා. හත් දෙනෙක් වැඩ කරා. ගංගාතිලක පන්සල පාරේ ඉඳන් සායනය පැත්තට පාර සම්පූර්ණයෙන්ම සුද්ධ කරා. හැබැයි මම

බලන්න ගියා. විජේපාල මහතාත් මට කතා කරා. පාර දිගටම සුද්ධ කරලා සායනයත් සුද්ධ කරා. ඊට පස්සේ ඒ අතරතුර මම එනකොට නිලසෙවන ගාවදී නැවතුණා. එතන සම්පූර්ණයෙන්ම කැලේ වැවිලා කියලා කිවුවා. මේ සෝමාරාම පන්සල ඉස්සරහ. ඒ පාර මම එවෙලෙම කතා කරලා කිවුවා විජේපාල මහතාට. ඒ පාර එතනටත් දෙන්නෙක්ව එවුවා. ඊට පස්සේ ඒකත් සුද්ධ කරා. මම ඒකෙන් සෑහිමකට පත් වුණා. ඉතිං එතනදී මම ඔය ප්‍රශ්නය ගැන කතා කරා. දැන් සභාපතිතුමා කිවුවා ඒ වෙලාවේ වැඩ කරන තැන හිටියේ නැහැ කියලා. ඒක ඇත්ත, ඒකත් පිළිගන්නවා. මම කිවුවා දැන් මෙහෙමයි කියලා. මන්ත්‍රීවරු මේක ගැන අවධානය යොමු කරවන්න ඕන. හේතුව දැන් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු අපි එකොළොස්දෙනෙක් අළුතෙන් සේවකයන් විදියට අරගෙන තියෙනවා. ඊට අමතරව ට්‍රැක්ටර් වලට අරගෙන තියෙනවා. දැන් මේ අළුතෙන් ආපු මන්ත්‍රීවරුන්ට මේක තමයි තියෙන සම්පත. මේකෙන් තමයි තමන්ගේ ප්‍රදේශය ආරක්ෂා කර ගන්න ඕන. දැන් එතනදී මම කියන්න යන්නේ වෙන මොනවත් නෙමෙයි. ඒ කම්කරුවෝ සේවයට යෙදෙව්වම අදාළ මන්ත්‍රීවරයත් එතනට යන්න. ඒක පොඩ්ඩක් ගිහිල්ලා බලන්න මොකද වෙන්නේ කියලා. ඒ වගේ හැමදාම යන්න ඕන නැහැ. දවසක් දෙකක් ගිහිල්ලා විශ්වාසය ඇතිකර ගත්තාට පස්සේ හරි. මම හිතන්නේ මගේ වැලිපිටිමෝදර කොට්ඨාශයෙන් මේ වගේ පැමිණිලි එනවා අඩුයි. සුද්ධ කරන්නේ නැහැ, අරහෙමයි, මෙහෙමයි කියලා පැමිණිලි එනවා අඩුයි. මම ඒක කරවනවා. පැහැදිලිවම මම ඒක දන්නවා. ඒක වෙන්නේ නැහැ. හැබැයි මගේ පොඩි චාට් එකක් තියෙනවා. මම ඒ අයත් එක්ක කතා කරලා ඒකඟතාවය තියාගෙන, කවුරුවත් අපහසුතාවයට පත් කරන්න එපා කියලා, තේ ටිකක් බොන්න දීලා ඒ වැඩපිළිවෙල කරගෙන යනවා. ඒක හින්දා මම මේ කියන්නේ වෙන මොනවත් නෙමෙයි සභාපතිතුමා. මේ වෙලාවේදී කොවිඩ් 19 ප්‍රශ්නය තියෙනවා. ඒ නිසා සභාවේ තියෙන සම්පත් තමයි අපිට ඔය කම්කරුවෝ ටික. ඒ කම්කරුවෝ වැරදි විදියට හැසිරෙනවා. මේක අපි නිවැරදි කර ගන්න ඕන. අපි ඒ අයට දෛනික වැටුප් ලබා දෙන්නේ. මේ අයට පඩියක් ගන්න වෙන තැනක ගිහින් වැඩ කරන්න විදියක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද කියන්නේ පිට වැඩ කරන්නේ නැහැ කියලා. මම ඒක වගකීමෙන් කියනවා. මම යද්දී පිටවැඩ කරනවා තමන්ගේ මැෂින් වලින්. මම ඇස් දෙකට දැකපු තැන් තියෙනවා. උදේට සභාවේ අත්සන් කරලා තමන්ගේ මැෂින් එකෙන් පිට වැඩ කරනවා. එහෙම පිට වැඩ කරනවා මම ඇස් දෙකෙන් දැකලා තියෙනවා. මම නම් වශයෙන් කියන්නම් ඕන නම්.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඇත්තටම සභාපතිතුමා මෙච්චර දවසක් මම කවදාවත් වැඩ කරන සේවකයන්ට විරුද්ධව කතා කරේ නැහැ. මොකද අඩුපාඩු තිබුණත් අපි හිතුවේ ඒවා හදාගෙන යන්න ඕන කියලා. මගේ කොට්ඨාශයේ වැඩ කරපු දවස් වලට බොහොම කලාතුරකින් දවසක විතරයි හරියට වැඩක් කෙරුවේ. හැමදාම මම සභාපතිතුමාට කතා කරලා චෝදනා කරනවා. මොකක්ද මේ වැඩේ තේරුම, වැඩ පරිපාලකවරයෙක් මේකට දාන්නේ නැද්ද කියලා අහනවා. අපිටත් සභාපතිතුමා හැමතිස්සෙම පාරවල් වලට වෙලා ඉන්න බැහැ. දැන් ඊයේ මගේ කොට්ඨාශයේ වැඩ කරපු දවසේ උදේ 10.00 ට විතර තමයි අපේ ගෙදර ළඟට එනකොට වෙලාව. මම දන්නේ නැහැ එක එක්කෙනා මොන විදියට වැඩ කරනවාද කියලා. මටනම් ඊයේ ලොකු අසාධාරණයක් සිද්ධ වුණේ. මම පැයකට විතර පස්සේ යනකොට මීටර් 50 ක් විතර සුද්ධ කරලා තිබුණා. ලොකු තණකොළ තිබුණේ නැහැ කපන්න. පොඩි තණකොල තමයි තිබුණේ. එක මැෂින් එකයි වැඩ කරන්නේ. පස් දෙනෙක් වාඩි වෙලා ඉන්නවා. දැන් මෙච්චර දවසක් මම ඕක කිවුවේ නැහැ මිනිස්සු තරහා කරගන්නේ මොකටද කියලා. ඒ වුණත් අපි මේකට ශබ්ද නොකර ඉන්නවා නම් ඒක ලොකු වැරැද්දක්. අපි ඒක මන්ත්‍රීවරු විදියට කරන ලොකු වැරැද්දක්. එක මැෂින් එකයි මන්ත්‍රීතුමිය තියෙන්නේ කියලා කිවුවා. අනිත් පස් දෙනා වාඩි වෙලා ඉන්නවා. මම ඇහුවා විසිකැති ගෙනාවේ නැද්ද කියලා. ඒවා ගෙනාවේ නැහැ කිවුවා. එතකොට අර වැඩ කරන කෙනා විනාඩි 10 ක් 15 ක් තණකොළ ටික කපලා ඇවිල්ලා වාඩිවෙනවා. ඊට පස්සේ ඊළඟ කෙනා යනවා මැෂින් එක අරගෙන. එතකොට පස් දෙනෙක් කොයිවෙලෙත් වාඩි වෙලා ඉන්නවා. බලන් ඉන්න බැරිම තැන මම ගියා. පන්සල ළඟදී මට නතර වෙන්න සිද්ධ වුණා හාමුදුරුවෝ මට පණිවිඩයකට කතා කරපු නිසා. මට පැය බාගයකට වැඩිය පන්සලේ ඉන්න වුණා. මම ගෙදර ගියා කියලා හිතලා විනාඩි 10 න් සේරම යනවා. එතකොට 12.10 යි වෙලාව. පැය එකහමාරයි ඒ කොට්ඨාශයේ වැඩ කෙරුවේ. ඉතිං මේ විදියට අපිට මාසයකට දවස් පහක් සේවකයෝ ලබා දුන්නත් මම හිතන්නේ නැහැ කොට්ඨාශයේ වැඩ ටික කර ගන්න පුළුවන් වේවි කියලා. අපිට හැම තිස්සෙම පාරට වෙලා ඉන්න බැහැ ඒ අය එක්ක. ඒක එහෙම කරනවා නම් වැඩක් නැහැනේ සභාපතිතුමා ඒ අයට ගෙවන සල්ලි වලින්. එක දවසක් දෙකක් නෙමෙයි මම හැමදාම කතා කරලා කියනවා. පැය දෙකයි වැඩ කරේ. ගයාන් මන්ත්‍රීතුමාගේ කොට්ඨාශය ළඟට වෙනකම් මගේ කොට්ඨාශයේ සීමාව තියෙනවා. මම කියලා ගියා ඒක ඉවර කරන්න කියලා. හය දෙනෙක් හිටපු නිසා ඒක පැය දෙක තුනකින් කරන්න පුළුවන් වැඩක්. ඊයේ ඒ වැඩේ කෙරුනේ නැහැ. මගේ වැඩ කරපු හැමදාකම ඔය වගේ තමයි. ඒකට හේතුව මම දන්නේ නැහැ. පොඩි පාරක් දෙන්න කිවුවා සුද්ධ කරන්න. ඒ අයට පොඩි පාරක් දෙන්න නම් සභාවට වෙලා නිකං ඉන්න ඕන කොට්ඨාශවල වැඩ තියෙද්දි. මෙච්චර දවසක් මම සේවකයන්ට විරුද්ධව කතා කරේ නැහැ. දැන් නම් ඇත්තටම නිහඬව ඉන්න බැහැ. කොට්ඨාශවල වැඩ ගොඩගැහිලා තියෙනවා. පැයක් දෙකක් වැඩ

කරලා ඉවර වෙලා අපිට බලන්න බැරි වුණොත් ඔක්කොම ගිහිල්ලා. දවල් 12.00 වෙනකොට ගිහින්. බලන කොට ඒ පාර තිබුණ විදියමයි. මම බය නැතුව අද කතා කරන්නේ ඒකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පහුගිය දවසක මෙහෙම තීන්දුවක් ගත්තා. නමුත් දැන් ඒක ක්‍රියාත්මක වෙන විදිය හොඳට පැහැදිළියි. සේවකයන් ඔක්කොම එකතු කරලා ප්‍රශ්න ඇහුවා. මම ඇහුවා ඇයි කියලා ඒකට හේතුව. එක්කෙනෙක් කිවුවා මන්ත්‍රීතුමා පෙන්වලා දෙන ටික අපි කරනවා ඉතිං ඒ වැඩේ ඉවර වුණාම යනවා කියලා කිවුවා. ඒ පාර මට කිවුවා දවල් 01.00 ට යන්නේ කියලා. දවල් 01.00 වෙනකොට මන්ත්‍රීවරයා පෙන්වලා දෙන ටික ඉවර වුණොත් එයාලා යනවා කිවුවා. එතකොට මම කිවුවා එහෙම බැහැ කියලා. මන්ත්‍රීවරයා විසින් තව පාරක් පෙන්වලා දුන්නොත් එයාලා ඒක කරනවා කිවුවා. තව එකක් පෙන්වලා දුන්නොත් ඒක කරනවා කිවුවා. එතකොට මම කිවුවා මුලින්ම හවස 04.30 වෙනකම් වැඩ කරන්න ඕන කියලා. එතකොට තමයි ඕක කිවුවේ. ඊට පස්සේ මම කිවුවා මන්ත්‍රීවරයාට කියලා තමයි එතනින් යන්න ඕන කියලා. අපිට කියන්න බැහැ මන්ත්‍රීවරුන්ට උදේ ඉඳන් හවස වැඩ ඉවර වෙනකම් එතන ඉන්න කියලා. හැබැයි මම වැඩ පරිපාලකවරයාටත් ඒක කිවුවා. තාක්ෂණ නිලධාරියාටත් කිවුවා පොතක් තියා ගන්න කියලා මන්ත්‍රීවරයාගෙන් අත්සන් ගන්න. ඒක කෙරුණේ නැහැ. ඒකමතිකව මේ තීන්දුව ආවේ. නමුත් දැන් මට තේරෙනවා මොන එක කරත් හරියන්නේ නැහැ. වැඩ පරිපාලකවරයා කියන්නේ මට තැන් දෙකක් බලන්න බැහැ කියලා. දෙපැත්තම බලන්න විදියක් නැහැ කියලා එයා කියන්නේ. උප කාර්යාලයේ තාක්ෂණ නිලධාරි කියන්නේ එයාට ගිහිල්ලා ළඟ ඉඳලා බලන්න විදියක් නැහැ කියලා. ඒක හින්දා හොඳම දේ වැඩ පරිපාලකවරයා අනිත් සියළු කාරණා වලින් අයින් කරනවා. මට කවුරුත්ම ඒකට මුකුත් කියන්න එන්න එපා. මම ඒක මෙතෙක් කල් බැලුවා. දැන් අවුරුදු තුනකට කිට්ටු වෙන්න කාලයක් වෙනවා. වැඩ පරිපාලකවරයාව වෙනත් වැඩ වලින් අයින් කරනවා. සියළු කම්කරුවන් උදේ 08.30 ඉඳන් හවස 04.30 වෙනකම් ඉන්න ඕන. හැබැයි මන්ත්‍රීවරයාටත් වගකීමක් තියෙනවා ඒ අය බෙදලා දීලා තමන්ට අවශ්‍ය වැඩ ටික කර ගන්න. වැඩක් පෙන්වලා නොදුන්නොත් නිකං වාඩි වෙලා ඉඳීවි. එහෙම එකකුත් තියෙනවා. නමුත් මෙතන තියෙන ප්‍රශ්නය තමයි වැඩ පෙන්වලත් නොකරන එක. දැන් ඊයේ උදේ යනකොටම කිවුවලු අනේ අපිට අද පොඩි පාරක් පෙන්වන්න මන්ත්‍රීතුමිය කියලා. මම කියන්නේ දැන් ඒ මට්ටමට මේක ගිහිල්ලා. කියාගෙන එන්නෙම පොඩි පාරක් පෙන්වන්න කියලා. හැබැයි ඉතිං අර ප්‍රශ්නෙත් තියෙනවා. දවසම උදේ 08.30 ඉඳලා හවස 04.30 වෙනකම් ඉන්න කොට අවශ්‍ය වැඩේ කර ගන්න ඕන. නැත්නම් මේ අය වාඩිවෙලා ඉඳීවි. ඒක ඊට වැඩිය චෝදනාවක්. හවස 04.30 වෙනකම් වාඩිවෙලා ඉන්නවා කියන එක ඊට වැඩිය චෝදනාවක්. ඒක අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරු බලන්න ඕන. මම මෙහෙටත් කිවුවා. මම ඒක භාර දුන්නා වැඩ පරිපාලකවරයාට. ඊට කලින් දවසේ අදාළ මන්ත්‍රීවරයාට දුරකථන ඇමතුමක් දීලා දැනුවත් කරන්න කිවුවා ඔන්න හෙට ඔබතුමාට තියෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ වගේම තමයි ඒ අයගෙන් වැඩ බලාපොරොත්තු වෙනවා වගේම ඒ අයට අවශ්‍ය පහසුකම් ටිකත් සභාවෙන් ලබා දෙන්න ඕන. එක මැෂින් එකයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ මන්ත්‍රීතුමා. දැන්නේ ඔය මැෂින් වලින් වැඩ කරන්නේ. මේ අය ඉස්සර ඔය ඔක්කොම වැඩ කරේ විසිකැති වලින්නේ. මේකෙ ඉන්න සමහරු ට්‍රැක්ටරයකට නැග්ගොත් ඒ ට්‍රැක්ටරය කැඩිලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තණකොල කපන මැෂින් එකක් ගත්තත් එහෙමයි. නමුත් තමන්ට ඕන වැඩේ කර ගන්න ඕන වුණාම තණකොල කපන මැෂින් එකත් වැඩ, ට්‍රැක්ටරයත් වැඩ. එහෙම අයත් එක්ක තමයි මේ වැඩ කරන්නේ. ඉතිං මම එකඟ නැහැ ඒකට සීයට සීයක්. මැෂින් කැඩිලා තියෙනවා කියන එකට මම එකඟ නැහැ. නමුත් මේ අය විසිකැත්තක් හරි අරගෙන ගිහිල්ලා වැඩේ ඉවර කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සමහර දවස් වලට සභාපතිතුමා මැෂින් එකට තෙල් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට කරන්නේ මේකයි. දැන් වැඩ පරිපාලකවරයාට ඒක සම්පූර්ණයෙන්ම භාර දෙනවා. එයා ඒ වගකීම ගන්න ඕන. මම හැමදාම කියනවා මේක මේ විදියට කරන්න කියලා. මම දන්නේ නැහැ නමුත් කරන්නේ මොකක්ද කියන එක. දැන් එදා සේවක සාකච්ඡාවක් කැඳවලත් කිවුවානේ. අඩුපාඩුකම් කියන්න කිවුවා. එදා සේවකයන් කැඳවලා කිවුවා තෙල් ටික කලින් දවසේ ගන්න කියලා. වැඩිපුර තෙල් ලීටර් විස්සක් තියාගන්න කියලා කිවුවා. ඕවා කිවුවානේ. වැඩක් නැහැ ඕවා ගැන කතා කරලා.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමාගේ කොට්ඨාශය ගැන මම පොඩ්ඩක් කතා කරන්නේ. අපේ තාත්තාගේ මළගෙදරින් පස්සේ තව වෙනකම් ඒ පැත්තට සේවකයන් හම්බ

වුණේ නැහැ. තව වෙනකම් ඒ පැත්තේ කිසිම කටයුත්තක් සිදු වුණේ නැහැ. ඔබතුමා වෙනුවෙන් මම කතා කරන්නේ. දැන් තාත්තාගේ මලගෙදර වෙලා අවුරුද්දක් වෙනවා. තාම කොට්ඨාශයේ කිසි වැඩක් කෙරුණේ නැහැ සභාපතිතුමා. ගරු සභාපතිතුමා බෝක්කු වහලා තියෙනවා මගේ කොට්ඨාශයේ. ඒ ගැන කිසි හෙවිල්ලක් නැහැ. සභාපතිතුමා පොඩ්ඩක් ඒක බලන්න. කොට්ඨාශය ගැන පොඩ්ඩක් බලන්න. මගේ තාත්තාගේ මළගෙදර නිසා තමයි ඒ වැඩ ටිකත් සිදු වුණේ. අපි ඕකේ ඉස්සර සමිතියක් විදියට වැඩ කරා. සමිතියක් විදියට වැඩ කරන කොට අපෙන්ම වැඩ ගන්න තමයි මිනිස්සු බලන්නේ. අපි වරිපනම් ගෙවනවා නම් ඇයි සභාපතිතුමා මේවා කරන්නේ නැත්තේ කියලා මිනිස්සු අහනවා. අපි නිකං වැඩකාරයෝ වගේ හැම ගෙයක් ඉස්සරහම සුද්ධ කර කර හිටියා කාලයක්. අපි දැන් ඒක නැවැත්තුවා. දැන් ඩාලින්ටන්වත්ත බලන්න බැහැ. ඔබතුමා පොඩ්ඩක් ඒ ගැන අවධානය යොමු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුලක් නැහැ ඔබතුමිය මට බැණ බැණ ඉන්න ඉතිං.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඉතිං අන්න ඒකයි තත්ත්වය. දැන් අනිත් කොට්ඨාශවලත් මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් ඉන්නවා. දැන් මම විපක්ෂයේනේ. ඔබතුමාගේ කොට්ඨාශය ගැන ඔබතුමා බලලා වැඩ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුලක් නැහැ. ඔබතුමිය මට බැන බැන ඉන්න. ඔබතුමිය විපක්ෂයේනේ. අපේ කාලයේදී මේවා කරා කියන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් මම කතාකරන්න ආපු එක ගැන කතා කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. මුලින් යෝජනා ටික ඉදිරිපත් කරලා ඉන්නකෝ. දැන් ඉස්සෙල්ලත් වෙන එකක් කතා කරලා ඒකට වටයක් ගියා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අවශ්‍ය කාරණා ටික මම කියන්නම්කෝ. සභාපතිතුමා මෙහෙමයි. දැන් මේ මිනිස්සු එක්ක රණ්ඩු වෙලා අපිට මේ වැඩේ කරන්න බැහැ. මොකද මේ මිනිස්සු එලවලා දාන්නද, මේ අය තියාගෙන, මේ අයගෙන් වැඩ කරගන්න ඕන. ඇත්ත කතාව ඒකනේ. ඒක අපි කරන විදිය දන්නවා. ඒකයි මම කියන්නේ. මම සභාපතිතුමා කියපු එකටත් එකඟ වුණානේ. ඔබතුමා කිව්වා අපි මීට පස්සේ කාර්යාල දෙකේම කට්ටිය එකට දාලා වැඩ කරනවා කියලා. දැන් මට ඒක තේරෙනවා. මමමනේ ඒ යෝජනාව ගෙනාවේ. මම ඒකට එකඟ වුණා. මමම තමයි ඒ යෝජනාව ගෙනාවේ. මම ඒකට එකඟ වුණා. එකඟ වුණේ මේ ප්‍රශ්නය නිසා. මොකද වැඩ පරිපාලකවරයෙක්ට දෙපැත්තක් බලන්න බැහැ කියන එක අපි පිළිගන්නවා. අපි ඒවා පිළිගන්න ඕන. ඒ නිසා අපි ඒකට එකඟ වුණා. ඒකත් එක්කම දැන් ප්‍රීමික්ස් ප්‍රශ්නය ආවා. දැන් ප්‍රීමික්ස් ඕන වෙලා තියෙනවා. හේතුව වෙලා තියෙන්නේ මොකක්ද කියලා දන්නවාද, කාපට් පාරවල් කඩනවා. ඒ නිසා මේවා කාලයකට ඕන වෙනවා. තවත් කාලයකට ඕන වෙන්නේ නැති වෙනවා. එහෙම වෙනවා. දැන් අළුත දාපු කාපට් පාරක් කැඩුවට පස්සේ ඒක හැදුවේ නැත්නම් දිගින් දිගටම ඒක කැඩීගෙන යනවා. ඒක හින්දා කරුණාකරලා ප්‍රීමික්ස් යාඩ් එක හරිගස්සවලා ඒක කරන්න. අපි සල්ලි ගන්නවානේ මේ සභාවෙන්. අපි මිනිස්සුන්ගෙන් ඇහුවම කාපට් පාර කඩන්නේ මොකටද කියලා සභාවට සල්ලි ගෙවලා තියෙනවා කියලා කියනවා. එතකොට අපිට කටඋත්තර නැහැ. මේ හින්දා කාපට් පාර වතුර ගන්න කැඩුවට පස්සේ ඒක හදන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කාපට් පාර කඩන එකට ගාණ වැඩි කරන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගාණ වැඩි කරන්න. ඒකට කමක් නැහැ. කාපට් එකට ලැබෙන ගාණ අඩුයි කියලා හිතෙනවා නම් ඒ ගාණ සාධාරණ කරලා වැඩි කරන්න. ඒ ටික අනිවාර්යයෙන්ම කියන්න ඕන. ඊට පස්සේ කම්කරුවන්ගේ ප්‍රශ්නය තියෙන්නේ. කම්කරුවෝ දෙපැත්තට දාලා දැන් ඇතිනේ කරා. හෙට අනිද්දාට කොවිඩ් වලට නිවාඩු දුන්නට පස්සේ ඒ ගොල්ලන්ට සේවය කරන්න ඉඩ නොදී ඉන්න එපා. ඒ අයට සේවය කරන්න අවස්ථාව ලබා දෙන්න. ඊට පස්සේ මන්ත්‍රීවරුන්ගේ අධීක්ෂණය යටතේ ඒක කරන්න. ඒ මිනිස්සුන්ට පඩි නැහැ එක පැත්තකින්. ඒ අයට සේවය කරන්න අවස්ථාව ලබා දෙන්න. අපි මන්ත්‍රීවරු වුණාට අපිත් මිනිස්සු. මේකෙ නරක නාමය එන්නේ අන්තිමට අපිට. ඒක සභාපතිතුමාටත් එන්න පුළුවන්. මටත් එන්න පුළුවන්. ඒක අනිත් මන්ත්‍රීවරුන්ටත් එන්න පුළුවන්. ඒක හින්දා මේක ක්‍රියාත්මක කරන්න. අපේ නිලධාරි මහත්වරු ඉන්නවානේ ඒකට. වැඩ පරිපාලකවරයත් ඉන්නවා, තාක්ෂණ නිලධාරීනුත් ඉන්නවා. ඒක ඒ අය කරාවි.

**20.** වැලිපිටිමෝදර සුසාන භූමියේ ආරක්ෂිත වැටක් ඉදිකර, ගේට්ටුවක් සවිකර එම සුසාන භූමිය පාවිච්චි කිරීමේදී ක්‍රමවේදයන් අනුව පාවිච්චි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කියන්නේ මෙහෙමයි. දැන් වැලිපිටිමෝදර සුසාන භූමිය තියෙනවා. තමන්ට ඕන පරිදි මිනිස්සු ඒක කරනවා. අපේ සභාවෙන් කිසි අවසරයක් ගන්නේ නැහැ. තමන්ට

ඕන පරිදි ඒ ස්ථානවල තැන්පත් කරනවා, මිහිදන් කරනවා. ඒ හැමදේම කරනවා. හැබැයි එක ක්‍රමයක් නැහැ. ඒක අවිධිමත්, මෙහෙට සල්ලි ගෙවන්නෙත් නැහැ. මොනවත් නැහැ. කාලයක් යනකොට වැලිපිටිමෝදර සුසාන භූමියෙන් ප්‍රයෝජනයක් ගන්න බැරිවේවි සභාවට. එම නිසා මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. දැන් හපුගල සුසාන භූමියට කරා වගේම මේකටත් ඒ උදවුව කරන්න. අපි වෙනුවෙන් ඒ පැත්තට ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක අපේ මුදල් වලින් නෙමෙයි කරේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒක තමයි කොහෙන් හරි කමක් නැහැ අපිට සල්ලි ටිකක් ගෙනත් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 21.** බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ කොවිඩ් රෝගය පාලනය කිරීමට විෂබීජහරණය ඇතුළු අනෙකුත් ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡාකර ක්‍රමවේදයන් ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථීර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒක ගැන අපි සාකච්ඡා කරා. ඒ සාකච්ඡා කරපු ටික ඒ විදියට ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 22.** එගොඩවත්තේ සිට මුත්තෙට්ටුවගේ වත්ත හරහා අදහන්දොළ දක්වා වූ කාණු පද්ධතිය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථීර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 23.** පියදිගම ග්‍රාම සේවා වසමේ, වටරැක බටහිර, පොළොන්ඕවිට මහතාගේ නිවස අසළින් ඇති ඇළ මාර්ගය ඇතුළු සියලු ඇළ මාර්ග පිළිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථීර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මෙවරත් ගංවතුරට සම්පූර්ණයෙන්ම ඒ ප්‍රදේශය යටවුණා. එක්ස්කැවේටර් යන්ත්‍රයක් අපිට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථීර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 24.** කලේගාන පොළ පිහිටා ඇති භූමියේ ඉදිවන වෙළඳ සංකීර්ණයේ ලංකා සතොස සුපිරි වෙළඳසැලක් සඳහා ඉඩකඩ වෙන්කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථීර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒක තාම හදලා නැහැ. මම සතොස වෙළඳසැල ගැන කතා කරේ මේකයි. හපුගල, වටරැක, වක්වැල්ල කියන මේ ප්‍රදේශ වලට සතොසක් නැහැ. දැන් සතොසෙන් තමයි අපිට අඩුවට භාණ්ඩ ගන්න පුළුවන් වෙලා තියෙන්නේ කියලා අපි හිතන්නේ. භාණ්ඩ තියෙන්නෙත් ඒ තැන්වල. නමුත් අපිට සතොස වෙළඳසැලක් නැහැ භාණ්ඩ මිලදී ගන්න. ඒක නිසා සතොස වෙළඳසැලක් ආරම්භ කිරීමට තමයි මම යෝජනා කරේ. ඒකට අවස්ථාව දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකට අවස්ථාවක් දෙන්න බැහැ සුගත් මන්ත්‍රීතුමා. මෙතනදී ඒකට අවස්ථාවක් දෙන්න බැහැ. අපි වෙළඳ අරමුණකින් තමයි මේක කරගෙන යන්නේ. ඒ නිසා අපි සල්ලි වලට තමයි මොකක් වුණත් කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** සල්ලි වලට තමයි, නිකං දෙන්න එපා. සතොසට වුණත් කමක් නැහැ සල්ලි වලට දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම තමයි දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යන විදියට පොලී වාරිකය විතරක් රුපියල් ලක්ෂ හයක් විතර අපිට ගෙවන්න වෙනවා අපි ලබා ගන්න ණය මුදලට. ඒ නිසා මේ විදියට තමයි මේක කරන්න වෙන්නේ. නොමිලේ නම් දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** යෝජනා කරේ මුදලක් අරගෙන ඒක දෙන්න. නිකං දෙන්න ඕන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 25.** පියදිගම, කිංග්ස්කෝට් වෙන්දේසි ඉඩමේ සභාව සතු භූමියේ වැට ගසා පැළ වර්ග සිටුවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කිංග්ස්කෝඩ් වෙන්දේසි ඉඩමේ සභාවට අයිති ඉඩම් කැබැල්ලක් තියෙනවා. ඒ ඉඩමේ දැන් පස් කප කපා යනවා. ඒකෙ ආරක්ෂිත වැටක් ඉදිකරන්න. ලොකු ඉඩමක් තියෙනවා. පැල හිටවන්න ඒකෙ. වන වගාවක් විදියට පැල හිටවන්න මම යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තුසිත මන්ත්‍රීතුමා නැති නිසා ඒ යෝජනා ටික මම ඉදිරිපත් කරන්නම්.

**26.** වක්වැල්ල, තොටිවත්ත මාර්ගයේ ජල නල එලීම සඳහා කාණු කැපීමට කුලී පදනම මත ලබාගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 27.** වක්වැල්ල, තොටිවත්ත මාර්ගයේ පවුල් 25කට පමණ නල ජලය ලබා දීම සඳහා නල එලීමේදී මාර්ගය පළුදු වන බැවින් මෙය පොදු කටයුත්තක් සේ සලකා එම කාර්යය මුදල් ගෙවීමකින් තොරව සිදුකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පොදු නලයක්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රී ප්‍රතිපාදන වලින් කරන්න කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රී ප්‍රතිපාදන වලින් කරන්න සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේ යෝජනාව පිළිබඳව ඔබතුමාගේ අදහස පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පොදු නළයක්නේ යොදවන්නේ. එහෙම වුණාම ඒ යන වියදම අදාළ මන්ත්‍රීවරයාගේ ප්‍රතිපාදන වලින් කපලා දානවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නැත්නම් දන්නවානේ. හැමෝම සභාවෙන් ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සුභ දහවලක් වේවා සියළුදෙනාටම අද බොහොම සතුටු දවසක් මොකද, අවුරුදු තිහක් තිබ්බ්ච කුරිරු යුද්ධය අවසන් කරලා අදට අවුරුදු දොළහක් වෙනවා. ඒකෙ සතුට අපි සමරනවා. ඒකට උර දුන්න, ඒක නැති කරන්න උත්සාහ කරපු අපේ සෙබලුන්ට, විරෝධාර රණවිරුවන්ට සුභ අනාගතයක් වේවා කියලා ප්‍රාර්ථනා කරන්න මේක අවස්ථාව කර ගන්නවා.

**28.** කාණු කැපීමේදී පස් හා කුණු දැමීමට අවශ්‍ය නිසා සභාවේ ට්‍රැක්ටර් රථයක් ඒ සඳහා යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 29.** ඉසුරු පෙදෙසේ, මහවත්ත පාර අසළින් බැස යන කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 30.** කලේගාන පොළ භූමියේ ඇති වෙළඳසැල් කඩා ඉවත් කළ පසු කලේගාන උප තැපැල් කාර්යාලය වී.සී පාරේ ඇති කැටයම් මධ්‍යස්ථානය අසළ ඇති ඉඩකඩ අනුව කඩකාමරයක් ඉදිකර පවත්වාගෙන යාමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 31.** වීදි ලාම්පු සවිකිරීමේදී පවතින ගැටළු සහගත තත්ත්වයන් නිසා පහත දක්වා ඇති මාර්ගයන් වල ත්‍රීෆේස් බන්ඩල් වයර් යෙදීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීමට යෝජනා කරමි.

I. දෙණියවත්ත පාරට මීටර් 200ක් පමණ

II. වටරැක නැගෙනහිර, සිරි සෝභිත පාසලට දකුණු පසින් ඇති පාරට මීටර් 200ක් පමණ

III. ලැබුණගෙදර වත්ත පාරට මීටර් 150ක් පමණ

IV. ඉසුරු මාවතේ අවසාන කොටසට මීටර් 300ක් පමණ

V. නාගරුක්ඛාරාම පන්සල පාරේ වංගුව අසළ ඇති අතුරු මාර්ගයට මීටර් 200ක් පමණ

VI. මාම්පිටිය, කහගලවත්ත පාරට මීටර් 75ක් පමණ

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමාට මේක කියන්න ඕන. දිමුතු ඉංජිනේරුතුමා සමග මම මේ ගැන කතා කරා. එතුමා කිවුවා ප්‍රාදේශීය සභාව මගින් මේ ටික ඉදිරිපත් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒ වගේම ගරු සභාපතිතුමා කාණුවක් කපලා තියෙනවා අජිත් මහතාගේ ගෙවල් ගාව. ඒ නිසා ඊයේ පෙරේදා අම්මලා එහෙම මතක් කරා මන්ත්‍රීවරුන්ගේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කවුද ඒ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** අජිත් මහත්තයා. කට්ටියට මතක් වෙන්නේ නැහැ කියලා මතක් කරා. ඉතිං ඒක හින්දා ගරු සභාපතිතුමා මට ඒකට උත්තරයක් ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මොකටද.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** අර අජිත් මහත්තයලගේ කාණුව කැපුවානේ. එතනදී දැන් ආපහු ඒ වතුර ටික ඒ මිනිස්සුන්ගේ ගෙදරට එනවා. අරගොල්ලන්ගේ ඔක්කොම ටික හරිගස්සවගෙන තියෙන්නේ. ඒ මනුස්සයයි, තව ගෙවල් දෙක තුනක අයයි පොඩි අපහසුතාවයකට පත් වෙලා තියෙනවා. තාක්ෂණ නිලධාරිතුමිය ගිහින් මේක බැලුවා. මේකට මොකක්ද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාණුව කොන්ක්‍රීට් කරමු.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒකට මොකක් හරි කරලා දෙන්න. ඒ මිනිස්සුන්ගේ කුණු ටිකයි, ඔක්කොම එනවානේ. නැත්නම් විකල්ප කාණුවක් හරි ගස්සවලා දෙන්න ගරු සභාපතිතුමා. මට ඉන්න හම්බ වෙන්නේ නැහැ ඔයගොල්ලෝ ඒ කරපු වැඩෙන්. මගේ අම්මත් මතක් කරනවා.

ගරු සභාපතිතුමා, දැන් කොරෝනා හැදිච්ච ගෙවල් නිරෝධායනය කරනවා එක පාරටම ඇවිල්ලා. ඔබතුමන්ලා සභාවේ තීන්දු තීරණ ගන්න ඒවාට සහයෝගය දෙන්න ඕන කියලා. දැන් වටරැක නැගෙනහිර ගෙවල් තුනක් එකපාරටම නිරෝධායනය කරා. ඒ මිනිස්සුන්ට කන්නවත් වැඩපිළිවෙලක් ඇත්තේ නැහැ. රජයෙන් ඒක දෙනවා. ඒක මම නැහැ කියන්නේ නැහැ. නමුත් ඒක දෙන්නේ නිරෝධායනය ඉවර වුණාට පස්සේ. ඒකෙන් මේ මිනිස්සු අපහසුතාවයට පත් වෙනවා. ඒක හින්දා අපි සමාජ සේවකයෝ හැටියට, අපි කළගුණ දන්න මිනිස්සු හැටියට, අපේ සභාවෙන් මොකක් හරි තීන්දුවක් අරගෙන ඒ මිනිස්සුන්ට උදවුවක්, උපකාරයක් කරන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා නැති නිසා ඒ යෝජනාව මම ඉදිරිපත් කරන්නම්.

**32.** සභා බල ප්‍රදේශය තුළ කසළ එකතු කිරීමේදී කසළ වර්ගකිරීම පිළිබඳව ජනතාව දැනුවත් නොමැති බැවින් ගැටළු පැන නැගී ඇත. එම නිසා මේ පිළිබඳව ප්‍රචාරක ක්‍රමයක් මගින් ජනතාව දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තුසිත, චන්ද්‍රකුමාර, ඩඩ්ලි, සංජීවනි යන මන්ත්‍රීවරුන්ට නිවාඩු අනුමත කරන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 33.** කොවිඩ් 19 වසංගතය රට පුරා පැතිරී පවතින කාලසීමාව තුළ සභාවේ දෛනික කුණු එකතු කරන කම්කරුවන් සහ සියලුම කම්කරුවන් සඳහා පී.සී.ආර්. පරීක්ෂණ ඇතුළුව මුව ආවරණ සහ සෞඛ්‍ය ආරක්ෂිත ඇඳුම් කට්ටල ලබාදෙන ලෙස සභාවට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මගේ පළවෙනි යෝජනාව සම්බන්ධව මම හිතන්නේ සභාව ආරම්භයේදීම සභාපතිතුමා විසින් කතා කරා. ඒ යෝජනාව ආදාහනාගාරයේ යෝජනාවට කලින් ගන්න පුළුවන් වුණානම් ඒක වටිනවා. මොකද අපි පැය ගාණක් කතා කරේ ආදාහනාගාරය ගැන. මේ වසංගතය ගැන කතා කරන්න අපි පැයක්වත් ගත්තේ නැහැ. ඒක හින්දා මම හිතන්නේ වැදගත් වෙන්නේ මුලින්ම අපි පැය ගාණක් මේක ගැන කතා කරානම්. හඳුනන්නේවත් නැති වෛරසයක් එක්ක තමයි අපි ජීවත් වෙන්නේ. ඒකෙ දෙවෙනි පියවරට තමයි ඔබතුමන්ලා උපරිම උත්සාහය ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** පළවෙනි යෝජනාවේදී අපි පැයකට වඩා සීමාවකට කතා කරේ නැහැ කොරෝනා සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි ඔබතුමාට එහෙමද ඕන. දැන් අපි සභාව පටන් ගත්තෙම මේකෙන් නෙමෙයිද මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔව්. පටන් ගත්තේ මේකෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ කුප්ප වැඩ. ඉතිං වැඩේ කරන්නකෝ. දැන් කිව්වානේ ඔබතුමා මේක කතා කරන්න ඉස්සෙල්ලාම, මේක ඉස්සෙල්ලා කතා කරන්න ගනිපු එකද වැරැද්ද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** වැරැද්දක් නෙමෙයි. ඒක හරි. මම කියනවා ඒක හරියි කියලා. හැබැයි ඒකෙ තියෙන ප්‍රශ්න ගාණේ කතා කරන කොට ඔබතුමාට හරි ඉක්මනක් තිබුණානේ. මේක ඉක්මනට ඉවර කරලා ඊළඟ යෝජනා වලට යන්න ඕනකම තිබුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඊළඟ මන්ත්‍රීවරයාගෙත් තියෙනවා ඔය යෝජනාව. ඉන්දික මන්ත්‍රීතුමාගෙත් තියෙනවා ඔය යෝජනාව. අපි මුලින්ම පටන් ගත්තෙත් ඕක. සියළු මන්ත්‍රීවරුන්ට ඕකට අවස්ථාව දුන්නා. ඔබතුමා ඒ වෙලාවේදී කතා කරා ඕක ගැන. දැන් ඉතිං අපි පළවෙනි එකට තීරණයක් ගත්තානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** පළවෙනි එකට තීරණයක් ගනිපු එක නෙමෙයි මම මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේක ගැන කතා කරන්න තිබුණ වෙලාවයි, අදාහානාගාරයට දුන්න වෙලාවයි බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ආදාහනාගාරය හදන එක කතා නොකළ යුතුද, ඔන්න දැන් තමයි සුගත් මන්ත්‍රීතුමා බළලා මල්ලෙන් එළියට පැන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කතා කරන්න ඕන තමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බළලා මල්ලෙන් එළියට පැන්නේ දැන්. ඔබතුමා අනුබලය දුන්නේ ඔන්න ඕකට. ලියනගේ මන්ත්‍රීතුමා අනුබලය දුන්නේ ඔන්න ඕකට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපි දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනුබලය දුන්නේ ඕකට. ඔන්න මෙයාට අදාහනාගාරය පිළිබඳ ගැටළුව තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** නැහැ. ඒකෙ ගැටළුවක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගැටළුව ඒක තමයි. ඔය දැන් කියන්නේ ඒකනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ආදාහනාගාරය හදන්න ඕන තමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. ඔබතුමා පළවෙනි යෝජනාව කියන්නකෝ. ඔබතුමා පැයක් කතා කරන්නකෝ. ඕන තරම් කතා කරන්න ඒ ගැන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** පළවෙනි යෝජනාව ගාණේ ඔබතුමන්ලා කතා කරානේ. මම කියන්නේ ඒකට ඔබතුමා කතා කරන කොට කිව්වානේ, සභාව අතරමගදී මැදිහත් වුණොත් මේකට ඊළඟ යෝජනාවේදී කතා කරමු කියලා. අපි ඊළඟ යෝජනාවට යමු කියලා කිව්වා. ඊළඟ යෝජනාව තිබුණේ ඔබතුමාගේ. ඒක ආදාහනාගාරය ගැන. එතකොට අපි අහන්නේ මෙහෙමයි. ආදාහනාගරය ගැන කතා කරන්න ඕන. ඒක හරි. හැබැයි ඒකට ඔබතුමා පැය තුනකට වැඩිය කාලය ගත්තා. එතකොට මම ඔබතුමාගෙන් අහන ප්‍රශ්නය මේකයි. දැනට මේ රටේ තියෙන වැදගත් ප්‍රශ්නය කොරෝනා ප්‍රශ්නයද, ආදාහනාගාරයද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්න කියන්න. මෙහෙමයි මන්ත්‍රීතුමා. විහිළු සපයන්න එපා. ඔබතුමා මේක පටන් ගනිද්දි මොකක්ද කිව්වේ කියලා කියන්නකෝ. ඔබතුමාගේ යෝජනාවලිය පටන් ගනිද්දි මොකක්ද කිව්වේ. මේක කතා කරා. මේකට තීන්දුවක් ගත්තා. මේක හරියි කියලනේ කතා කරේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං එහෙමනම් තව මොනවාද කතා කරන්නේ. එහෙමනම් මම කිව්වා දෙවෙනි එකට යමු කියලා. ඒක නෙමෙයිද වුණේ. ඔබතුමාගේ දැන් පළවෙනි එක ඕන නැහැ. දෙවෙනි එක කියන්න. ඔබතුමාමනේ ඒක කිව්වේ. ඔබතුමන්ලාගේ කුප්ප වැඩ නිසා තමයි මන්ත්‍රීතුමා කෙලවිලා තියෙන්නේ. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපිට කෙලවිලා තියෙන්නේ. ඔබතුමන්ලාටත් කෙලවෙනවා ඉස්සරහට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා දේශපාලන බංකොලොත්භාවයට පත් වෙලා තියෙන්නේ ඔන්න ඔය කුප්ප වැඩ හින්දා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමාට ඕනකම තිබුණා මේ වසංගතය අස්සේ හරි මේක අනුමත කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම. මම ඒක නැහැයි කියන්නේ නැහැ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අද සභාව පටන් ගත්තේ මොකකින්ද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමා සභාව පටන් ගත්තේ කොවිඩ් සම්බන්ධව වචනයක් දෙකක් කතා කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකකින්ද පටන් ගත්තේ. රුපියල් ලක්ෂයක් වෙන් කරා ඉස්සෙල්ලම රෝහලට. අපේ ක්‍රමවේදයක් හදන්නත් කතා කරා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව පටන් ගනිද්දිම කිව්වා මේකට තීරණයක් ලැබුණා දෙවැනි එකට යමු කියලා. එහෙම කිව්වද, නැද්ද, මම කිව්වා දෙවෙනි එකට යමු කියලා. එතකොට ඔබතුමා කියනවා මේ ගැන එච්චර ලොකු වුවමනාවක් නැහැ කියලා. ඔබතුමාගේ ආදාහනාගාරය ඉදිකරගන්නයි වුවමනාව තියෙන්නේ කියලා කිව්වා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම අහන්නේ ඒක නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ වෙලාවේදී ප්‍රමුඛතාවය දෙන්න ඕන කාරණය මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රමුඛතාවය දෙන්න ඕන කාරණය කතා කරානේ මන්ත්‍රීතුමා. දැන් ඔබතුමාගේ තව දේවල් කතා කරන්න තියෙනවානේ. එතකොට මෙතුමා කිව්වේ මේකට තීන්දුවක් හම්බවුණා කියලා. එහෙම තීන්දුව හම්බවුණා කියලා කිව්වේ නැද්ද කියන්නකෝ. මෙතුමා තීන්දුව හම්බවුණා කියලා දැන් කියනවා මෙතුමා මේක දෙවැනියට දාලා කතා කරනවා, මේක කතා කරන්න අවශ්‍ය නැහැ කියලා මම කියනවා කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම ඒක නෙමෙයි කියන්නේ. ඔබතුමාට ප්‍රමුඛතාවය දෙන්න තිබුණ කාරණයක් මේක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාවට තිබුණ ප්‍රමුඛතාවය ආදාහනාගාරයට දුන්න ප්‍රමුඛතාවය තරම් දුන්නේ නැහැ කියලා මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලම කතා කරේ මේ ප්‍රශ්නයනේ. අපි ඒකට තීන්දු ගත්තානේ. කරාපිටිය රෝහලට රුපියල් ලක්ෂයක් දෙන්නයි, අපේ සේවකයන්ට ඇඳුම් දෙන්නයි ක්‍රමවේදයක් හදන්න අපි තීන්දුවක් ගත්තානේ. ඔබතුමා එන්න කලින් අපි ඕක කතා කරානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කතා කරන කොට ඔබතුමා කිව්වේ මේක කතා කරා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත්, අනවශ්‍ය විදියට ආදාහනාගාරය ගැන මේවා එක පස්සට තියලා කාලය වෙන් කරලා අපි තීන්දුවක් ගත්තානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි ඇහුවේ ඒක නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි කියන්නේ කොවිඩ් ප්‍රශ්නය ගැන පැය දෙක තුනක් කතා කරලා ආදාහනාගාරය ගැන පැයක් දෙකක් කතා කරා නම් ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. කොවිඩ් ප්‍රශ්නය ගැන අපි සභාව දවසටයි, තව සතියක් විතරත් කතා කරමු, අපිට මේක විසඳන්න පුළුවන්ද කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තමයි දැන් මේ රටේ තියෙන මූලික ප්‍රශ්නය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රටක මූලික ප්‍රශ්නය අපිට විසඳන්න පුළුවන්ද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපිට විසඳන්න පුළුවන් ප්‍රමාණයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒකට අපි සභා තීන්දු ගත්තානේ. අපිට විසඳන්න පුළුවන් විදියට ඒකට තීන්දු ගත්තානේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 34.** බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ දෛනිකව අසාදනය වන කොරෝනා රෝගීන් සහ මරණ ජනතාවට නිශ්චිත වශයෙන් ජනතාවට දැන ගැනීමට නිසි තොරතුරු ලබාදෙන ලෙසට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකතුමාට දන්වන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් මෙහෙමයි මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා කියන ඒවා මේකෙ කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මෙන්න මේක තමයි වැරදිම දේ. ඇත්තටම පළිවතුගොඩ ග්‍රාමසේවා කොට්ඨාශයේ ඉන්න ආසාදිතයෝ ප්‍රමාණය එහේ ඉන්න මිනිස්සුවත් දන්නේ නැහැ. ඉතිං මේ මිනිස්සු මේවට පරිස්සම් වෙන්නේ නැහැ. මේවාට මිනිස්සුන්ට පරිස්සම් වෙන්න අඩුම ගාණේ මේ ක්‍රමවේදය හදන්න ඕන. දැන් දූවවත්තේ මරණයක් වුණා. සති දෙකකට විතර පස්සේ තමයි ඒ මරණය එළියට එන්නේ. එතකොට මිනිස්සුන්ට මේ ගැන අවධානයක් නැහැ. මේ රෝගය මොකක්ද කියලා මිනිස්සු දන්නේ නැහැ. මිනිස්සු අවධානමක් ගන්නේ නැතුව ඉබාගාතේ යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා අපි මේක වගකීමෙන් කියන්නේ. නිශ්චිත රෝගීන් සංඛ්‍යාව ඒ විදියටම වාර්තා කරලා තියෙනවා. කොහොමද ඔබතුමා ඒක නැහැ කියන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමාට කියන්න පුළුවන්ද බෝපෙ පෝද්දල කොච්චර ඉන්නවාද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මට කියන්න බැහැ. මම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගෙන් අහලා ඒක කියන්නම්. මට දැන් කියන්න බැහැ. මේ මොහොතේ ආසාදිත වෙච්ච අය ඉන්නවා. මට කියන්න බැහැ ඒකට මෙන්න මෙච්චර ගාණක් ඉන්නවා කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේකෙ තියෙන අවධානම ඔබතුමන්ලා අරගෙන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපොයි ඔව්. ඔබතුමන්ලා විතරයි ඒ අවධානම අරගෙන තියෙන්නේ. ඔබතුමන්ලා විතරයි මේ ඔක්කොම කරන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක අපි ගන්න ඕන කමක් නැහැ. ඒක ඔබතුමන්ලා විසින් අරගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මොකටද ඒක අරගන්නේ. මම මොකටද අවධානමක් අර ගන්නේ, මම සභාවෙන් කරන්න පුළුවන් දේ කරනවා ඇරෙන්න. මම කොවිඩ් අවධානම අරගන්නේ නැහැ. අපි ඒ අවධානම ඔබතුමන්ලා හිතන්නත් කලින් අරගෙන තියෙනවා. අපේ සේවකයෝ යොදවලා සියළුම ආයතන විෂබීජහරණය කරලා තියෙනවා. එක කෝල් එකයි දෙන්නේ. අපි අද උදේ ගිහින් විෂබීජහරණය කරලා තියෙනවා. ඔබතුමන්ලා කවදාවත් මෙහෙට ඇවිල්ලා අහලා නැහැ මේක කරන්නේ කොහොමද, මේක කොහොමද කරන්න ඕන කියලා. බොරුවට සභාවේදී චෝදනා කරනවා. ඔබතුමන්ලා මේ අනවශ්‍ය මාතෘකා ගේන්න එපා මන්ත්‍රීතුමා. සද්භාවයෙන් කියන්න මේක කොහොමද කරන්න ඕන කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කරන්න ඕන දේ කියන්න. මාසෙකට දවසක් ඇවිල්ලා බොරුවට කතා කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ බොරුවට කෑ ගහනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අනවශ්‍ය යෝජනාවක් නෙමෙයි මේක. සභා බලප්‍රදේශයට බලපාන යෝජනාවක් මේක. මේක අනවශ්‍ය යෝජනාවක් වෙන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කරන යෝජනාවක් කරලා ඉවර කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අනවශ්‍ය යෝජනාවක්නේ. ''බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ දෛනිකව අසාදනය වන කොරෝනා රෝගීන් සහ මරණ ජනතාවට නිශ්චිත වශයෙන් ජනතාවට දැන ගැනීමට නිසි තොරතුරු ලබාදෙන ලෙසට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකතුමාට දන්වන ලෙස යෝජනා කරමි.'' ඒක දන්නවානේ. ඊයේ දවස ගැන බලාගන්න පුළුවන්. ඊයේ දවසේ ගාල්ල දිස්ත්‍රික්කයේ

දෙසීය අසූ නව දෙනයි. එතනින් බෝපෙ පෝද්දල තිස් නම දෙනෙක්ද කොහේද ඉන්නවා. ඒක දවසින් දවස දැනුම් දෙනවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** උප සභාපතිතුමා උදේ කිවුවා පලිවතුගොඩ ග්‍රාම සේවා කොට්ඨාශයේ තිස් හත් දෙනෙක් ඉන්නවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මටත් කියන්න පුළුවන් හපුගල පනහක් ඉන්නවා කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තමයි අපි කියන්නේ මිනිස්සුන්ට හරි දේ දැන ගන්න දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා නිල ප්‍රකාශ නෙමෙයි මන්ත්‍රීතුමා. ඔබතුමා ඒ බාල තැනට වැටෙන්න එපා. ඒක අපිට කරන්න බැහැ. මෙතන සභාපති විදියට ඔබතුමා මගෙන් බලාපොරොත්තු වෙන්නේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂකට කියන්න කියලා බෝපෙ පෝද්දල කී දෙනෙක්ද ඉන්නේ කියලා කියන්න කියලා. විහිළු සපයන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ලංකාව පුරාම ඒක වෙන්න ඕන සභාපතිතුමා. ඔබතුමා විතරක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිරෝධායනය වෙන හැම කෙනෙක්ම කොවිඩ් රෝගියෙක් නෙමෙයි. ඔබතුමා මේ ගාණ කියන්නේ පලිවතුගොඩ නිරෝධායනය වෙන අයත් කොවිඩ් රෝගින් කියලා හිතා ගෙනද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක උප සභාපතිතුමා කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක උප සභාපතිතුමා එක්ක බේර ගන්න. එතුමා ඒක කිවුවා නම් ඒක ගැන එතුමා එක්ක බේර ගන්නකෝ. එහෙම ප්‍රශ්නයක් නැහැ. නිරෝධායනය වෙන අය ආසාදිතයෝ වෙන්නේ නැහැ. එහෙම කොහොමද වෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙම නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිරෝධායනයට ලක් වෙන හැමදෙනාම කොවිඩ් රෝගීන් නෙමෙයි. ඔබතුමා ඒක දන්නේ නැත්නම් දැන ගන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොවිඩ් රෝගියෙක් කියන්නේ කොවිඩ් 19 රෝගය වැළඳිලා ගෙයින් එළියට අරන් ගිහින් වෙනම රෝහල් වල හරි, වෙන තැන්වල හරි ප්‍රතිකාර ලබන අය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** නැහැ සභාපතිතුමා. පී.සී.ආර්. පරීක්ෂණය කරාට පස්සේ තමයි දන්නේ කොවිඩ් රෝගියෙක්ද, නැද්ද කියලා. එතකම් ඒක කියන්න බැහැනේ. අපි කියන්නේ දෛනිකව කරන පී.සී.ආර්. පරීක්ෂණ වලින් එන වාර්තාවේ සත්‍ය වාර්තාව එළියට දෙන්න කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවාද, අද පි.සී.ආර්. පරීක්ෂණය කරාට අදම ප්‍රතිඵලය එන්නේ නැහැ මන්ත්‍රීතුමා. ඒක එන්න දවස් දෙකක් විතර යනවා. ඒක දවසෙන් එනවා, දවස් දෙකෙන් එනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒකට ක්‍රමවේදයක් හදන්න කියලා කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ක්‍රමවේදයක් හදලා තියෙන්නේ. ඒක අපි කර ගන්නම්කෝ. ඒකනේ ඕන. බෝපෙ පෝද්දල දිනපතා ආසාදිතයන් ගාණ කීයද කියලා මේ මන්ත්‍රීවරයාව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මාව නෙමෙයි ජනතාව දැනුවත් කරන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ජනතාව එහෙම දැනුවත් කරන්න ඕන නැහැ. ඒකට තමයි මාධ්‍ය තියෙන්නේ. ඔබතුමා මාධ්‍ය බලනවා නම් ඒක කියාවි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දූවවත්තේ සිදු වෙච්ච මරණය ගැන සති දෙකකට විතර පස්සේනේ මාධ්‍යයෙන් ලබා දුන්නේ. ඒක කොවිඩ් මරණයක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දන්නේ කොහොමද, දූවවත්තේ වෙච්ච මරණය ගැන සති දෙකකට පස්සේ දුන්නේ කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා වක්වැල්ලේ මරණයක් ගැන කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වක්වැල්ලේ මරණයක් ගැන කොහොමද කියන්නේ.

**ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඒ හපුගල එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ හපුගල එකක්. ඔබතුමා මොනවද මේ කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක හපුගල නෙමෙයි දූවවත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හපුගල එක ගැන ඒ කිවුවේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දූවවත්තේ මරණයක් වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දූවවත්තෙත් වුණා. හපුගලත් වුණා. ඔබතුමා කියන්න මෙහේ කීයක් වුණාද කියලා. හපුගල වුණා, දූවවත්තේ වුණා, ගොඩකන්දේ වුණා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේවා ගැන තොරතුරු දන්නේ නැහැ. ඒක නිසා තමයි කියන්නේ තොරතුරු ලබා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තොරතුරු දැන ගන්න ඕන නම් ඔබතුමා පත්තර බලන්න. රූපවාහිනිය බලන්න. ඒවාගෙන් තොරතුරු ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒවාගෙන් හරියට තොරතුරු දෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ යෝජනාවට යන්නකෝ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 35.** ගාල්ලේ සිට කපුහෙම්පල, ගිනිගල්තුඩුව, මැලිබන් මාවත හරහා තලගහ දක්වා ධාවනය වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථය නැවත ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව යවන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 36.** ගොඩදූව මාර්ගය දෙපස තණකොළ කපා පිළිසකර කරදෙන ලෙස සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේක නම් ඉතිං ආයේ කියලා වැඩක් නැහැ.

තව එකක් කියන්න ඕන. කපුහෙම්පලට එක දවසක් කම්කරුවෝ ආවා පාරක් සුද්ධ කරන්න. විජේපාල මහතා සමඟ ආවේ. ඒ වෙලාවේදී විජේපාල මහතා දුරකථන ඇමතුමක් දීලා මට කතා කරා. කම්කරුවෝ පස් දෙනෙක් ඇවිල්ලා හිටියා. මම ගියාට පස්සේ විජේපාල මහතා ඇහුවා මේ පාරද සුද්ධ කරන්න තියෙන්නේ කියලා. මම කිවුවා ඔව්, මේකත් එක්කම එහෙමනම් එහා පැත්තේ පාරත් සුද්ධ කරන්න කියලා. ඒකට තුන් දෙනයි, මේකට දෙන්නයි දැම්මා. හැබැයි වැඩේ නම් ඉවර කරලා තියෙනවා. එතනදී මම කියන්නේ නැහැ මේ කම්කරුවෝ වැරදියි කියලා. මම දෙපාරක් විතර එතනට ගියා. ඒ යන කොටත් මේ ගොල්ලෝ වැඩ. වැඩෙත් ඉවර කරලා තියෙනවා. මම දන්නේ නැහැ, එවලා තිබුණේ උප සභාපතිතුමා. මම මැදිහත් වෙලා මේ පාරට තුන් දෙනෙකුයි, අනිත් පාරට දෙන්නෙකුයි දාන්න කිවුවම ඒ වැඩේ කරලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඊළඟ එක තමයි සභාපතිතුමා මේක. මම ඔබතුමාට ඉදිරිපත් කරා මේ සම්බන්ධව. ඔබතුමාට දුරකථන ඇමතුමක් දීලා අදාළ මහත්මයා මේ සම්බන්ධව කතා කරලා තිබුණා. කුණු ගෙනත් දාලා කපුහෙම්පල කුඹුරක් ගොඩකරපු එකක් සම්බන්ධව ගොවිජන සේවා

කොමසාරිස්ව හමුවන්න ගියා. එතුමාට කොවිඩ් ආසාදිත වෙලා තියෙන නිසා මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න අමාරුයි කියලා තිබුණා සති දෙකක් යනකම්. හැබැයි ප්‍රශ්නය තියෙන්නේ මේ ගෙනල්ලා දාලා තියෙන කුණුගොඩ නිසා ඒ මිනිස්සුන්ට ගෙදරක ඉන්න බැහැ. මමත් එතනට ගියා. ඒ තරම් ගඳ ගහන කුණු ගොඩක් තමයි මේ ගෙනත් දාලා තියෙන්නේ. ඒ ගෙවල් දෙක තුනේම අයට ගෙවල් වල ඉන්න බැහැ. ඉතිං මේ සම්බන්ධව ඒ නිලධාරියා විසින් මට කිවුවා මේක සභාවට ඉදිරිපත් කරලා සභාවෙන් මොකක්ද මේකට කරන්න පුළුවන් බලන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපිට ගත හැකි ක්‍රියාමාර්ගයක් නැහැ. නමුත් මම තාක්ෂණ නිලධාරීව යවලා ඒක බැලෙව්වා. ඒක ගැන පොලීසියටත් දැනුම් දුන්නා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** පොලීසියට දැනුම් දීලා තියෙනවා 119 අමතලා. දෙකක් ගෙනත් දාන කොට ඒ මිනිස්සු පොලීසියට දන්වලා තියෙනවා. පොලීසියෙන් ඇවිත් ගියාට පස්සේ තව දෙකක් ගෙනත් දාලා තියෙනවා. තනිකරම ජරාවක් මේ ගෙනත් දාලා තියෙන්නේ. මම කියන්නේ මේ සම්බන්ධව පොඩ්ඩක් සභාව අවධානය යොමු කරලා මේ අයට විරුද්ධව ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ ගෙවල් කිහිපයක අයට ඉන්නම බැහැ එතන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** පිටින් කුණු ගෙනත් දාන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ කියන්නේ මේ ඉඩම අයිති කෙනා ගෙනත් දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එයා කොහෙන්ද ඒවා ගෙනාවේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තමයි දැන් ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ සභා බල ප්‍රදේශයට කොහොමද පිටින් ඇවිල්ලා කුණු දාන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එයාගේ කුඹුරක් තමයි මේ ගොඩ කරන්නේ. කපුහෙම්පල පාරේ යන කොට අතුරු මාර්ගයට හැරෙන කොට ඒක තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ කාගේ කුණුද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ මොනවද කියලා දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** මේ ගොඩදූව පාරද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගොඩදූව පාරට යන පාරෙත්, ඒකෙ පාරක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අක්මීමන සභාවේ ඒවාද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කාගේ ඒවාද කියලා දන්නේ නැහැ. නමුත් ගෙනල්ලා දාලා තියෙන්නේ එතනටනේ. මේ සම්බන්ධව මොනවා හරි පරීක්ෂණයක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට ගොවිජන සේවා එකෙන් නඩු දානවා කියලා අපේ තාක්ෂණ නිලධාරීට කිවුවලු.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක හරි. මේ කුණු ටිකට මොකද කරන්නේ කියලා ඒ අයට නිශ්චිතවම කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුණු ටික ගොඩදානවා ඉතිං නඩුව ඉවර වුණාම.

<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ සභා යෝජනා හැටියට යෝජනා තුනක් ඉදිරිපත් කරලා තියෙනවා. කොවිඩ් සම්බන්ධ කාරණය ගැන දිගින් දිගටම කතා කරා. මේ අවස්ථාවේදී මෙතන මතු වෙච්ච කාරණා ටිකකුත් එක්ක මම බොහොම කෙටියෙන් මේ ටික ඉවර කරන්න අවස්ථාව ඉල්ලනවා.

**37.** කොවිඩ් 19 වසංගත තත්ත්වය සමාජගතවී ඇති බැවින් බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් කැපවී සිටින ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය කාර්ය මණ්ඩලයේ රාජකාරි කටයුතු

සඳහා වන ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් පළාත් සභාවේ ආයතන සතුව පවතින සුදුසු වාහන කීපයක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත ලබාදීම සඳහා ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතන කොවිඩ් සම්බන්ධව දැනටමත් මත ගැටුම් ඇති වුණා. කොහොම වුණත් ඇත්තටම මේ වන විට අප බලප්‍රදේශයේ පන්සියයකට ආසන්න ගාණක් මුළු ආසාදිතයෝ ඉන්නවා. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් මම ගනිපු තොරතුරුත් එක්ක මේ තුන්වෙනි රැල්ල අවසාන භාගයේදී දෙසිය හැට ගාණක් ඉන්නවා. ඉතිං මේක සෑහෙන්න වේගයෙන් පැතිරෙමින් යන එකක් නිසා අපිට බලප්‍රදේශය තුළ ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගන්න. ඔබතුමන්ලා සාකච්ඡා කරපු පරිදි ඇත්තෙන්ම එහෙම සභාවේ සේවකයන්, බලප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ගත හැකි ආරක්ෂණ ක්‍රියාමාර්ග වලට සුදුසු ක්‍රියාමාර්ග ගන්න යොමුවීම හොඳයි කියලා මම හිතනවා.

සුගත් මන්ත්‍රීතුමා යෝජනාවක් කරලා තිබුණා කමිටුවක් දාලා කොවිඩ් සම්බන්ධව වන ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කරලා වැඩපිළිවෙලක් හදමු කියලා. ඒ යෝජනාව කරාට ඒකට අදාළව ක්‍රමවේදයන් සම්බන්ධයෙන් සාකච්ඡා වුණේ නැහැ. මේ යෝජනාවේදී ඒක සාකච්ඡා වුණා නම් හොඳයි මොකක්ද අපි කරන්නේ කියලා. දැන් එතුමා යෝජනා කරා ප්‍රාදේශීය සභාව ලෙස අපි මේකට මැදිහත් වෙන්න ඕන කොහොමද කියලා. සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළව මම ඒක යෝජනා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. අපිත් එක්ක ඒ අය සාකච්ඡා කරලා අපෙන් ඉල්ලපු හැම දෙයක්ම ලබා දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන්. ඊට අමතරව අපි වෙනම පෞද්ගලික මට්ටමෙන් පවා අපේ සේවකයෝ දෙන්නෙක්ව යොදවන්න යෝජනා කරා මිනිස්සුන්ට වෙන දේවල් වලට. නමුත් ඉතිං ඇත්තටම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා නිතරම ඉන්නේ ඒ අයගේ වෘත්තිය පැත්තෙන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ යෝජනාව කරේ එතුමලගේ පැත්තෙනුත් කතා කරලා සහ අපිටත් ඒක ගැන දැනිලා. ප්‍රවාහන පහසුකම් අවශ්‍යයයි. කාර්ය මණ්ඩලයට හදිසියේ ගිහිල්ලා මැදිහත් වෙන්න තියෙනවා. වාහන නැහැ ඒගොල්ලන්ට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. අපි ඒ අයගේ වාහන වලට ඉන්ධන දීමනාවක් ලබා දෙනවා. අපෙන් දෙයක් ඉල්ලුවොත් ඒක දෙනවා. දැන් අපිටත් වාහන නැතුව ඉන්නේ. කැබ් එක අළුත්වැඩියාවට දාලා. රියදුරන් නැහැ අපේ වැඩක් කර ගන්නවත්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ යෝජනාව කරේ අපේ වාහන දෙන්න නෙමෙයි. පළාත් සභාවේ අමාත්‍යාංශවල ඇත්තටම අතිරික්ත වාහන තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රමේෂ් පතිරණ ඇමතිතුමත් වාහනයක් දීලා තිබුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක කිවුවා. ඇමතිතුමා වාහනයක් දුන්නා කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මෙහෙමයි. ඒවා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඒ දක්ෂතාවයන් අනුව කර ගන්න ඕන. මම ඉල්ලුවා එතුමාගෙන් අපිට දෙන්න කියලා ඩිස්පොසිබල් ඕවරෝල් කට්ටල කිහිපයක්. අපි විෂබීජහරණයට යන්නේ ඒ අයට උදව්වටනේ. අපිට එයින් එකකට රුපියල් එක් දහස් පන්සීයක් වැය කරන්න බැහැනේ. නමුත් ඒ අයට ඒක පුළුවන්. එයාලට කතා කරලා ගන්නත් බැහැ, එයාලා කොහොමද අහනවා සභාවට අරන් දෙන්නේ. ඒ මට්ටමේ ඉන්නේ මන්ත්‍රීතුමා. අපි කොහොමද අපිටවත් දේවල් කර ගන්න බැරුව යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙම තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔතනට කතා කරන්න යන්නේ නැහැ. හේතුව ගොඩක් වැඩ කරන නිලධාරියෙක්. මේ වෙලාවේදී ඉන්න පීඩනයත් එක්ක, ගාල්ලේ ඇති වුණා වගේ

ප්‍රශ්නයක් මෙහේ ඇති වෙන හින්දා නිශ්ශබ්දව ඉන්නවා එතුමන්ලාගේ රාජකාරිය එතුමන්ලාට කර ගන්න දීලා. මම මේ වෙනකම් මාසයකින් විතර එතුමාට කතා කරේ නැහැ. ඒක මගේ අඩුපාඩුවක් වෙන්න ඇති. නමුත් මට ඊට වැඩිය මේ වෙලාවේදී වචනයක් හරි එහෙ මෙහෙ වුණොත් හොඳ නැහැ. උදාහරණයක් කියන්නම්. මේක මන්ත්‍රීවරු දැන ගන්න ඕන. අපි විශේෂ සභාවක් කැඳවන්න හැදුවා. මම නෙමෙයි, ලේකම්තුමා එතුමාට කතා කරලා තිබුණා. කීයටවත් ඕක කරන්න දෙන්න එපා, මෙහෙම මෙහෙමයි කියලා තිබුණා. මම ඕක ගැන එතුමා එක්ක කතා කරා නම් ඒක ආරවුලකට යනවා. ඊට පස්සේ මහා සභාව ගැන ඇහුවමත් කීයටවත් ඒකත් තියන්න එපා කියලානේ කිව්වේ. සභාව කීයටවත් කැඳවන්න එපා කියලා කිව්වා. මට ඒක කිව්වා නම් වෙනත් ආරවුලකට යනවා. ඒ මට්ටමෙන් අපිට යන්නත් බැහැ. එතුමන්ලා මේක දකින්නේ අනාරක්ෂිතයි කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමන්ලාගේ පැත්තෙන් ඒ වටපිටාවත් එක්ක එහෙම වෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් මෙහෙමනේ මන්ත්‍රීතුමා. අපිට එහෙම නම් ආණ්ඩුකාරතුමා ගිය සැරේ එව්වා වගේ එවන්න ඕන දූරස්ථභාවය තියා ගෙන සභාව කරන්න ඕන කියලා. නැත්නම් සභාව තියන්න එපා කියලා එවන්න ඕන. අපිට නිර්දේශයක් එවන්න ඕන සභාව තියන්න එපා කියලා. අපිට එහෙම එවන්නේ නැතුව කොහොමද මන්ත්‍රීවරුන්ට දීමනාවවත් ගෙවන්නේ. සභාවක් රැස්වෙන්නේ නැතුව එහෙම කරන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ නිර්දේශය ගන්න ඕන. අපිට මෙතන තීන්දුවක් ගන්න සමහර සීමාවල් ඇතුලේදී පුළුවන්. නමුත් මාසික සභාව රැස්කරන්නේ නැහැ කියලා පොදු තීන්දුවක් එන්න ඕන. එක්කෝ සෞඛ්‍ය නිර්දේශයන් අවශ්‍ය වෙනවා. ඒක හරි. මම මේ යෝජනාව කරේ ගරු සභාපතිතුමා පොදුවේ දැන් තියෙන ප්‍රශ්නය අනුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මෙහෙම කරමුකෝ. එතුමා මේ වෙලාවේදී බොහොම ලොකු ප්‍රශ්නයක ඉන්නේ කොවිඩ් රෝගීන් වැඩි වීම සම්බන්ධව. එතුමා අපෙන් ඉල්ලීමක් කරොත් අපිට දෙන්න පුළුවන් සහයෝගය දෙන්නම්. ඒ ඇරෙන්න අපිට බැහැ මන්ත්‍රීතුමා බෝපෙ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට වාහන දෙන්න කියලා කියන්න. ඒකට එතුමන්ලා අඩුපාඩු කියන්න ඕන. එතුමන්ලාගේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු ඉන්නවා. එතනින් ඉහළ අය ඉන්නවා. ඒ අය දැන ගන්න ඕන මේ ඉල්ලීම් කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ යෝජනාව කරේ මෙහෙමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මේකට ආණ්ඩුකාරතුමාට ලිපියක් යවන්න පුළුවන්. මෙන්න මේ බෝපෙ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට අවශ්‍ය දේවල් දෙන්න කියලා. නමුත් අපි හරහා නෙමෙයිනේ මන්ත්‍රීතුමා ඕවා යන්නේ. ඒ අයව එතනට සම්බන්ධ කරලා තිබුණොත් අපි ළඟ ඒ තොරතුරු මුකුත් නැහැ. අපි නිකං විහිළුකාරයෝ වගේ වෙනවානේ. ඒ අයගේ ආයතන අතර තියෙන සම්බන්ධතා වලට අපි නිකං මේ ආණ්ඩුකාරතුමාට ලියුම් යවනවා මෙහෙට වාහනය ලබා දෙන්න කියලා. අපිට එහෙම හැකියාවක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි මේකට ඉල්ලීමක් කරමු. මම ප්‍රශ්නය දැකපු නිසා එතුමන්ලා එක්ක කතා කරා. එතනදී එතුමන්ලාගේ පැත්තෙන් තියෙන ගැටළුව මෙන්න මේකයි. අපිට ප්‍රවාහන පහසුකම් නැති ප්‍රශ්නයක් තියෙනවා කියලා කිව්වද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ වෙලාවේ මන්ත්‍රීතුමා වාහන දහයක් එක ආයතනයකට තිබුණත්, ඒක මදි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ වෙලාවේ පළාත් සභාවේ වාහන තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයගේ වැඩ කොටසක් අපිත් කරනවානේ මන්ත්‍රීතුමා. දැන් ඒ අයගේ බරපතල වැඩ කොටසක් අපිත් කරනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැනට එයාලට තියෙනවා කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඉල්ලීමක් කරොත් අපි ඒකට උදවු කරන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපේ බලප්‍රදේශය තුළ දෛනිකව පී.සී.ආර්. පරීක්ෂණ ප්‍රමාණයක් කරනවා. සාමාන්‍යයෙන් බැලුවොත් හතළිහක් විතර වගේ තමයි යන්නේ. මේකෙ හරි ප්‍රමාණයක් නැහැ.

එතුමා එක්ක මම සාකච්ඡා කරන කොට ඇහුවා මොනවද දැනට තියෙන ගැටළු ටික කියලා. ඉතිං ඒ වෙලාවේදී හදිසියේ සාකච්ඡා කර ගන්න බැහැ. ඒ නිසා අපිට පුළුවන් මේ මැදිහත්වීම කරන්න. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සහයෝගය විතරක් මදි. මේකෙදී පීඩාවට පත් වෙන්නේ බලප්‍රදේශයේ ජනතාව. හෙට දවසේ තත්ත්වය අපිට තක්සේරු කරන්න බැරි මට්ටමක් තියෙන්නේ. අපි මොන දේ කිවුවත්, මොන මට්ටමකින් මේක කරන්න හැදුවත් අවධානමක් තියෙනවා. ඒකට අවබෝධයක් ඇතිව අපි මැදිහත් වෙන එක තමයි හොඳ සභාවක් හැටියට. මේක ඔබතුමාටත් වැදගත්. ඔබතුමා මේ බලප්‍රදේශයේ මූලිකයා. එතකොට ඔබතුමාට ඒ වගකීම තියෙනවා. ඒක කවුරුවත් පවරන්න ඕන නැහැ. ඒ වගකීම ජනතාව විසින් ඔබතුමාට පවරලා තියෙනවා. ඕකට මැදිහත්වීමක් කරන්න. ඒක අපිට කරන්න පුළුවන්. මේකට දේශපාලනයක් අදාළම නැහැ. මේක අතිශය බරපතල තත්ත්වයක්. ඒ නිසා අපිට කරන්න පුළුවන් මැදිහත්වීම අපි කරමු. සභාපතිතුමා ඔබතුමාගේ පැත්තෙන් මේකට සද්භාවයෙන් මැදිහත් වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 38.** අප බල ප්‍රදේශයේ ජීවත්වන 2015 - 2019 කාලය තුළ විශ්‍රාම ගැන්වූ රජයේ සේවකයන් වෙනුවෙන් 2020-01-01 දින සිට ලැබිය යුතු විශ්‍රාම වැටුප් පියවර, හිඟ වැටුප් සහිතව ලබාදීම සඳහා ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඒකට හේතුව තමයි අපේ බලප්‍රදේශයේ ජීවත් වෙන විශ්‍රාමික ප්‍රජාවක් ඉන්නවා. ඉතිං මේ අයට 2020-01-01 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් නිවැරදි පියවරේ තබලා ගෙවීම් කරලා නැහැ. ප්‍රධාන පත්‍රයේ සඳහන් කරලා තියෙනවා 2020-01-01 දින ඉඳන් ඒ විශ්‍රාම වැටුප් පියවරේ තබන්න කියලා. නමුත් මේක මේ වන තෙක් අත්හිටුවලා තියෙනවා. මේක බරපතල කාරණයක්. මිනිස්සු සමහර වෙලාවට පවුල් නඩත්තු කරන්නේ මේ විශ්‍රාම වැටුපෙන්. රස්සාවෙන් පස්සේ විශ්‍රාම වැටුප අඩු වුණාම තියෙන පීඩනය අපිට දැනෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ අර්ථයෙන් තමයි මම මේ යෝජනාව කරන්නේ. මේකට සභාව පැත්තෙන් දායකත්වය ලබා දීලා ඒ දැනුවත් කිරීම කරලා ජනතාව වෙනුවෙන් පෙනී හිටින්න කියලා තමයි මේ යෝජනාවේ තියෙන්නේ.

**39.** නරාවල - මුලන මාර්ගයේ කොහොඹනාදෙණිය ප්‍රවේශයේ ඇති අබලන් බෝක්කුව වෙනුවට පෙට්ටි බෝක්කුවක් යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.

මේක ගැන මම හිතන්නේ ඔබතුමත් දන්නවා. චනක මන්ත්‍රීතුමත් පැහැදිලිව ඒක දන්නවා. ඔබතුමා ගිහිල්ලා බැලුවා මේක.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඊයෙත් ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ ඉංජිනේරුතුමා එක්ක ගිහින් අපි ඒක බැලුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ප්‍රධාන පාරේ තියෙන නිසා ගරු සභාපතිතුමා පෙට්ටි බෝක්කුවක් දාලා හදන්න පුළුවන්නම් වඩා හොඳයි. මේ වෙලාවේදී පාර හදන්න කලින් ඒක කරනවා නම් තමයි වඩා හොඳ. මම දන්නේ නැහැ ඒකට ඔබතුමාගේ අදහස මොකක්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ පොඩි අර්බුදයක් තියෙනවා. මාර්ගය සංවර්ධනය කරන්නේ, මාර්ග සංවර්ධන අධිකාරියෙන්. නමුත් මේ මාර්ගය අයිති වෙන්නේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට. එහෙම ප්‍රශ්නයක් ඊයේ මතු කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක නිරවුල් කරන්න බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ අපි ඒකට කතා කරලා තීන්දුවක් ගන්න කියලා අදාළ දැනුම් දීම කරලා ආවේ. ඊයේ අපි චමිලා ඉංජිනේරුවරිය සමඟ ඒක බලන්න ගියා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේ සම්බන්ධීකරණය කරොත් ඒක කර ගන්න පුළුවන් වේවි සමහර විට. ගරු සභාපතිතුමනි, මේකට නැවත වියදමක් කරන එක අපරාදේ. පාර හැදුවට පස්සේ ඒක කරන එක අපරාදේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක එහෙම වෙන්නේ නැහැ. ඒකට ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම මේක කියනවා. මේ පාරවල් සම්බන්ධව සහ අනෙකුත් දේවල් සම්බන්ධව ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් තියෙනවා. ඔබතුමා දන්නවා හපුගල අර වෙන්දේසි කරන්න යෝජිත ඉඩම පිළිබඳව. ඒක අපිට යෝජනා කරලත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනා කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නමුත් අපිට දිගින් දිගටම මග හැරිලා තිබුණ තැනක් ඔය. ඒකෙ මාර්ග සංවර්ධන අධිකාරියෙන් කරපු සංවර්ධනයේදී මාර්ගය දෙපස ඉදිකරපු කාණු පද්ධතිය ඉතාමත් අක්‍රමවත් විදියට තියෙන්නේ. ඒක ගැන ඔබතුමා පෞද්ගලිකව දන්නවා. මම හිතන්නේ මේ කාරණය ගැන මම පැහැදිලි කරන්න වුවමනාවක් නැහැ. මම මේක ගැන පැහැදිලි කරන්නේ සභාවට විතරයි. ඔබතුමා විශේෂයෙන්ම පෞද්ගලිකවත් මේකට මැදිහත් වුණා. කීප පාරක්ම ගිහිල්ලා ඒක සම්බන්ධව බලලා තිබුණා. එතකොට හරි ඔබතුමා ඒවා ගැන පැහැදිලිව දැක්කා. මමත් ඒකට පෞද්ගලිකව මැදිහත් වුණා. මමත් ගිහිල්ලා ඕක ගැන ඉංජිනේරු මහතා සමග කතා කරලා, පෞද්ගලිකව නිරීක්ෂණය කරලා බැලුවා. ඒක කරන කොට එයා ඒ ගැන කොන්ත්‍රාත් කරන කෙනාට කිවුවා මේක දාන්න එපා කියලා ඒ විදියට. ඒක නවත්වන්න කියලා කිවුවා. කාණුව පළල් කරලා අදාළ ධාරිතාවයෙන් ඒක සකස් කරන්න කියලා කිවුවා. ඒක කරාට, නමුත් ඒ දේ සිද්ධ වුණේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමා, ඒ වෙනුවෙන්ම මම යෝජනා කරා කලින් සභාවේදී, සභාවට යෝජනාවක් කරා මේ සියළු පාරවල් වලට සභාවේ අධීක්ෂණය හෝ මැදිහත්වීම යටතේ සංවර්ධන කටයුතු කරන්න කියලා. මේ අර්බුදය ඉදිරියේදී එනවා. දැන් දවස ගාණේ, වහින සැරයක් ගාණේ මේ ඔක්කොම යට වෙනවා. මඩ හෝදගෙන ඇවිල්ලා එතන ප්‍රශ්නයක් තියෙනවා.

ඊළඟට ගරු සභාපතිතුමා, මට ආරංචි වුණා ඒ කන්ද උඩට මාර්ග සංවර්ධන අධිකාරියෙන් ආපහු පස් ගෙනත් දාලා තියෙනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට හර්ෂ හිටපු මන්ත්‍රීතුමා කතා කරලා මම ඊයේ ගියා. බලනකොට ඒ සංවර්ධනය කරපු පාරේ දෙපැත්තට දාන්න පස් ගෙනල්ලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාරේ කොලර් එකට දාන්නද ඒ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔය ප්‍රශ්නය මතු වෙලා ඒක අර්බුදයකට ගිහිල්ලා, ඒ අර්බුදය මිනිස්සු අපි ගාවට අරන් එනකම් ඉන්නේ නැතුව විශේෂ සංවර්ධන කටයුතු වලදී අපේ නිර්දේශ සහ නියාමනයන් ලබා දීලා ඒක කරනවා නම් මේ ගොඩක් ප්‍රශ්න මගහරවා ගන්න පුළුවන්. ඒ නිසා මේ මැදිහත්වීම කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා මන්ත්‍රීතුමා. ඔබතුමා කියන කාරණය හරි. දැන් යම් යම් දේවල් වලදී මම මේක වගකීමෙන් කියන්නේ. දැන් සමහර ඉඩම් වෙන්දේසි වලදී සභාවට 10% ක් වෙන් කරනවා. ඔබතුමන්ලත් දන්නවා ඒක මෙන්න මේකයි කියලා. නමුත් අපි ඒකට එකග වෙන්න ඕන. නමුත් ඔය ඉඩමෙත් ඔබතුමන්ලා ඒක ගිහිල්ලා බලන්න. අපිට දෙන්නේ මේ ටික කියලා එයාලා සාමාන්‍යයෙන් කියනවානේ. තියෙන්නේ හෙන පල්ලමක්. දැන් මම ඊයේ ඒක බලන්න ගියා. බොරු කියන්න ඕන නැහැනේ. හර්ෂ හිටපු මන්ත්‍රීතුමා කතා කරපු එකට මම බලන්න ගියා. එතකොට මම මේ ඉඩමටත් ගියා. මම ඉඩමේ ඇතුලටත් ගිහිල්ලා බැලුවා. විරාජ් මහතා හිටියා. මෙන්න මේකයි කිවුවා සභාවට දෙන්නේ. මම කිවුවා පිස්සුද කියලා. මම කිවුවා ජන උද්‍යාන ගම්මානයට ඇතුල් වෙන තැනින් ඕන කියලා. පර්චස් පනස් නමයක් තියෙනවා. ඒකෙ පාරවල් කපලා තියෙනවා. මම කිවුවා දෙනවා නම් මෙහෙන් ඕන කියලා. අරක හෙන පල්ලමක්. දෙන්නම් කියලා පෙන්වන්නේ හෙන පල්ලමක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒක වෙන්නේ ඔතන විතරක් නෙමෙයි. ඔතන ඔය උදාහරණයක් විතරයිනේ. අපිට මේ ක්‍රියාවලිය ඇතුලේ සමස්ත අත්දැකීම ඔච්චරයිනේ. මම කියන්නේ ඒ නිසා මේක සම්බන්ධව අපි දිගින් දිගටම ඔබතුමා සමග ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙතනදී දෙපැත්තක් තියෙනවා. ඒ දෙපැත්තම බලන්න ඕන. මේ වෙලාවේදී දැන් සැලසුම් කමිටු ඇත්තෙත් නැහැ. සැලසුම් කමිටුවේ නිලධාරීන් මේ මාසයේදී සහභාගි කරවන්නේ නැහැ කියලා නාගරික සංවර්ධන අධිකාරියෙන් කියලා තියෙනවා. මම දන්නේ නැහැ ඉදිරියට ඒක කොහොම වෙවිද කියලා. ඒ වගේම තමයි මුදල් වියදම් කර ගෙන මේ අය ඉඩම් සංවර්ධනය කරන්නේ. එතකොට අපි දෙපැත්තක් ගැන ඔතනදී බලන්න ඕන. ඊට පස්සේ ඕක දැන් සල්ලි කරගන්නත් ඕනනේ. ඒ ප්‍රශ්න ගණනාවකුත් තියෙනවා. අපිට දැන් මේක ඉදිරිපත් කරලා තියෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ ක්ලියරන්ස්, වට මැනුම්, ඒ ඔක්කොම ඉදිරිපත් කරලා තියෙනවා. නමුත් අපේ වැඩේ කරන්න බැරි වෙලා තියෙනවා. මේ අයට කොන්දේසි ටික දෙන්න බැරි වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාණු මදියි ඒකෙ. නියමිත පළල නැහැ. ඊළඟට පාරවල් ගැන හරියට බලන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක විතරක් නෙමෙයි සභාපතිතුමා. මේකෙ බරපතලම කාරණාව තමයි අපි සැලසුම අනුමත කරන්න කලින් ඒ අය ඔක්කොම කප්පාදු කරලා විනාශ කරලා තියෙනවා. ඊට

පස්සේ තමයි මෙතනට සැලැස්ම අරගෙන එන්නේ. මම කියන්නේ ඒක වැරදියි. එතකොට අවිධිමත් විදියට පස් කැපීම් කරලා, ගොඩකිරීම් කරලා එන්නේ. මෙන්න මේකට මොකක් හරි උත්තරයක් ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක කරන්න දුන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැහැනේ ගරු සභාපතිතුමා. මම ඒක බලන්න ගියානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අර කණ්ඩියක් අඩි හයක් විතර පහත් කරලා තියෙනවානේ. එතකොට මම කියන්නේ ඔච්චර ප්‍රමාණයක් කරනකම් මැදිහත් වෙන්න කිසිදු පාර්ශවයක් නැත්නම් මේක බරපතල ප්‍රශ්නයක්නේ. කොහෙන්ද අපි ඒවා නිරවුල් කර ගන්නේ. ප්‍රශ්න හැදෙන්නේ ඒවත් එක්කනේ. දැන් ඒකට යාන්ත්‍රණයක් හදන්න වේවි. මම දන්න විදියට ඒවා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකට අපි කලිනුත් ලියුමක් දැම්මා. ඊයේ මම ලියුමක් දාන්න කිවුවා සංවර්ධන කටයුතු වහාම නවත්වන්න කියලා. මම දැන් ඊයේ ලියුමක් දාන්න කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට මම පෞද්ගලිකව කතා කරලා මේක කිවුවා. ඉඩමේ අනිත් පැත්තේ කෙලවරේ දෙපැත්තෙන්ම උසයි. මැදට කාණුව එන තැන ඒ. ඔබතුමා කිවුවා පාර හරහා ඉඩමකින් වතුර බස්සවන්න දෙනවා කියලා තිබුණා කියලා. ඒවට අපිට තාම ලිඛිත එකඟතාවයන් මුකුත් නැතුවනේ තියෙන්නේ. මොනවා හරි ප්‍රශ්නයක් වෙලා ඒ අය මේක නැහැයි කිවුවොත් වෙන ප්‍රශ්නයක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාණුවේ අවසානය තියෙන්න ඕන. ඒක නැතුව ඕකට අපි අවසර දෙන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය ප්‍රශ්න මතු වෙනවා කියලා දැනෙන්න කලින් ඕකට මැදිහත් වෙන්න කියලා අපි කියන්නේ. මේකට ප්‍රශ්න ආවට පස්සේ ඒ ප්‍රශ්නයට කරගහනවා වෙනුවට, ප්‍රශ්නය එන්නේ නැතුව ඒක බේර ගන්නවා නම් තමයි හොඳ.

ගරු සභාපතිතුමනි, තව කාරණා ගොඩකුත් කතා කරන්න තියෙනවා. නමුත් කාලය මදියි. ඊළඟ කාරණය තියෙන්නේ මේක. සුගත් මන්ත්‍රීතුමත් මේ කාරණය මතු කරා. අපි කලින් මතු කරපු කාරණයක් තිබුණා. සෝමපාල ඩයස් ගල්ගොඩැල්ල මහතාගේ ඉල්ලීමක් තියෙනවා. එතුමා ආපහු සභාවට ලියුමක් එවලා තියෙනවා. අපි එදා කතා කරා ගල්ගොඩැල්ල මහතාගේ මායිම් තාප්පයේ ප්‍රශ්නය පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. මට නැවත ඒකට කියන්න තියෙන්නේ මෙච්චරයි. අපි සාමූහිකව කමිටු තීන්දුවක් ගත්තා. ඒකට එයා එකඟ නැත්නම් එයාට අධිකරණයට යන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මේ කාරණය සම්බන්ධව හොඳටම දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස් නිර්දේශ ලබා දීලා තියෙන්නේ අපි කියපු විදියටම කරන්න තමයි. ඒ අඟල් හය අයින් කරන්න කියලා තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක නෙමෙයි සභාපතිතුමා. මෙතන ප්‍රශ්නය තියෙන්නේ මෙන්න මේකයි. මෙන්න මේක බලන්නකෝ. මම ඒ ඉල්ලීම් ලියුම පොඩ්ඩක් කියවන්නම්.

ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා නොදීම සම්බන්ධව. (සෝමපාල ඩයස් ගල්ගොඩැල්ල)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා, ඔබතුමා ඔය හරියේ නේද ඉන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ එයා කියන එක. එයා කියන්නේ තාප්පයට අනුමැතිය ඉල්ලුවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට ඔබතුමා කියන දේත් කියන්නකෝ. දැන් ඔබතුමා ඔය ප්‍රදේශයේනේ ඉන්නේ. දැන් එයා ඒක අනවසරයෙන් ඉදිකරගෙන යනකොටනේ අපි ගිහින් නැවැත්තුවේ. ඒක ගැන ඔතන කියන්නේ නැහැනේ. අනුමැතිය ඉල්ලුවේ අපි ඒක නැවැත්තුවට පස්සෙනේ. ඒක දන්නේ නැද්ද ඔබතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැවැත්තුවට පස්සේ අනුමැතිය ඉල්ලන්නේ. ඒක හරි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සාමාන්‍යයෙන් ඉදිකිරීමක් කරන කොට සැලැස්ම අනුමැතියට දාන්න කියලා තාක්ෂණ නිලධාරීන් කියනවානේ. ඒ අනුවනේ මේක දාන්නේ. මම කියන්නේ මෙහෙමයි. දැන් අපි ආරවුලකට යන්න ඕන නැහැ මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා දැන් අපිට කියන්නේ අනවසර ඉදිකිරීම් කරන්න දෙන්න කියලද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නැහැ. මම මේ එහෙම කියනවා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමා පිළිගන්නවාද, මේ අය අනවසර ඉදිකිරීමක් කරා කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා මේක මගේ පිටින් දාන්න ලෑස්ති වෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යන යන දවසට නැවත ඒක ඉදිකරනවා. අපි ලබා දීපු එකඟතාවයන් තියෙනවනේ සුගත් මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක මෙහෙමයි. මේකට මේ අය විසින් ඉල්ලීමක් කරලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය ඉල්ලීම් කරපු එක ගැන නෙමෙයි මම කියන්නේ. ඔබතුමා දන්නවාද අපි ඕක නැවැත්තුවේ අනවසර ඉදිකිරීමක් කරන්න ගිහිල්ලා කියන එක.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි නෙමෙයි. ඒක ගැන දන්නවාද කියන්නකෝ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්නකෝ. මට මේකට තනියෙන් තීන්දුවක් ගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ තනි තීන්දුවක් නෙමෙයි. අපි මේකට කමිටු තීන්දුවක් අරගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කමිටු තීන්දුවක් අරගෙන තියෙනවා. මේ අය ඉල්ලන්නේ අපෙන්. මේක ගැන අවධිමත් හා අනවසර ඉදිකිරීම් කමිටුවෙන් මේ ඉල්ලන්නේ. අපේ කණ්ඩායමෙන් මේ ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ කණ්ඩායම කියලා එකක් නැහැ සුගත් මන්ත්‍රීතුමා. හැමදේකටම ඔයගොල්ලන්ගේ කණ්ඩායමට දාලා තීන්දු ගන්න ඕන නම් සැලසුම් කමිටුවක් අවශ්‍ය වෙන්නේ නැහැනේ. ඔය විදියට කතා කරන්න එපා ඔබතුමන්ලා. වැඩි සාධාරණව මේක කරහම අන්තිමට අනවසර ඉදිකිරීම් ඔයගොල්ලන්ගේ කමිටුවෙන් සාධාරණීකරණය කරන්න එන්න එපා. එහෙම කරන්න එන්න එපා. අපේ මේ ඉදිරි කටයුතු සඳහා කමිටුවක් පත් කරේ. අපි ගිහිල්ලා, අපේ නිලධාරීන් ගිහිල්ලා අනවසර ඉදිකිරීම් නැවැත්තුවම ඔයගොල්ලෝ කමිටුව විදියට කියන්න එන්න එපා ඒක හරියි කියලා. මේක ඉතිං කරගෙන යන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක තේරුම් ගන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ වෙච්ච දේ. ඉස්සෙල්ලා වෙච්ච දේ මම කියන්නම්කෝ. ඒ අය මේ ඉදිකිරීම කරගෙන ගියේ අනවසරයෙන්. ඒකට කිසිම අවසරයක් සභාවෙන් අරගෙන නැහැ. පැමිණිලි ආවට පස්සේ තමයි අපි ගිහිල්ලා ඒක නැවැත්තුවේ. ඒක නැවැත්තුවට පස්සේ චණ්ඩි පාට් දැම්මා මෙතනට ඇවිල්ලා මෙහෙම මෙහෙමයි කියලා. එයා අනිත් එක රජයේ තාක්ෂණ නිලධාරියෙක්. එයා නීතිය දන්නේ නැහැ කියලා කියන්න බැහැ. අපි මේක නැවැත්තුවට පස්සේ අපේ නිලධාරීන්ට පාට් එක දාලා තිබුණා. ලේකම්තුමාටත් පාට් එක දාලා තිබුණා. මට හොඳ කිවුවා. සභාපතිතුමා මෙහෙමයි, ලේකම් තමයි ඔතන ගේම් එකේ ඉන්නේ, මෙහෙම මෙහෙමයි කියලා මට හොඳ කියනවා. ලේකම්ට බනිනවා. එහෙම කියලා ඒක නැවැත්තුවා. අපි කිවුවා එයාට ඒක අනුමැතියට දාන්න කියලා. ඒ පාර ඒක අනුමැතියට දැම්මා. අපි ස්ථානීය පරීක්ෂණයකට ගියා. එතකොට බොහොම පැහැදිළිව පේනවා එයා කම්බි ඔක්කොම ගහලා තියෙන්නේ එළියෙන්. පරණ ගස් තියෙනවා කම්බි ගහපු. ගමේ අය අභියෝග කරන්නේ ඒකට. එතකොට අපි ඒ යන කොටත් පොලීසියෙන් ඇවිල්ලා හිටියා. එච්.කිව්.අයි. මහත්මයා පවා ඇවිල්ලා හිටියා. ඒ යන කොටත් එතන වෙනම අනවසර ඉදිකිරීමක් කරනවා. වෙනම අනවසර ඉදිකිරීමක් කරනවා අපෙන් අවසර ගන්නේ නැතුව. ඒ තාප්පයට එහායින් වෙනම ගොඩනැගිල්ලක් එයා ඉදිකරනවා. එහෙම බලහත්කාරයෙන් මේක කරන්නේ. ඔයගොල්ලන්ට ගිය සැරේ මේක ගැන කිවුවාමත් ඒක පිළිගන්නේ

නැතුව, ඉන්දික මන්ත්‍රීතුමා මේක ඔබතුමා මේ සැරෙත් ගේන්නේ ඒ ගැන නොදනද, නොබලද, ඔහොම කරන්න එපා. මම ඕවාට කැමති නැහැ සුගත් මන්ත්‍රීතුමා. එතනට අපි ඔක්කොම ගිහිල්ලා සාමූහික තීන්දුවක් ගත්තා. එක තැනකින් ඒක වෙනස් වෙලා තියෙනවා. එක තැනකින් අඟල් හතරක් වෙනස් වෙලා තියෙනවා මුල්ලක. එතනින් අඟල් ගාණක් ඇතුළට ගන්න තියෙන්නේ. අඟල් හතරක් ඇතුළට ගන්න කියන්න පරණ තිබුණ මායිමට. වර්ග අඩියක් ඉඩමෙන් යන්නේ නැහැ. එහෙම මස් රාත්තලම එයා ඉල්ලන්නේ අනවසර ඉදිකිරීම් ඔක්කොම කරලා. ඔයගොල්ලෝ කියන්නේ මෙයාට අවස්ථාවක් දෙන්න කියලද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි එහෙම නෙමෙයි කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්නකෝ. අපෙන් ඉල්ලීමක් කරා, අපි මන්ත්‍රීවරු. මම ඒක සාධාරණයි කියලා කියන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මොකක් කියලද කියන්නේ. ඒ ඉදිරිපත් කරන පැත්ත සාධාරණයි කියලානේ ඔබතුමන්ලා මේ කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම තවම එහෙම කියන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි කමිටුවක් මොකක් හරි හදලා තියෙනවානේ. අපි මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්න ඕන. මම මේක කිවුවට, තනියම මේ ප්‍රශ්නය ගමේ විසඳන්න බැහැ. සභාපතිතුමාටත් මම මේක කිවුවා. මමත් දන්නවා මේක ගැන විස්තර ටිකක්. අපි මේක ගිහිල්ලා බලනවා. ඒකට අවසරයක් දෙන්න ඕන නැහැ. අපි අනිත් තැන් වලත්, පාරේ අඩි දොළහ තියෙනවද නැද්ද කියලා බලලා ඔබතුමාට වාර්තාවක් දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මම නම් කියන්නේ මෙහෙමයි. ඔය කමිටුව අයින් කරලා දාමු. එහෙම ගැටෙන තීන්දු ගන්න බැහැ ඔයගොල්ලන්ට ගිහිල්ලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතකොට සභාපතිතුමා කියන එකක් විතරයි මෙතන කරන්න ඕන. දූන් ඔබතුමා කියන එකක් විතරයි මෙතන කරන්න ඕන. දූන් අපි කියන දේකට ඇහුම්කන් දෙන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට මේකට එන්න බැරි හින්දා තමයි අපි යන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි කරන්නේ උදවුවක්. මම මේ එක පාර්ශවයක පැත්තක් ගත්තා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දූන් ඔබතුමා කියන්නේ මොකක්ද,

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි කියන්න හදන්නේ මේකයි. පාරේ අඩි දොළහේ කතාවක් දූන් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩි දොළහේ කතාව නෙමෙයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙමනම් මොකක්ද තියෙන්නේ. තාප්පය ඉදිකරේ මායිමටනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩි දොළහේ කතාව නෙමෙයි. එයා අනවසර ඉදිකිරීමක් කරේ. තාප්පයක් ඉදිකරන්න ගියේ. අපි ඒක නැවැත්තුවා. පොඩ්ඩක් ඉන්න කියන්න. අපි කණ්ඩායමක් විදියට ගියේ. මම විතරක් නෙමෙයි ගියේ. මම, ලේකම්, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරිනිය, තාක්ෂණ නිලධාරීන් ගියේ. ඒ වෙන කොට පොලීසියේ එච්.කිව්.අයි. මහත්තයා පවා ඇවිල්ලා හිටියා. අපි ගියේ සාමූහිකව.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක පැහැදිලියි. පොලීසියයි, සභාපතිතුමයි, ලේකම්තුමයි, නිලධාරීන් ඔක්කොමයි එක පැත්තක් වෙලානේ. මෙතන මේ පොඩි එකාට ගහන්නනේ හදන්නේ. ඇත්ත කතාව මේකනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මින් ඉදිරියට අනවසර ඉදිකිරීම් ගැන කවුරුවත් කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපේ ප්‍රදේශයේ වෙන දේවල් වලට අපි කතා නොකර කොහොමද ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නියම කමිටුවක් පත් කරලා තියෙන්නේ. අනවසර ඉදිකිරීම් නවත්වන්න තමයි කමිටුව පත් කරේ. තමන්ම ඒක කිවුවම හරි. තමන්ට දෙයක් කිවුවම අසාධාරණ වුණත් ඒක හරි. මේක මාර කතාවක්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නම් එතනට බලන්න ගියේවත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළාත් පාලන දෙපාර්තමේන්තුවටත් බැනලා, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්ටත් බැනලා එලවලා. මේ පාට් එකෙන් එහෙම කරන්න කොහොමවත් බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා විනාඩියක් ඇහුම්කන් දෙන්නකෝ. මේකෙ තියෙනවා අන්තිමට පරීක්ෂණයක් කරන්න කියලා එවලා. පරීක්ෂණය කරන්න යනකොට ඒ චෝදනාව තියෙන මනුස්සයාවත් ඉන්න ඕනනේ. එයා නැතුව ගිහිල්ලා පරීක්ෂණයක් කරලා ඉවර වෙලා තමයි මේක එවලා තියෙන්නේ. එයාව පරීක්ෂණයට කැඳවලා නැහැ. අපේ තාක්ෂණ නිලධාරිතුමයි, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ආපු ඒ නිලධාරිතුමයි ගිහිල්ලා තමයි මේක බලලා ඇවිල්ලා තියෙන්නේ. ඒකට අරයත් එන්න ඕන. එතකොටනේ එයාට වෙච්ච අඩුපාඩුව පෙන්වන්න පුළුවන් වෙන්නේ. ඒ පාර්ශවයත් අනිවාර්යයෙන්ම ඉන්න ඕනනේ සභාපතිතුමා. මේකට අපි ඒ බලතල අතට අරගෙන මොන වැරැද්දක්වත් කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්නම් ඒ කියන්නේ අපි කමිටුව විදියට තීන්දු ගන්නවා කියලා. එහෙමනේ මේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කමිටුවේ සභාපති ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔය විදියට සැලසුම් කමිටුව ඕනත් නැහැ. ඔයගොල්ලෝ කමිටුවෙන් තීන්දුවක් අරගෙන කියන්නකෝ මට ක්‍රියාත්මක කරන්න. ඔයගොල්ලෝ කමිටුවෙන් තීන්දුවක් අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න. අපේ සැලසුම් කමිටුව ඕන නැහැ එතකොට ඔය විදියට කරනවා නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නකෝ ඔය සැලසුම් කමිටුවෙන් ගනිපු තීන්දුව හරිද කියලා. ඔය සැලසුම් කමිටුවෙන් ගනිපු තීන්දුව හරි නම් අරක කොහොමද වුණේ. ඒක ඔබතුමත් දන්න කතාවක්නේ. දූන් බලන්න අරහේ තියෙන වෙන්දේසි ඉඩම්. තරංගා ලැන්ඩ්ස් ආයතනය වතුර ටැංකිය පාරේ කරපු එක, කපුහෙම්පල ඒවා, ඊළඟට දූන් බලන්න මේ කරගෙන යන ඒවා. මෙහෙමවත් බලන්නේ නැත්නම් මොනවා වෙනවද කියලා දන්නේ නැහැ. දූන් නගරිගෙවත්තේ එක බලන්න. මොකක්ද ඒකට වෙලා තියෙන්නේ. අඟල් හතරේ එක ගලක් දාලා නැහැ. ඉතිං සභාපතිතුමා මේක තුළ ඔබතුමාට ගෞරවයක් එනවා මේවා හරියට කරහම. ඒක නැතුව වෙන දෙයක් වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දූන්වත් පිළිගන්නේ නැහැනේ. මේක අනවසර ඉදිකිරීමක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක අපි දන්නේ නැහැ. අපි දන්නේ ලියුම් වලින්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** රුපියල් පහළොස් දහස් නමසිය හැටක් ගෙවලා මොකටද මේ බිලක් කඩලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බිල් දෙකක් කඩලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං හරි. අපි ඒක අනුමත කර ගන්න කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා අපිට පැහැදිලි කරා. අඟල් හයක් පස්සට ගන්න කියපු එක තමයි ප්‍රශ්නය තියෙන්නේ. මෙයත් තාක්ෂණ නිලධාරියෙක්. මෙයා වගකිව යුතු නිලධාරියෙක්. මෙයා නොදන කරන වැරැද්දක් නෙමෙයි ඒක. මෙයා තාක්ෂණ නිලධාරියෙක්. තොත්ත බබෙක් නෙමෙයි මේ. එතකොට ඔබතුමා කිවුවා ගිය සභා වාරයේදී අඟල් හයක් ගැන කියලා. අද ඔබතුමා කියනවා අනවසර ඉදිකිරීමක් කියලා. මොකක්ද එතන වෙන අනවසර ඉදිකිරීම. පාර අල්ලලද, මොකක්ද එතන වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. පාර අල්ලලා හැදුවත් නැතත්, සභාවේ අවසරය නැතුව ඉදිකිරීමක් කරනවා නම් ඒක අනවසර ඉදිකිරීමක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඒක අනුමත කරලා දෙන්න ඕන. එහෙම හදපුවා අනුමත කරලා දීලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි වුණේ. බලහත්කාරයෙන් කරන්න ගියා එයාගේ තාක්ෂණ නිලධාරිකම දාගෙන. මෙතන ඇවිල්ලා බැනලා ගියේ. එයා ඒක කරනවා, පුළුවන් නම් බලාගන්න, අනම්-මනම් කියලා නිලධාරීන්ටත් බැනලා ගියේ. ඒපාර තමයි මම ලියුමක් යවලා, ටෙලිග්‍රෑම් එකක් ගහලා ඒක නැවැත්තුවේ. ඊට පස්සේ තමයි එයා ඔය කියන අයදුම්පත්‍රය දැම්මේ. අපි කමිටුව විදියට ඒක බලන්න ගියා. එක එක්කෙනාට චෝදනා කරන නිසා කමිටුව විදියට ගියා. අපි ඒක බලලා සාමූහික තීන්දුවක් ගත්තා. අනිත් තැන් ටික හරි. ඒවා හරි කියලා අපි හිතනවා. එක තැනක පරණ ගහකට කම්බි ගහලා තියෙනවා. ඒක එයා ඇතුළට ඇදලා, පිට පැත්තට ඇදලා. අර ගහ එහෙම ඇදෙන්නේ නැහැනේ. පරණ මුල් තියෙන ගහක් තල්ලු කරලා. අපි කිව්වා මේ මුල්ල පොඩි ඇදයකට ගිහිල්ලා තියෙනවා. ඒ අඟල් හය ඇතුළට ගන්න කියලා. එයා දාපු කොන්ක්‍රීට් බීම් එකේ අඟල් හය ඇතුළට ගන්න කියලා කිව්වේ. එක තැනක් විතරයි. එතකොට පොඩි පටි කැල්ලක්වත් යන්නේ නැහැ. එයාගේ තාත්තා එකඟයි. අපිට අයදුම්පත්‍රය දාලා තියෙන්නේ එයාගේ තාත්තා. එවෙලේ එකඟ වුණා. එයාගේ තාත්තත්, බිරිඳත් ඒකට එකඟ වුණා. මෙයා කියනවා එහෙම කරන්න බැහැ, මේකෙ එහෙම බැහැ, අනම්-මනම් කියලා පාට් දාලා මේවා කරා. අපි ගත්තේ එක තීන්දුවයි. අපි අදටත් ඒ තීන්දුවේ ඉන්නවා. එයාට ඔහොම නෙමෙයි, එක කමිටුවකින් නෙමෙයි ඔයගොල්ලෝ කමිටු දහයක් හැදිලා කිව්වත් ඒක කරන්න බැහැ. සුගත් මන්ත්‍රීතුමා කියන්නේ ඒකනේ. කමිටු දහයක් හැදිලා කිව්වත් එයා අඟල් හයක් පස්සට ගත්තොත් විතරයි අපි ඒකට අනුමැතිය දෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි සභාපතිතුමා. මට තනියම තීන්දුවක් ගන්න බැහැ, අනිත් අයටත් එන්න කියලා මම කිව්වේ ඒකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මම කියන්නේ ගිය සභාවටත් ඕක ආවානේ. මේ මාසය ඇතුළත ගිහිල්ලා බලලා ඕකට තීන්දුවක් ගන්න තිබුණානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට මේවා ඉදිරිපත් කරේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්තේ මොකද, ගිය සභාවේදී මේ ටික කිව්වානේ මේ විදියටම. බොරු කියන්න එපා. ගිය සභාවේදිත් මේ විදියටම කිව්වා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ ලියකියවිලි මුකුත් අපිට ලැබිලා තිබුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔයගොල්ලෝ ඒවා හොයා ගන්න එපැයි. මේවා අපි දීපුවා නෙමෙයිනේ. ඔබතුමාට ගිහින් හොයලා බලන්න තිබුණානේ. ඔබතුමාට මේ මාසයේදී ඒක කරන්න තිබුණානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේක පැහැදිලි කරන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට මේක මතක් කරන්න කිව්වා සභාවේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මිනිස්සුන්ට එහෙම වැඩ කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේකට නඩු දානකම් බලන් ඉන්නේ. එහෙම නම් මේක සභාවක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාට ඕන නම් අපිට නඩු දාන්න කියන්න. අපි මොකටද එයාට නඩු දාන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මෙතන තියෙන්නේ අභිමතය පිළිබඳ ප්‍රශ්නයක්. මම එයාට කතා කරා. මම කිව්වා අඩි තුන හතරක් ගන්න බැරි ඇයිද කියලා. මෙතන අභිමතය පිළිබඳ ප්‍රශ්නයක් තියෙන්නේ. වෙන කිසිම දෙයක් නෙමෙයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය දෙගොල්ලොන්ටම තියෙන්නේ එහෙම ප්‍රශ්නයක් සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට එහෙම මැදිහත් වෙන්න බැහැ. අපි කියන දේ ඒ අය කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකෙ නීත්‍යානුකූලභාවය පිළිබඳව එයා කියන්නේ පාරේ අඩි දොළහ තියෙනවා, එයාලගේ සීමාව හරි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ මෙච්චරයි. අපි යමු පරීක්ෂණයකට. එයා කරපු එකක්වත් අනුමත කරලා නැහැ. එයා දැනටත් ගේ හදනවා. ඒක අනුමත කරලද තියෙන්නේ. ඔයගොල්ලෝ ඒවා බලන්න කමිටුවක් විදියට ගිහිල්ලා. ඔයගොල්ලෝ මේ අහිංසක මිනිහෙක් ව්‍යාපාරයක් කරන්න හැදුවම, ගෙයක් හදනකොට නඩු දාන්න කියනවා වගේම ඕවාටත් එහෙම කියන්න එන්නකෝ. මම අහන්නේ මෙච්චරයි. දැන් මටත් ඔහොම කියන්න තිබුණානේ දහනායක හාඩ්වෙයාර් එකට නඩු දාන්න කියනකොට. ඔයගොල්ලන්ට රජයේ සේවකයෙක් ඇවිල්ලා කිවුවා කියලා නැවෙනවා. රජයේ සේවකයොන්ට තමයි නීතිය ක්‍රියාත්මක කරන්න ඕන. මොකද එයා ඒ තනතුර පාවිච්චි කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැමෙන එකක් නෙමෙයි මේ. වැරදි තැනක ඔය ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කියන්නේ ඒකනේ. ඉතිං හරි. අපි විතරක් නෙමෙයි පළාත් පාලන කොමසාරිස් පවා එවලා තියෙනවානේ අඟල් හයක් පස්සට ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේක අහන්න. පරීක්ෂණයක් කරලා තියෙනවා අන්තිමට. ඒ කරපු එක ගැන අපිට ඇවිල්ලා කිවුවා. පළාත් පාලන කොමසාරිස් නෙමෙයි කවුරු කරත්, ඒක වැරදියි නම් වැරදියි. පළාත් පාලන කොමසාරිස් කවුරු හරි එවලා ගිහිල්ලා ඒක බලන්න කියනවා. එයාටත් එන්න කියලා එපැයි ඒක බලන්න. එහෙම කරානම් මේක ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපිට කියන්න බැහැනේ අබේසේකර මන්ත්‍රීතුමා. අපි කොහොමද එහෙම කියන්නේ. අපිට පුළුවන්ද පළාත් පාලන කොමසාරිස්ට එහෙම කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කරපු වැරැද්දක් ගැන නෙමෙයි කියන්නේ. දැන් මේ කියන්නේ ඔබතුමා කරපු වැරැද්දක් ගැන නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා. මේක සභාව තේරුම් ගන්න ඕන කතාවක්. ඔබතුමන්ලාට සමහර ඒවා අනවසර නම් අනවසරයි. සමහර ඒවා අනවසර වුණාට අනවසර නැහැ. ඇත්ත කතාව ඒකනේ. හැබැයි මම මින් ඉදිරියට ඔය විදියට කටයුතු කරන්නේ නැහැ මන්ත්‍රීතුමා. පුන පුනා කියද්දී ඒක අනවසරයි කියලා, ඔබතුමන්ලා ඒකට මුකුත් කියන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි ඒක නැහැ කිවුවේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කියන්නේ ඒකනේ. හරි නම් මේක ගැන කතා කරන්නත් බැහැ. අනවසර කරුණු වෙනුවෙන් පෙනී ඉන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා සභාපතිතුමා විදියට මේකට ඇහුම්කන් දෙන්න. මෙච්චර කේන්ති ගන්න දෙයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කේන්ති ගන්න දෙයක් නැහැ. කබරගොයා, තලගොයා කර ගන්න ඕන වුණාම තලගොයා, නැත්නම් කබරගොයා. ඒ වගේ එකක්නේ මේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, කොයි වෙලාවකවත් අපි එහෙම කිවුවේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේක අපි ඒ අයට දුන්නේ ඒ අය කරපු වැරැද්ද නිවැරදිකරන්න මිසක්, අපි ඉස්සෙල්ලා දීපු එකක් නෙමෙයි මේ. මේක අහගන්න. ඒ අය කරපු වැරැද්ද මේක. අපිට තිබුණා මේකට මුකුත් භාර නොගෙන ඒ අයට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතකොට කරලා ඉවරයි. ප්‍රශ්නයක් එන්නේ නැහැ එහෙමනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක වාර්තාගත කරන්න. සුගත් මන්ත්‍රීතුමා කියනවා එහෙම කරානම් ඉවරයි කියලා. අනිත් දවසේ මේ බෝපෙ පෝද්දල මිනිස්සුන්ට එහෙම කරන්නම්කෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඔබතුමාට හෙට දවසෙත් කියන්නේ අනවසර ඉදිකිරීමක් කරනකොට තහනම් නියෝගයක් ගන්න. එතකොට ඔය එකක්වත් නැහැනේ. ඔබතුමන්ලා අපි කිවුවම තමයි කරන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා එක වෙලාවකට එකක් කියනවා. තව වෙලාවකට තව එකක් කියනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක නිවැරදි කරන්න තමයි සභාපතිතුමා අපි බැලුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් කරලද මේක නිවැරදි කරන්න කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පාරේ අඩි දොළහ තියෙනවා නම් අර මනුස්සයට තව අඩියක් විතර පස්සට ගන්න කියනවා.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. දැන් අපි ගිහිල්ලා කිවුවම කරන්නේ නැති එක ඔයගොල්ලෝ ගිහිල්ලා කිවුවම කරනවාද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙතන අභිමානය පිළිබඳ ප්‍රශ්නයක් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අභිමානය පිළිබඳව අපිටත් ප්‍රශ්නයක් තියෙනවා. නැත්තේ නැහැ.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපිට ඒ මනුස්සයා පැමිණිල්ලක් කරාට පස්සේ ඔබතුමාව සහ සභාව දැනුවත් කරා. අපි ගිහින් ඒවාට මුක්කු ගහන්න ගියේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඒක තමයි. ඒක නැවත සභාවෙන් අහන්න දෙයක් නැහැ. එයාට කියන්න කණුව කඩලා මායිම පස්සට ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක හරි. අපි ගිහින් ඒක බලන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං බලන්න එපැයි. ගිය මාසේ කතා කරලා, මේ මාසයේ බලන්නේ මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස්ගේ ලියුම එවුවට පස්සේ තමයි මේක ඊයේ රෑ මට ගෙනත් දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මම අහන්නේ කාගෙද වැරැද්ද. ගිය මාසෙත් කතා කරා. ඔය ගොල්ලෝ ඒ මාසය තුළ ගිහින් ඒක බලන්න තිබුණානේ.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එයා දැන් ඊයේ කිවුවේ. අපි යන්න ඕන කියන එක තමයි මේ යෝජනා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි යන්න ඕන නැහැ. ඔයගොල්ලෝ යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක තමයි. අපි මුක්කු ගහන්නේ නැහැ. එයාට කඩේ යන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි එක එක්කෙනාට කඩේ යන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමනේ. සුගත් මන්ත්‍රීතුමා දැන් පිළිගත්තට මුලදී පිළිගත්තේ නැහැ ගමේ කෙනා අනවසර ඉදිකිරීමක් කරා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් ඔබතුමා කිවුවානේ එකකට එකක් කරනවා, අනිත් ඒවාට තව එකක් කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉතිං අපි එහෙම කරලා තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි දන්නේ නැහැ ඔයගොල්ලෝ අතර තියෙන සම්බන්ධතාවය. සුගත් මන්ත්‍රීතුමා කිවුවා අපි කමිටුවක් විදියට පත් කරලා තියෙන්නේ මේක කරන්න කියලා. මෙතුමා එහෙම කිවුවානේ කමිටුවක් විදියට පත්කරලා තියෙන්නේ මේක කරන්න කියලා. මම අහන්නේ අනවසර ඉදිකිරීම් කමිටුවෙන් කියනවා මේක කරන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නිවැරදිකරුද කියලා බලන්න ඕන, වැරදිකරුද කියලත් බලන්න ඕන. අපි දෙපැත්තම බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනවසර ඉදිකිරීම නිවැරදි කරන්නේ කොහොමද, අනවසර ඉදිකිරීමක් නම් ඒක අනවසර ඉදිකිරීමක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕන නම් නිර්වන්දි ගිවිසුමක් ගහන්න පුළුවන්. නැත්නම් ඒක කඩලා නිවැරදි කරන්න කියලා කියන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි අපි සැලසුම් කමිටුව විදියට එතනින් එහා වෙනස්වීමකට කැමති නැහැ. ඔයගොල්ලෝ ගිහිල්ලා බලලා ඕන දෙයක් කරන්න. එයාට අපි කියපු විදියට වැඩ කරන්න කියන්න. ඒ ඇරෙන්න අපිට නැමෙන්න බැහැ. එයාට අඟලක්වත් පස්සට ගන්න බැරි නම් අපි මොකටද බලන්න යන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** හැබැයි සභාපතිතුමා මේ කරන්නේ දේශපාලනය. ඒක මතක තියා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වෙන්න පුළුවන්. දේශපාලනය කරනවා නම් අබේසේකර මන්ත්‍රීතුමයි, ඔබතුමයි එක තැන ඉන්න බැහැනේ. මම කියන්නේ ඔය මට බලපෑම් කරන්නේ මේ අපේ පක්ෂයේ කෙනෙක් කියලනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැහැ. එහෙම එකක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක නෙමෙයි මම කියන්නේ. දැන් සුගත් මන්ත්‍රීතුමා කිවුවා "හැබැයි සභාපතිතුමා මේ කරන්නේ දේශපාලනය", කියලා. එහෙම කියලා මට බලපෑම් කරනවා. මේ මිනිස්සු පාක්ෂිකයෝ, මෙහෙම කරන්න එපා කියලා මේ කියන්නේ. එතකොට අබේසේකර මන්ත්‍රීතුමයි, ඔබතුමයි එක පැත්තේ ඉන්නේ කොහොමද, මට ඒකට උත්තර දෙන්නකෝ. මේකෙ විහිළු කතා කරන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ප්ලෑන් එක අනුව අපි කතා කරේ. වෙන මුකුත් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා ඔබතුමා මට කිවුවා මේක දේශපාලන ප්‍රශ්නයක් කියලා. එතකොට ඔය තුන්දෙනාම එක තැන ඉන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි තුන්දෙනා නෙමෙයි. අපි හතර දෙනාමත් එක තැන හිටියානේ. දෙපැත්තේ ඉන්න කොටත් එක තැන හිටියානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අර වැලිකැටියවත්තේ පැති බැම්ම ඉදිකිරීම තාම සිදු වුණේ නැහැ. ඒ ගැන පොඩ්ඩක් දැන ගන්න කැමතියි. වැලිකැටියවත්ත මාර්ගය පහුගිය දවස්වල වැස්සටත් කඩා ගෙන ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන ප්‍රගතියේදී කතා කරමු.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2021-04-08 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ- නැත**

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**(ඉ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

ජාතික විගණන කාර්යාලයෙන් එවපු විගණන වාර්තාව මේ අවස්ථාවේදී සභාගත කරනවා.

**(ඉ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ මැයි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අර මගේ ගැටළුව තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඇස්තමේන්තු හදන්න කියලා කිවුවානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක තාම හදලා නැහැනේ සභාපතිතුමා. දැන් පාර ගැලවිලාම ගිහිල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මට පොඩ්ඩක් සතියේ දවසක මතක් කරන්න. ප්‍රගතිය ඉවරයිද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ප්‍රගතියද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වෙලාව දුන්නානේ. මුකුත් නැහැනේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මෙච්චර වෙලා ඇහුවා ප්‍රගතිය ඉවරයිද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ප්‍රගතිය ගැන කතා කරේම නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාට මෙක්කෑ ද කියන එක මට තේරෙන්නේ නැහැ. අනිත් අයගෙන් අහන්නකෝ. ප්‍රගතිය ඉවරයිද කියලා මම ඇහුවා.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** හතර සැරයක් ඇහුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් මගේ වැරැද්ද. ප්‍රගතිය තියෙනවා නම් කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම මේ ප්‍රගතිය ඉස්සෙල්ලා දාන්න. මොනවා හරි කතා කරන්න තියෙනවානේ එතකොට. ඒක හින්දානේ සභාපතිතුමා අපි විශේෂ සභාවක් පවා ඉල්ලුවේ. දැන් ඇත්තටම මොනවද ඒවා පිළිබඳව ගනිපු තීන්දු කියන එකවත් අඩු ගාණේ කියන්න. දැන් දිගින් දිගටම ඒවා ගැන ඉල්ලනවා. දැන් ඔබතුමාගෙන් ඉල්ලනවා බොහොම පැහැදිලිව වෙන්දේසි ඉඩම්කාරයෝ ගැන. මේවා පිළිබඳව අපි පැහැදිලි තීන්දුවක් ගන්න හදන්න එකතු වෙලා. මේකට පක්ෂ භේදයක් හරි වෙන මොකක් හරි ඇති දෙයක් නෙමෙයි. අපි ඔබතුමත් එක්ක ඉන්නවා එතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි නාගරික සංවර්ධන අධිකාරියට දැනුම් දීලා තියෙන්නේ. කපුහෙම්පල එකට අපි එකතු වෙලා නැවත සාකච්ඡා කරලා අදාළ සංවර්ධන බලපත්‍රය නැවත වෙනස් කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ අය වතුර ටැංකිය පාරේ එකට මොකක්ද කරේ කියලා බලන්න ගිහිල්ලා.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වහාම ලියුමක් යවන්න. මේක නැවත භාර ගන්න ඕන අපි. නමුත් අපේ එකඟතාවයකින් තොරව කරන කිසි දෙයක් අපි භාර ගන්නේ නැහැ කියලා ලියුමක් යවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක අපි භාරගන්නේ නැහැ කියලා ලියුමක් යවන්න. ඊළඟට ගරු සභාපතිතුමනි විශේෂයෙන් මේක දන්වා යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය නැවත ගිහිල්ලා මොකක් හරි විකාරයක් කරලා දාවි. අපි ඕන එතකොට වගකීම ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතකොට ඇත්තටම මේක යවන්න. කිසිම ආයතනයකට ඉඩ දෙන්න එපා මේ පාරවල් ප්‍රමිතියකින් තොරව කරන්න. ඕන කෙනෙක් කරගාත්තාවේ, කමක් නැහැ කියන්න. හැබැයි දන්නවානේ ප්‍රමිතිය ගැන. ඒක කියන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා, මම ඒකට විධිමත් යෝජනාවක් ඊළඟ සභාවේදී ගේනවා. මොකද හේතුව අර යෝජනාවට දැන් මාස හයක් පැනලා. අර තීන්දුවට මාස හයක් පැනලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොනවා කරත් ප්‍රමිතියට නැත්නම් වැඩක් නැහැ. ප්‍රමිතිය කියන එක දන්නවානේ. අපේ සභාවෙන් පාරක් හදනකොට දෙන ප්‍රමිතියක් තියෙනවානේ. ඒ ප්‍රමිතියට නැති කිසිම ආයතනයකට කරන්න දෙන්න එපා.

ඊළඟට වරලත් ඉංජිනේරුවරුන්ට දන්වලා යවන්න. කරුණාකරලා ඔබතුමන්ලා මේවා හරියට බලන්නේ නැතුව දෙන්න එපා කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ගිය සභාවේදී තීන්දුවක් ගත්තානේ. අපි හිතමු දැන් කාණුවක් කියලා, කාණුවේ කම්බි බැඳලා කොන්ක්‍රීට් දාන්න කලින් අපේ නිලධාරියා ගිහින් ඒක බලන්න ඕන. ඒකනේ වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට ඒ ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරයාව පවා දැනුවත් කරන්න. එතකොට එයාට වගකීමක් තියෙනවානේ. පාර හරියට දානවද කියලා එයාට බලන්න කිවුවම තව මාස හයකින් මුකුත් කියන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලන්න කියන්න පුළුවන් අබේසේකර මන්ත්‍රීතුමා. නමුත් අපිට බැහැ තාක්ෂණ නිලධාරීන් ඉන්නකොට මන්ත්‍රීවරුන්ට බලන්න කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරියා එක්කම ගිහින් බලන්න කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් ඉතින් අපේ මන්ත්‍රීවරු අධීක්ෂණය කරනවා තමන්ගේ කොට්ඨාශයේ වැඩ කරනකොට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එහෙම නම් තිස්ස මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ වෙච්ච එක ඒ විදියට වෙන්න බැහැනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකට තිස්ස මන්ත්‍රීතුමා දන්න ගන්න ඕන ඒක අධීක්ෂණය කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක එහෙම වුණේ නැහැ. ඒවාට අවසර දෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නමුත් එතුමා අඩුපාඩු වෙන ඒවා ගැන ගුණසේකර මහතාට කතාකරලා කිවුවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** අඟල් හතරේ ගල් දාලා නැහැ. මම අභියෝග කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒවා දාලත් නැහැ. අරහේ බෝක්කු උතුරලා යනවා. ඒ පැත්තම යටවෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** දැන් බලන්න වතුර ටැංකිය පාරේ එක. කපුහෙම්පල වෙච්ච විදියටම තමයි මෙතනත් අනුමැතිය දීලා තියෙන්නේ. වතුර ටැංකි ගහලා දැන් දෙන්න යන්න එපා. දැන් වතුර ටැංකිය ගහලා, ඒකත් නැහැ. ජල සම්පාදන මණ්ඩලයෙන් අරගෙන දීලද තියෙන්නේ ජල සැපයුම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඉස්සරහට කොහොමත් අපි එහෙම අනුමැතිය දෙන්නේ නැහැ. ජල සම්පාදන මණ්ඩලය අපිට එකඟවෙලා තියෙනවා ජල සැපයුම දෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඊළඟට දැන් දීලා තියෙන ඒවාට මොකද කරන්නේ. වතුර ටැංකියත් නැහැ. ජල සැපයුමත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** පැතුම් උයනේ වතුර දෙන්න කියලා අපි ලියුම් යවලා තියෙන්නේ. ඒකට වතුර දෙනකම් අපි අනුමැතිය දෙන්නේ නැහැ. මේක සලකා බලන්නේ නැහැ අරක ඉවර කරනකම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** පැතුම් උයන කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** තරංගා ලෑන්ඩ්ස් ආයතනය හිරිඹුර කරපු එකට වතුර දීලා නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** දැන් ඒක විකුණලානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** විකිණුවට වතුර දෙන්න ඕනනේ ඒගොල්ලෝ. තාම අවුරුදු පහ ඉවර නැහැනේ. ඒකට වතුර දෙන්න ඕනනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඊළඟට සභාපතිතුමා දැන් ඒ පාරවල් බලන්න. කපුහෙම්පල කරපු අනිත් එකට වතුර ටැංකිය තියලා නෙමෙයිනේ දුන්නේ. එතකොට ඒ පාරවල් හදලා තියෙන්නේ කොහොමද, ඒවා ඇත්තටම අනුමත කරන්න කරන්න එපා මොන හේතුවක් නිසාවත්. ඒවාට අවසර දෙන්න එපා. ඒවා ගැන ඇත්තටම අපි පරීක්ෂණයකට යමු. ඒවාට ගන්න තියෙන පියවරවල් ගන්න කටයුතු හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** බොහොම ස්තුතියි.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2021-06-16 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,<br>
සභාපති,<br>
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.